
**කොවිඩ් ව්‍යාප්තිය**




# දිනමිණ





The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වෂී 2564ක් වූ බක් අව විසේනිය ලත් ශනි දින | කාණ්ඩය 112 | පත්‍රය 115 | පිටු 16 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 01 සෙනසුරාදා





# රිෂාඩ් කේරළ ත්‍රස්තවාදීන් සමඟ සබඳකම් පවත්වලා

## ඉන්දීය බුද්ධි අංශ පරීක්ෂණ අරඹයි

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ ත්‍රස්තවාදීන් කණ්ඩායමක් සමඟ සම්බන්ධකම් පවත්වා ඇතැයි සැක කරමින් ඉන්දීය බුද්ධි අංශ පරීක්ෂණයක් ආරම්භ කර ඇතැයි එරට පුවත් සේවා වාර්තා කර තිබේ. 2009 වසරේදී මන්ත්‍රීවරයා කළ සංචාරයක් සහ ආගමික නායකයන් කිහිප දෙනකු සමඟ සාකච්ඡා පැවැත්වීම පිළිබඳ විමර්ශන කණ්ඩායම් දැඩි අවධානය යොමු කර ඇති බවද 'නිව් ඉන්ඩියන් එක්ස්ප්‍රස්' පුවත්පතින් අනාවරණය කර තිබේ. පිට 6

# නව ප්‍රභේදය වාතයෙන් බෝ වෙනවා

## ජගත් පරීක්ෂණවලින් හෙළි වෙලා

## ආචාර්ය චන්දිම ජීවන්දර

සන්ධ්‍යා කරුණාරත්න

මෙරට ව්‍යාප්ත වන නව කොවිඩ් - 19 වයිරස් ප්‍රභේදය වාතයෙන් බෝ විය හැකි බවට අන්තර්ජාතිකව හඳුනා ගත් පරීක්ෂණ වාර්තාවලින් තහවුරුව ඇති බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව සහ සෛල ජෛව විද්‍යායතනයේ අධ්‍යක්ෂ ආචාර්ය චන්දිම ජීවන්දර මහතා 'දිනමිණ'ට ඊයේ (30) පැවසුවේය. පිට 6

## බදියුදීන් 4-5 දිනවල පාර්ලිමේන්තු එවන්න

**වේත්‍රධාරී CIDයට ලියයි** පිට 6

# කොවිඩ්

## කොතලාවල ආරක්ෂක රෝහලෙන් ආසාදිතයන්ට දැඩි සත්කාර සේවා

සන්ධ්‍යා කරුණාරත්න



රට පුරා ව්‍යාප්ත වන කොවිඩ්-19 තුන්වැනි රැල්ල හේතුවෙන් ආසාදිත රෝගීන්ට හදිසි ප්‍රතිකාර සේවා දීමට ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ (KDU) දැඩි සත්කාර සේවා පවත්වාගෙන යෑමට පියවර ගත් බව සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පැවසුවාය. පිට 6

## කළ යුතු හොඳම දේ සංචරණ සීමා දැමීමයි

විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වසංගතයේ වර්තමාන තත්ත්වය අනුව මේ අවස්ථාවේ කළ යුතු හොඳම දේ වයිරසය පැතිරීම වැළැක්වීම සඳහා සංචරණ සීමා පැනවීම බව විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය ඒ. ජේ. ඒ. එල්. ප්‍රනාන්දු මහතා පැවසුවේය. පිට 6

## කොවිඩ් පාලනයට රජයේ වෛද්‍ය සංගමයෙන් යෝජනා 10ක්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසයේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගෙන එය පාලනය සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය යෝජනා 10ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කර තිබේ. පිට 6

## තවත් වසම් රැසක් හුදෙකලා කරයි

රත්නසිරි පතිරණ සහ නුවන් කොඩිකාර

පොළොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල තවත් ග්‍රාම නිලධාරි වසම් 17ක් ඊයේ (30) සිට වහාම ක්‍රියාත්මක වන පරිදි හුදෙකලා කිරීමත් සමඟ කොවිඩ් 19 වයිරස ව්‍යාපෘතිය හේතුවෙන් දිස්ත්‍රික්ක 9කට අයත් ග්‍රාම නිලධාරි වසම් 55ක් ඉකුත් 22දා සිට මේ වන විට හුදෙකලා කර තිබේ. පිට 6





ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති එක්ව සකස් කළ යෝජනා 21කින් යුතු 'නිදහසට එක් වෙමු - වැඩබිම ජය ගමු' අන්තර්ජාතික කම්කරු දින යෝජනාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සේවක සංගමයේ ලේකම් ලෙස්ලි දේවේන්ද්‍ර මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ට ඊයේ (30) භාර දුන් අයුරු. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඇතුළු පිරිසක් මෙහි වෙති.

## ලෝක කම්කරු දිනය අදයි

අනුර ප්‍රේමලාල් සහ හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ලෝක කම්කරු දිනය අදට (01) යෙදී තිබේ. මෙවර මැයි දිනය වෙනුවෙන් රැලි හා පෙළපාළි නොපවත්වන ලෙස ආණ්ඩුව ඉකුත් 20 වැනිදා ප්‍රකාශයට පත් කරනු ලැබුවේ රට තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙනි. පිට 6

## කෝටි 32ක රත්‍රන් කටුනායකදී අත්අඩංගුවට

ගුවන්තොටුපොළ සේවකයකු ඇතුළු දෙදෙනෙක් කොටු වෙති



පිට 6



## සතොස සහන මල්ල-2 හෙට සිට

අනුර ප්‍රේමලාල්

අත්‍යවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් 'සතොස සහන මල්ල - 2' මේ මාසයේ සිට දීමට නියමිත බව ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ඊයේ (30) පැවසීය. පිට 6




පිට 6



## බදියුදීන් අත්අඩංගුවට ගැනීම අසාධාරණයි

## බොරු චෝදනාවලට හිරේ ගිය බුද්ධි අංශ සාමාජිකයන් නිදහස් කරනවා

පිට 6



පිට 6

## හරීන් ප්‍රුලි 14 තෙක් අත්අඩංගුවට ගන්නේ නෑ

නීතිපති එකඟ වෙයි

පිට 6

## රාසික් සහරාන්ගෙ සොහොයුරාට පුපුරන ද්‍රව්‍ය දීලා

විමර්ශනවලින් අනාවරණය වෙයි

පිට 6

## සියලු උත්සව සති 2ක් තහනම්

## ටී.බී. පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම අද

Image:Google: Labour Statue, Marina Beach, Chennai.



# ජනහිතකාමී වැඩ බිමක්...
# සුරක්ෂිත දේශයක්...

## තහවුරු කරමින් ලෝක කම්කරු දිනය සමරමු...



අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා

***"රට වෙනුවෙන් වැඩ සංස්කෘතිය"***

*රටක ආර්ථිකයේ ගාමක බලවේගය ජාතික ශ්‍රම බලකායයි. රටක සංවර්ධනය රඳා පවතින්නේ එහි ඵලදායි ක්‍රියාකාරිත්වය මතයි. එම නිසා අප සූදානම් වන සංවර්ධනයේ යෝධ පිම්ම සඳහා අවශ්‍ය පුහුණුව කාර්යශීලි සහ රට වෙනුවෙන් කැපවෙන "වැඩ කිරීමේ සංස්කෘතියක්" ඇති කළ යුතුය. අඩුවෙන් වැඩ කරන දුප්පත්ව ජීවත් වන ශ්‍රමිකයෙකු වෙනුවට වැඩියෙන් වැඩ කරන පොහොසත් ජීවිතයක් ගත කරන ශ්‍රමිකයකු නිර්මාණය කිරීම අපගේ වගකීම වේ.*

*(සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය 28 පිටුව)*



ගරු අග්‍රාමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා

*2021 වර්ෂය සඳහා මා විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයෙන් වතු කම්කරුවන් සඳහා පොරොන්දු වූ රු. 1000/- දෛනික වැටුප ලබා දීමටත්, එමෙන්ම කම්කරු ප්‍රජාවගේ සුභසාධනය උදෙසා සේවක අර්ථසාධක අරමුදල් පනත, කාර්මික ආරවුල් පනත හා වන්දි ආඥා පනත වැනි කම්කරු පනත් ගණනාවක් යාවත්කාලීන කිරීම තුළින් කම්කරු අයිතීන් සුරරැකීමට අප රජයට හැකි වීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි.*



ගරු කම්කරු අමාත්‍ය නීතීඥ
නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා

*කොවිඩ් වසංගතය හේතුවෙන් වැඩබිම්වල කම්කරු අයිතීන් සුරැකීමේ අභියෝගයට ශක්තිමත්ව මුහුණදෙමින් කම්කරු අයිතීන් තහවුරු කිරීමට හැකිවීම පිළිබඳව අතිශයින්ම සතුටු වන අතර මේ සඳහා සහයෝගය ලබා දුන් සේව්‍ය සේවක දෙපාර්ශවය ඇතුළු සියලු දෙනාටම මාගේ කෘතඥතාවය පළ කරන අතර තේ හා රබර් කර්මාන්තයේ නියැළී සිටින කම්කරුවන්ගේ අවම දෛනික වැටුප අභියෝග රැසක් මැද රු. 1000/- දක්වා ඉහළ නැංවීමට හැකිවීම වැඩ කරන ජනතාව ලබා ගන්නා ලද සුවිශේෂී ජයග්‍රහණයකි.*

# 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ
## කරුණු යථාර්ථයක් කරමින් මෙරට වැඩ කරන ජනතාව වෙනුවෙන් වත්මන් රජය මගින් මෙතෙක් ඉටු කරන ලද සේවයෙන් බිදක්...

- රැකියාවන්හි යොදවා ගැනීමේ අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම තුළින් ළමුන් සඳහා අනිවාර්යය අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකම සුරක්ෂිත කිරීම.ඒ අනුව, වයස අවුරුදු 16ට අඩු ළමයින් සේවයේ යොදවා ගැනීමට නොහැකි වන ලෙස නෛතික ප්‍රතිපාදන සංශෝධනය කිරීම
- කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේදී වන්දි ලබා දෙන වන්දි සූත්‍රයේ උපරිම සීමාව ලක්ෂ 12.5 සිට ලක්ෂ 25 දක්වා වැඩි කිරීම
- ජාතික අවම වැටුප රු.10,000/- සිට රු. 12,500/- දක්වා ඉහළ නැංවීම
- විනය පරීක්ෂණ හෝ වැඩ තහනමට ලක් වන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ විනය පරීක්ෂණ මාස 06ක් ඇතුළත පවත්වා විනය නියෝග ලබා දීම කඩිනම් කිරීමට හැකි වන පරිදි පනත් සංශෝධනය කිරීම
- කාර්මික ආරවුල් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත යටතේ ලබා දෙන තීන්දුවලට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් අයදුම්පත් ගොනු කිරීමේදී ප්‍රදානයන්ට/නියෝගයන්ට අදාල මුදල් තැන්පත් කළ යුතු වන පරිදි නීති සංශෝධනය කිරීම
- සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන යටතේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු රුපියල් බිලියන 12ක් පමණ වන හිඟ අර්ථසාධක දායක මුදල් අයකර ගැනීම හා කම්කරු නඩු විමසීම කඩිනම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ හා කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබාදීමට නව විශේෂ විධිවිධාන පනතක් ගෙන ඒම
- රැකියාවේදී සිදුවන අනතුරක් හේතුවෙන් ශාරීරික හානි හෝ බෙලහීනතාවය පත්වන හෝ ජීවිතක්ෂයට පත්වන පුද්ගලයන්ට ලබා දෙන වන්දි මුදල රුපියල් ලක්ෂ 5.5 සිට රුපියල් ලක්ෂ 20 දක්වා වැඩි කිරීම
- පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා අවම විශ්‍රාම වයස අවුරුදු 60 ලෙස නීතිගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- වතු කම්කරුවන් සඳහා රු. 1000/- අවම දෛනික වැටුපක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ පුද්ගලික අංශයේ ව්‍යාපාරික ප්‍රජාව හා කර්මාන්තකරුවන් හට සිය ව්‍යාපාර හා කර්මාන්ත බාධාවකින් තොරව පවත්වා සේවකයන්ගේ රැකියා අහිමි වීම වළක්වා ගැනීමටත් රැකියා සුරක්ෂිත කිරීමටත් එම සේවයකයින් සෞඛ්‍ය රෙගුලාසි මත නිවසේ රැඳවීමේදී එම සේවකයින් අවසානයට ලද මූලික වැටුපෙන් 50%ක් හෝ රු.14,500/-ක මුදල යන දෙකෙන් වඩා වාසිදායක මුදල වැටුප් වශයෙන් ගෙවීම
- ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් සැකසීම උනන්දු කිරීම උදෙසා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් නියම කරමින් වෘත්තීය සුරක්ෂිතතාව, සේවක සෞඛ්‍ය හා සුභසාධන පිළිබඳ නව පනතක් පැනවීම
- සේවක අර්ථසාධන අරමුදලේ සාමාජිකයින්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකතන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම
- වයස අවුරුදු 18ට අඩු තැනැත්තන් සේවයේ යෙදවිය නොහැකිවන සේ අන්තරාදායක රැකියා නියෝග පැනවීම
- විදේශ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළැඹීම පහසු කරවන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම
- කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු විනිශ්චය සභාවල පවරන නඩු සඳහා නීතීඥ නොවන කම්කරු නියෝජිතයන්ට පෙනී සිටීමට හැකිවන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම
- යම් සේවකයකු සේවයට බඳවාගෙන දින 30ක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට අදාළව සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම
- කම්කරු වන්දි පිළිබඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීම
- ලංකා ට්‍රැක්ටර් ලිමිටඩ් සමාගමේ සේවකයින් 122 දෙනකු හට වසර 18ක් තිස්සේ නොගෙවා තිබූ රුපියල් මිලියන 22කට ආසන්න වන්දි මුදලක් ගෙවීමට කටයුතු කිරීම
- ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ට විදේශයන්හිදී ඔවුනට ඇතිවන සෞඛ්‍ය ගැටලු හා නීතිමය ගැටලු සඳහා සහන ලබා දිය හැකි රක්ෂණ ආවරණයක් ලබා දීමට කටයුතු සම්පාදනය කරමින් පවතී
- පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ නැවත මෙරටට පැමිණීමට අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුග්‍රහයෙන් නොමිලේ නිරෝධායනය වීම සඳහා නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපිත කර කඩිනමින් එම ශ්‍රමිකයින් නැවත මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම

කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව

වර්ෂ 2021 ක්වූ මැයි මස 1 වැනිදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



# යාපනයේ කේබල් රූපවාහිනියකින් ඇමැති ඩග්ලස් කෝටි 50ක් ඉල්ලයි

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ ක්‍රියාත්මක කේබල් රූපවාහිනී ආයතනයක් විසින් ප්‍රචාරය කළ පුවතක් නිසා ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ කීර්තිනාමයට වූ හානිය සඳහා රුපියල් මිලියන 500ක වන්දියක් ඉල්ලා ඇමැතිවරයාගේ නීතිඥවරයා මගින් අදාළ රූපවාහිනී ආයතනයට පෙරේදා (29දා) එන්තරවාසියක් යවා ඇත.

දින 14ක් ඇතුළත එම මුදල ගෙවීම පැහැර හරින්නේ නම් ඊට එරෙහිව නීතිමය පියවර ගන්නා බවද එන්තරවාසියේ සඳහන් කොට තිබේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාපෘති භාවිතා කරන්නන් තෝරා ගැනීමේදී අක්‍රමිකතාවක් සිදුව ඇති බවත්, කිලිනොච්චි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති සහ ඇමැතිවරයකු වන ඩග්ලස් දේවානන්දා මෙම වංචාවට සම්බන්ධ බවත් එම රූපවාහිනී ආයතනය විසින් ඔවුන්ගේ 2021.03.12 දින ප්‍රවෘත්ති ප්‍රකාශයේදී ප්‍රචාරය කොට තිබේ.

මෙම පුවත ද්වේෂ සහගත චේතනාවෙන් ප්‍රකාශයට පත් කර ඇති බවත් එමගින් ඔහුට අපහාස කරන බවත් සඳහන් කරමින් ධීවර ඇමැතිවරයා රුපියල් මිලියන 500ක වන්දියක් ඉල්ලා එන්තරවාසියක් යවා තිබේ.

## සවුදි අරාබියේ සිටි ශ්‍රී ලාංකිකයෝ මෙරටට

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවට පැමිණීමේ අපේක්ෂාවෙන් සවුදි අරාබියේ කඳවුරක රඳවා සිටි ශ්‍රී ලාංකිකයන්ගෙන් පළමු කණ්ඩායම මෙරටට ගෙන්වා ගැනීමට රජය පියවර ගෙන තිබේ.

සවුදි අරාබියේ රියාද් හි 'ටාර්හීල්' නම් පිටුවහල් කිරීමට නියමිත අය රඳවා තබා ගන්නා කඳවුරේ සිටි එම ශ්‍රී ලාංකිකයන්ගේ පළමුවැනි කණ්ඩායම ඊයේ (30දා) මෙරටට පැමිණි බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

මෙම ශ්‍රී ලාංකිකයන්ගේ පළමුවැනි කණ්ඩායම මෙරටට ගෙන්වා ගැනීමෙන් අනතුරුව දෙවැනි හා තෙවැනි කණ්ඩායම් මැයි 03 සහ මැයි 05 යන දිනවල දී ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට නියමිතයි.

මෙම කඳවුරේ රැඳවුවන් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය, සවුදි අරාබියානු බලධාරීන් සහ රියාද් හි ශ්‍රී ලාංකික තානාපති කාර්යාලය අතර පවත්නා අඛණ්ඩ සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් වන අතර 2020 ජූලි මාසයේ සිට තානාපති කාර්යාලය විසින් පිටුවහල් කිරීමේ කඳවුරුවලින් ශ්‍රී ලාංකික 154 දෙනකු නැවත ශ්‍රී ලංකාවට යෑම සඳහා පහසුකම් සලසා දී ඇති බවද විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහන් කරයි.

## අරණායක කොවිඩ් ආසාදිතයෝ 50ක්

**අරණායක සමූහ - ප්‍රදීප් කුමාර ධර්මරත්න**

අරණායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ පුද්ගලයන් පනස් දෙදෙනකුගේ සිදු කළ පීසීආර් පරීක්ෂණවලින් දස දෙනකු කොවිඩ් ආසාදිතයන් ලෙස තහවුරු වී ඇතැයි අරණායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී රසාංජන මෙන්ඩිස් මහතා ඊයේ (30දා) පැවසීය.

මෙම ආසාදිතයන් දස දෙනාට කලින් කොවිඩ් රෝගීන් 15 දෙනකු වාර්තා වූ අතර එම 15 දෙනාගෙන් පාසල් සිසුන් දෙදෙනකු, රාජ්‍ය නිලධාරීන් සිව් දෙනකුද සිටින බවත් එම රෝගීන් උදුගොඩ සහ රඹුක්කන කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත ප්‍රතිකාර සඳහා යොමු කළ බවද වෛද්‍ය රසාංජන මෙන්ඩිස් මහතා සඳහන් කළේය.

දීවෙල, අස්මඩල, කීරපන, තැඹරව ආදී ප්‍රදේශවලින් ආසාදිතයන් වැඩි වශයෙන් වාර්තා වී ඇති බවද වෛද්‍යවරයා කීය.

අරණායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව අස්මඩල ප්‍රදේශයේ සේවය කරන පවුල් සෞඛ්‍ය නිලධාරිනියකට ඇය රාජකාරි කරන ප්‍රදේශයේ මළ ගෙදරකට සහභාගි වීමෙන් පසු කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති අතර ඇයද උදුගොඩ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කර ඇත.

අරණායක සෞඛ්‍ය නිලධාරි කොට්ඨාසයේ ඉකුත් 24 සිදු කළ පීසීආර් පරීක්ෂණ 50 කින් 10 දෙනකු කොවිඩ් රෝගීන් ලෙස තහවුරු වී ඇති අතර තවත් 12කගේ වාර්තාවල ගැටලු සහගත තත්ත්වයක් නිසා එම 12 දෙනාගේ පීසීආර් පරීක්ෂණ නැවත ඊයේ (30දා) ගැනීමට කටයුතු කෙරිණි.



## ඉන්දියාවේ සිට මුහුදු මඟින් ගෙනා කහ සහ එනසාල් අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

ශ්‍රී ලංකා නාවික හමුදාව පසුගිය 27 සහ 28 යන දෙදින ශ්‍රී ලංකාවට වයඹ දෙසින් වූ මුහුදේදී නීති විරෝධී ලෙස අන්තර් ජාතික මුහුදු සීමාව උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට අයත් මුහුදු තීරයට ඇතුළු වූ ඉන්දීය යාත්‍රා දෙකක්, වියළි කහ කිලෝග්‍රෑම් 2790ක පමණ තොගයක්, එන්සාල් කිලෝග්‍රෑම් 803ක පමණ තොගයක් ඇතුළු තවත් ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයක් සමඟ ඉන්දීය ජාතිකයන් 12ක් නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කර තිබේ.

කුදිරමලෙයි තුඩුවට ඔබ්බෙන් වූ මුහුදේ නාවික හමුදාව පසුගිය 27 සහ 28 යන දෙදින සිදු කළ මුර සංචාරයන්හිදී අන්තර්ජාතික මුහුදු සීමාව උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට අයත් මුහුදු තීරයට ඇතුළු වූ සැක කටයුතු ඉන්දීය ඩව් යාත්‍රාවන් 2ක් පරීක්ෂාවට ලක් කරන ඇත. එහිදී එක් යාත්‍රාවක තිබූ නීති විරෝධී ලෙස මෙරටට ගෙන ඒමට උත්සාහ කළ පාර්සල් 425ක අසුරන ලද එන්සාල් කිලෝග්‍රෑම් 425ක පමණ ප්‍රමාණයක් ඇතුළු තවත් ආහාර හා පරිභෝජන ද්‍රව්‍යයන් සමඟ යාත්‍රාවේ සිටි ඉන්දීය ජාතිකයන් 7 ක් ද, පසුගිය 28 වන දින නිරීක්ෂණය කර පරීක්ෂාවට ලක් කරන ලද යාත්‍රාවේ තිබූ මළු 93ක අසුරන ලද වියළි කහ කිලෝග්‍රෑම් 2790ක පමණ තොගයක් සහ මළු 16ක අසුරන ලද එනසාල් කිලෝග්‍රෑම් 378ක ප්‍රමාණයක් සමඟ යාත්‍රාවේ සිටි ඉන්දීය ජාතිකයින් 05ක් නාවික හමුදා භාරයට ගෙන ඇත.

ඉන්දීය යාත්‍රාවන් මගින් රැගෙන එන ලද එනසාල්, වියළි කහ ඇතුළු අනෙකුත් පරිභෝජන ද්‍රව්‍යයන් මුහුදේදී මෙරට යාත්‍රාවන්ට හුවමාරු කර ගොඩබිමට රැගෙන ඒමට ජාවාරම්කරුවන් සැලසුම් කර තිබෙන්නට ඇතැයි නාවික හමුදාව සැක කෙරේ.

## චීන ඇමැතිට බාධා කළ තරුණයා සමාව ගනී

**සිරන්ජනි කුමාරි**

චීන ආරක්ෂක ඇමැතිවරයාගේ ආරක්ෂක රථ පෙළට බොරැල්ල මංසන්ධියේ දී බාධා කළ හා එහි රාජකාරියේ නිරත පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට අවහිර කළ සැකකරුවකු රුපියල් පනස් දහසක ශරීර ඇප මත මුදාහැරීමට කොළඹ අතිරේක මහේස්ත්‍රාත් රජින්ද්‍රා ජයසූරිය මහත්මිය ඊයේ (30දා) නියෝග කළාය.

ඊයේ (30දා) පොලිසිය සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ, චීන ආරක්ෂක ඇමැතිවරයාගේ රාජ්‍ය තාන්ත්‍රික නිල සංචාරය ගැන තමන් දැනුම්වත්ව නොසිටි බව සඳහන් කළ සැකකරු ඒ ගැන අධිකරණය හමුවේ සමාව ඉල්ලා සිටියේය. මෙම කරුණු සලකා බැලූ මහේස්ත්‍රාත්වරිය සැකකරුට ඇප නියම කළාය.

මෙලෙස ඇප මත මුදා හැරුණේ බත්තරමුල්ල, පැළවත්තේ පදිංචි ගවීන් මාධව විජේරත්න (අවු:31) නමැති අයයි. ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන මොහු වසර දහයක් ඕස්ට්‍රේලියාවේ පදිංචි ව සිටි අයකු බව ප්‍රකාශ කළේය. මොහු බොරැල්ල මංසන්ධිය අසලදී සිය වාහනයේ නලාව ශබ්ද කර චීන ආරක්ෂක ඇමැතිවරයාගේ ආරක්ෂක රථ පෙළට බාධා කරන අයුරු වීඩියෝ ගත කර සමාජය මාධ්‍යට මුදා හැර ඇති බවට බොරැල්ල පොලිසිය අධිකරණය හමුවේ කරුණු දැක්වීය.

ඒ අනුව විමර්ශනය කර සැකකරු නාරාහේන්පිට ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව බොරැල්ල පොලිසිය අධිකරණය හමුවේ පැවැසීය. ඕස්ට්‍රේලියාවේ හෝ වෙනත් කුමන රටක උපාධි ගෙන පැමිණිය ද, අප රටේ නීතියට අනුගත විය යුතු බව ප්‍රකාශ කළ අතිරේක මහේස්ත්‍රාත්වරිය දැඩි අවවාද කර සැකකරු ඇප මත මුදාහැරීමට නියම කළාය.

දණ්ඩ නීති සංග්‍රහය යටතේ 120, 185, 485, 344 යන චෝදනා මෙම සැකකරුට එරෙහිව ගොනු කර අධිකරණය හමුවේ ඉදිරිපත් කර තිබිණි. පැමිණිල්ල වෙනුවෙන් බොරැල්ල පොලිසියේ ස්ථානාධිපති දුමින්ද බාලසූරිය හා පොලිස් සැරයන් බණ්ඩාර යන මහත්වරු අධිකරණය හමුවේ පෙනී සිටියහ.

## පුත්තලමේ ආසාදිතයෝ 32ක්

**ඩබ්. බෙනඩික් ප්‍රනාන්දු - පුත්තලම සමූහ**

පුත්තලම, කල්පිටිය සහ ආණමඩුව සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශවලින් කොවිඩ් ආසාදිතයෝ තිස් දෙදෙනකු (32) පෙරේදා (29දා) සිදු කළ පීසීආර් පරීක්ෂණවලදී වාර්තා වී ඇත.

හඳුනාගත් ආසාදිතයන් ප්‍රතිකාර සඳහා කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කර ඇත. මේ අතර ආණමඩුව නගරයේ මූල්‍ය ආයතනයක සේවකයන් දෙදෙනකුට කොඩිඩ් ආසාදනය වීම නිසා එම මූල්‍ය ආයතනය තාවකාලිකව වසා දමා ඇත.

## කටුනායක අධිවේගයේ අනතුරකින් සුමන්තිරන්ගේ රියට දැඩි හානි

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා ගමන් කළ මෝටර් රථය ඊයේ (30දා) උදෑසන කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වීම නිසා මෝටර් රථයට දැඩි හානි සිදුව තිබේ.

මෙම අනතුරෙන් මන්ත්‍රීවරයාට කිසිදු හානියක් නොමැති බව ඔහුගේ පවුලේ උදවිය ප්‍රකාශ කරයි. අධික වර්ෂාව පැවති අවස්ථාවේදි ධාවනය වූ මන්ත්‍රීවරයාගේ වාහනය පාරෙන් ලිස්සා ඉවතට පැන අධිවේගි මාර්ගයේ ආරක්ෂිත වැටක වැදීමෙන් මෙම අනතුර සිදුව තිබේ.

## සමාජ මාධ්‍ය ජාලාවල පළ වන කොවිඩ් පත්‍රිකාව පොලිසියේ නොවේ

### නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ

**රක්ෂණ ශ්‍රියන්ත**

කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය මුද්‍රණය කළ පත්‍රිකාවක් ලෙස හැඟෙන ආකාරයට ව්‍යාජව සකස් කළ පත්‍රිකාවක් සමාජ මාධ්‍ය ජාලාවල පළ වන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් පොලිසිය භාර නොගන්නා බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

ශ්‍රී ලංකා පොලිසිය ලෙස ව්‍යාජව සකස් කර ඇති මෙම පත්‍රිකාවේ පොලිස් ලාංඡනයද යොදා ඇති අතර එහි සම්බන්ධ කිසිදු කරුණක් සම්බන්ධයෙන් පොලිසිය වගකීමක් නොදරන බව එම පත්‍රිකාව පොලිසිය විසින් නිර්මාණය කරන ලද පත්‍රිකාවක් නොවන බවත් එය වැරැදි ප්‍රවෘත්තියක් බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටී.

මෙවැනි ව්‍යාජ පත්‍රිකාවක් නිර්මාණය කර අන්තර්ජාලය හරහා බෙදා හැරීම සිදු කළ පුද්ගලයා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අංශය විමර්ශනයක් ආරම්භ කර ඇත.

## ගිරිබාව රෝහල වසයි

**මිහිර විජේසේකර - මාරවිල සමූහ**

ගිරිබාව රෝහලේදී කොරෝනා ආසාදිත රෝගියකු මරණයට පත්වීමත් සමඟ පෙරේදා (29දා) තාවකාලිකව වසා දැමීමට කටයුතු කළ බව කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා ප්‍රමිතා රත්නායක මහත්මිය සඳහන් කළාය.

මෙසේ කොරෝනා ආසාදිතව මරණයට පත්වී ඇත්තේ වරාවැව පදිංචි ආර්.එච්.එම්. හේරත් මැණිකේ නැමැති 68 හැවිරිදි හය දරු මවකි. අදාළ කාන්තාව දින කිහිපයකට පෙර කැස්ස හා සෙම් රෝගයක් හේතුවෙන් ප්‍රතිකාර ගැනීමට ගිරිබාව රෝහලේ නේවාසිකව සිටි බව සඳහන් වෙයි.

## කසළ ගොඩේ ගින්නට හසුව මිය ගිය අයට කොරෝනා

**අසේල කුරුළුවංශ**

කසළ ගිනි තැබීමට ගොස් ගිනි ගොඩට ඇද වැටී බරපතළ පිලිස්සුම් තුවාල සහිතව පේරාදෙණිය ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මරණයට පත්වූ පුද්ගලයකුට සිදු කළ පීසීආර් පරීක්ෂණයේදී ඔහුට කොවිඩ් වයිරසය වැලඳී තිබෙන බව තහවුරුව ඇත.

රාමසාමි ගනේශන් නැමැති මිය ගිය පුද්ගලයා මඩොල්කැලේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පෙරේදා (28) පේරාදෙණිය ශික්ෂණ රෝහලට මාරු කර එවා තිබේ.

බරපතළ පිලිස්සුම් තුවාල සමඟ සිටි ඔහු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගිය පසු මළ සිරුර පශ්චාත් මරණ පරීක්ෂණයට යොමු කර ඇත.

පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධිකරණ වෛද්‍ය විශේෂඥ සමීර ගුණසේකර මහතා විසින් සිදු කරනු ලැබ තිබෙන අතර බරපතළ පිලිස්සුම් තුවාල සහ කොවිඩ් -19 වයිරසය ශරීරගත වීම මරණයට හේතුව බව ඒ මහතා වෛද්‍ය වාර්තාව මගින් දක්වා තිබේ.

අධිකරණ වෛද්‍ය වර්තාව සහ සාක්කි සැලකිල්ලට ගත් පේරාදෙණිය රෝහලේ හදිසි මරණ පරීක්ෂක අමල් ජයවර්ධන මහතා මෙය ගිනි ගොඩට ඇද වැටීමෙන් ඇතිවූ බරපතළ තුවාල සහ කොවිඩ් -19 වයිරසය ආසාදනය වීමෙන් වූ හදිසි මරණයක් බවට තීන්දු කළේය.

මෙම පුද්ගලයාට කොවිඩ් වයිරසය ආසාදනය වූයේ කෙසේද යන්න පිළිබඳ කිසිදු නිශ්චිත තොරතුරක් නොමැති බව ජයවර්ධන මහතා කීය. මියගිය පුද්ගලයාගේ ළඟම ආශ්‍රිතයන් හා මරණ පරීක්ෂණ කටයුතුවලට සම්බන්ධවූ පන්විල පොලීසියේ නිලධාරියා ස්වයං නිරෝධායනයට යොමු කළ බවද ඒ මහතා ප්‍රකාශ කළේය.




## මෙදා එජාපයේ මැයි දින සැමරුම නෑ

**ශිරෝමි අබයසිංහ**

රට තුළ පවතින කොරෝනා වසංගතය දිනෙන් දින උග්‍ර වීම නිසා මෙවර මැයි දිනය වෙනුවෙන් පැවැත්වීමට සැලසුම් කර තිබූ සැමරුම් උත්සවය නොපැවැත්වීමට තීරණය කළ බව එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා පවසයි.

ඉතාමත් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව පිටකෝට්ටේ පිහිටි ජාතික සේවක සංගම් මූලස්ථානයේදි මෙවර මැයි දින සැමරුම පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර පවතින තත්ත්වය සලකා පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත සැමරුම් උත්සවය නොපැවැත්වීමට තීරණය කළ බවත් රංගේ බණ්ඩාර මහතා පැවසීය.

ගිනිකොණ

| | |
|---|---|
| ඉස්පිරිතාල පද්ධතියට ගන්න | දරා |
| බැරි තරමට ලෙඩුන් එනවලු එතැන් | කරා |
| දුවලා වගෙයි හතුරා මුළු රටම | පුරා |
| කොයි මොහොතේ යයි ද නොදනිමු කවුරු | කරා |

ගස්මන් හෝනා

| | |
|---|---|
| චිකාගෝ නුවර උණු ලේ කඳුළු | හෙළා |
| අද වැනි දිනෙක කම්කරු අරගලය | කළා |
| ඒ ගැන මෙනෙහි කර ජනයා නොකර | මුළා |
| කම්කරු දිනය සමරමු! ගෙදරටම | වෙලා |
| පිට්ටනිවලට ජනයා රැස් කරනු | බැරී |
| කොරෝනා තිබේ නරකම අතට | හැරී |
| හැමදෙන සාමූහික හැඟුමෙන් රැගෙන | දිරී |
| බේරෙමු! වසංගතයෙන් අපි කොහොම | හරී |

රටේමුල්ලේ මුදන්නායක



කොළඹ දී

## රිෂාඩ් වෙනුවෙන් උද්ඝෝෂණ



මන්නාරමේ දී

ඡායාරූපය - උතුරු පළාත් විශේෂ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මැයි 01 සෙනසුරාදා

# හඬක් නැති මැයි දිනය!

මෙවර මැයි දිනය සමරන්නට සිදු වී ඇත්තේ නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින්ය. ලෝකය පුරා විසිරී සිටින බිලියන ගණනක් වූ කම්කරු ප්‍රජාව 1886 පටන් පෙළ ගැසෙමින් අඛණ්ඩව මැයි දිනය සැමරූහ. යුද ගැටුම් නිසා ද ස්වාභාවික විපත් නිසා ද එකිනෙක රටවල මැයි දිනය වරින් - වර අඳුරු වී ඇති නමුදු සමස්ත ලෝකයටම බලපාන ලෙසින් මැයි දිනය නිහඬ වී ඇත්තේ මේ වසර තුළය. ස්වභාව ධර්මය මිනිසාට ලබා දුන් දඬුවමක් ලෙසින් සැලැකිය හැකි කොවිඩ් වසංගතය ඊට හේතු - සාධක වී තිබේ. ඇතැම් රටවල මැයි දිනය සමරනු ලබන්නේ වුව ඒ වෙනදා තරම් උද්‍යෝගයකින් නොවේ. කොවිඩ් වයිරසය මානවයා වෙතින් බොහෝ දේවල් උදුරාගෙන තිබේ. ඒ අතර මැයි දින සැමරුම ද ඇත.

ලෝක කම්කරු ප්‍රජාවගේ පෙළ ගැස්මේ ඉතිහාසය ගතහොත් එය 1880 න් ඔබ්බට ද ගමන් කරයි. 1856 ඕස්ට්‍රේලියානු ගල්වඩුවන්ගේ සිදුවීම් මාලාව, 1886 චිකාගෝ කම්කරුවන්ගේ ඉල්ලීම් සහිත විරෝධතා, 1890 කම්කරු ප්‍රජාවගේ ජාත්‍යන්තර එකමුතුව එහි සන්ධිස්ථාන ලෙස සැලැකිය හැකිය. අතීත කම්කරු පන්තිය සිය ඉල්ලීම් දිනාගෙන ඇත්තේ ද යුක්තිය ඉටු කරගෙන ඇත්තේ ද අරගල ඔස්සේය. එබැවින් කම්කරු ඉතිහාසය යනු ලෙයින්, කඳුළින් හා දහදියෙන් සමන්විත දීර්ඝ වෘත්තාන්තයක් යැයි කිව හැකිය. ලෝක කම්කරු ප්‍රජාවගේ පැරිස් සම්මේලනයේ සිට මේ දක්වා සම්මේලන ගණනාවක් පවත්වා ඇත. එහෙත් ලෝක කම්කරු දිනය නිවාඩු දිනයක් බවට පත් නොකළ රාජ්‍යයන් ගණනාවක් අදටත් තිබේ.

කම්කරු පන්තියේ අයිතිවාසිකම් දෙස ආපසු හැරී බලන විට ඒ සඳහා සිහියට නැඟෙන දැවැන්ත ආයතනය වන්නේ ලෝක කම්කරු සංවිධානයයි. එම සංවිධානය කම්කරු පන්තිය වෙනුවෙන් සැලැකිය යුතු වැඩ කොටසක් ඉටුකර ඇත්තේ වුව ලෝකය පුරා විසිරී සිටින බිලියන ගණනක් වූ කම්කරු සමූහයේ සුවිශේෂී ගැටලු විසැඳීමට සමත් වී නැත. තව අතෙකින් ලෝක කම්කරුවන්ගේ පොදු පෙළ ගැස්ම වෙනුවට අද දකින්නට ලැබෙන්නේ දේශපාලන පෙළ ගැස්මකි. දේශපාලන ව්‍යාපාර විසින් කම්කරු පන්තියේ කොටස් ගොදුරු කරගනු ලැබ තිබේ. ඒ අනුව කම්කරුවෝ දේශපාලන පක්ෂවල සටන් පාඨ හඬ නඟමින් සිටිති. එය අවාසනාවන්ත තත්ත්වයකි.

1991ට පෙර සෝවියට් සංගමය පවතින කාලය තුළ මහ ඉහළින් කම්කරු දිනය සමරනු දක්නට ලැබිණි. කියුබාව, උතුරු කොරියාව, චීනය ඇතුළු සමාජවාදී රටවල් එහි පෙරමුණ ගත්හ. එහෙත් සෝවියට් සංගමය බිඳ වැටීමත් සමඟ කම්කරු දින සැමරුම් යම් ආකාරයකින් දුර්වල විය. කම්කරු දිනය හා සමාජවාදී ව්‍යාපාරය ලෝක කම්කරු ප්‍රජාව ඒකරාශී කරන මාවතක් ලෙස පැවැතිණි. එහෙත් අද එය දකින්නට නැත. මේ අනුව එකිනෙක ධනපති දේශපාලන පක්ෂ වෙත ලෝක කම්කරුවෝ අනුගතව සිටිති. එය අවාසනාවන්ත තත්ත්වයකි. මේ අවාසනාවන්ත තත්ත්වය තුළ වුව පොදු සටන් ද දැකගත හැකිය. එහෙත් ඒවා එකිනෙක රටවලට, ප්‍රදේශවලට හා කලාපවලට සීමා වී ඇත. කොවිඩ් වසංගත තත්ත්වය මත මෙය තවදුරටත් අවුල් වී තිබේ.

ශ්‍රී ලංකාව මැයි දින රැස්වීම් සියල්ල තහනම් කර ඇත. එය දේශපාලන අධිකාරියේ තනි තීන්දුවක් නොව සෞඛ්‍ය අංශවල නිර්දේශ හා උපදේශන අනුව ගනු ලැබූ තීන්දුවකි. අලුත් අවුරුදු සමයෙන් පසු කොවිඩ් තෙවන රැල්ලක් මතු වී ඇති අතර, එය ශීඝ්‍රයෙන් පැතිර යන්නට පටන් ගෙන තිබේ. දිනකට හමුවන නව ආසාදිතයන්ගේ ගණන දහස ඉක්මවා ඇත. වයිරසයේ නව ප්‍රභේද කිහිපයක් රට තුළ පවතින බව ද වාර්තා වී තිබේ. ප්‍රදේශ කිහිපයක් 'ලොක් ඩවුන්'කර තිබේ. සංචරණ සීමා පනවා ඇත. මේ සියල්ල සලකා බලන විට පෙනී යන්නේ අතිශය අවදානම් සහගත පසුබිමක් නිර්මාණය වී ඇති බවය. සියල්ල සලකා බලන විට ආණ්ඩුව ගෙන ඇති තීරණය වැරැදි යැයි කිසිවකුටත් කිව නොහැකිය.

වත්මන් ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු වැඩ කරන ජනතාව වෙනුවෙන් ඉටු කළ වැදගත් වැඩ කොටස් ගණනාවක් තිබේ. කොවිඩ් තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ කිසිවකුගේ රැකියා අහිමි වී නැත. බිඳ වැටුණු ව්‍යාපාර යළි පවත්වා ගැනීමට ද වැඩ නැවැත් වූ කර්මාන්ත යළි සක්‍රියභාවයට පත් කිරීමට ද රජය පියවර ගත්තේය. අමෙරිකාව වැනි බලවත් රාජ්‍යයක් තුළ කොවිඩ් නිසා මිලියන ගණනකට රැකියා අහිමි වී ඇත. එය අනාගතයට බලපාන ආර්ථික අර්බුදයක් සේ සැලැකිය හැකිය. රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමට ද ඊට අදාළ මහජන සේවා විධිමත් කිරීමට ද ආණ්ඩුව පියවර ගෙන තිබේ. නව රැකියා දීම අතින් ද ආණ්ඩුව තබා ඇත්තේ වාර්තාවකි.

රටේ ශ්‍රම බළකායේ වැදගත්ම කොටස වන්නේ තරුණ පරම්පරාවය. තරුණ පරම්පරාව කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. පළමු කොටස වන්නේ උගත් පරම්පරාවය. දෙවන කොටස වන්නේ පිළිගත් අධ්‍යාපන සුදුසුකම් නැති පරම්පරාවය. ආණ්ඩුව මේ කණ්ඩායම් දෙක කෙරෙහිම අවධානය යොමුකොට රැකියා ලබාදීමට පියවර ගත්තේය. එය මෙරට ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවකි. අධ්‍යාපන සුදුසුකම් නැති ලක්ෂයක් දෙනාට රාජ්‍ය අංශයේ රැකියාවක් ලබාදීමට ද ඔවුනට අවශ්‍ය පුහුණුව දීමට ද ආණ්ඩුව පියවරගෙන ඇත්තේ ජනාධිපතිවරයාගේ උපදෙස් මතය. උපාධිධාරීන් හැට දහසකට ස්ථිර රැකියා දීමට ද පියවර ගෙන තිබේ. මේවා වැඩ කරන පන්තියේ ජයග්‍රහණ ලෙස සැලැකිය හැකිය.

රටට විදේශ විනිමය උපයන වතුකම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් දහස දක්වා වැඩි කළ යුතු බවට අරගලයක් පැවැතියේ සෑහෙන කාලයක සිටය. ඊට ස්ථාවර විසැඳුමක් දීමට කිසිදු ආණ්ඩුවක් සමත් වූයේ නැත. එහෙත් වත්මන් ආණ්ඩුව දෛනික වැටුප දහසක් විය යුතුය යන්න නීතිගත කොට ඊට විසැඳුමක් දී ඇත. මෙවර මැයි දින පෙළපාලි නැති බැවින් වතුකම්කරුවන්ගේ ප්‍රීති - සෝෂා දකින්නට නොලැබෙනු ඇත.

### දිල්රුගෙ සිව්පද

| | |
|---|---|
| දුගියට මගියාට මහ ධනවතුනට | ද |
| වින කර පැතිර යන මහ වයිරසය | මැද |
| මැයි රැළි කොරෝනා රැල්ලෙන් මඩින | ලද |
| කළුවර නිහඬ කම්කරු දිනයක් ය | අද |

# ලෝකය බියෙන් සසල කළ මාරක කොවිඩ් උවදුර

ඉකුත් බ්‍රහස්පතින්දා වන විට ඉන්දියාවෙන් වාර්තා වන කොවිඩ් ආසාදනයට ලක්වූවන්ගේ සංඛ්‍යාව මිලියන 18 ඉක්මවීය. ඒ, වසංගත ව්‍යාප්තියත් සමඟ ලෝකයේම මෙතෙක් දිනක් තුළ වාර්තා වූ වැඩිම ආසාධිතයින් සංඛ්‍යාව වන 379,257ද ඊට ඇතුළත් කරමිනි. එදින වාර්තා වූ මරණ සංඛ්‍යාව 3645 කි. ලොව දෙවැනි වැඩිම ජනගහනය සහිත රාජ්‍ය වන ඉන්දියාව කොවිඩ් 19 හේතුවෙන් දරුණු ලෙස පීඩා විඳිමින් සිටියදී ප්‍රාන්ත කිහිපයක පංචායත් සභා මැතිවරණ ද පැවැත්වේ. එම මැතිවරණ ක්‍රියාවලිය කල්දැමිය නොහැකි බවට අධිකරණය ද තීන්දු කර තිබේ.

දිනපතාම රෝහල් ඇඳන් හා ඔක්සිජන් සොයා යන පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ යමින් ඇත. සමාජ මාධ්‍ය යෙදුම් (app) ඔස්සේ මෙන්ම පුද්ගල සම්බන්ධතා ඔස්සේ ද සිය සමීප ඥාතීන්, මිතුරන් වෙනුවෙන් එම පහසුකම ලබා ගැනීමට හැකි දැයි සොයා බලන තැනැත්තන්ගේ සංඛ්‍යාව විශාලය. ඉන්දීය රජයේ ප්‍රධාන විද්‍යාත්මක උපදේශක කේ. විජේරාගවන් පවසන පරිදි කොවිඩ් දෙවැනි රැල්ලේ රුදුරු බව සියල්ලන්ම මවිතයට පත් කර ඇත. ඔහු පෙන්වා දෙන්නේ මෙවැනි තත්ත්වයක් ඇති වූයේ සෙසු රටවල ද දෙවැනි රැළි නැඟුණු බව ඉන්දියාව හොඳින්ම දැන සිටියදී සහ එන්නත් ද තමන් සතුව තිබියදී බවය.

## ඔක්සිජන් හිඟය

ඇතිව තිබෙන ඔක්සිජන් හිඟය කළු කඩ ජාවාරම්කරුවන්ට ඉල්ලමක් වී තිබේ. ජීවිතය යදින මිනිසුන්ගේ සුසුම් යටපත් කර උපරිම හා අයුතු ලාභය ඉහළට පැමිණ ඇත. ඔක්සිජන් හිඟය මැයි මාසය මැද වන විට පියවීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ වන විට විදේශ රටවලින් ද ඉන්දියාවට ආධාර ලැබෙමින් පවතී. මැයි මස වන විට රට පුරා අවශ්‍ය ප්‍රදේශවලට ඔක්සිජන් බෙදාහැරීම පිණිස ප්‍රවාහන පහසුකම් සළසාගැනීම පිළිබඳ කටයුතු කෙරෙමින් පවතින බව ප්‍රකාශ කරන්නේ එරට විශාලම ඔක්සිජන් නිෂ්පාදකයා වන Linde සමාගමය. රෝහල් ඇඳන් හිඟයට පිළියමක් ලෙස හෝටල් සහ දුම්රිය මැදිරි හදිසි ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් ද දියත්ව තිබේ. තවමත් රෝහල්වලට ඇතුළත් වීම සඳහා අපේක්ෂාවෙන් පෙළෙන රෝගීන්ගේ දිගු පෝළිම් දැකිය හැකිය.

ඉන්දියාවෙන් වාර්තා වන කොවිඩ් මරණ සංඛ්‍යාව මීට වඩා කිහිප ගුණයක් වැඩි විය හැකි බව ද වාර්තාවේ. කෙසේ වුව ද රොයිටර් වාර්තා කළ පරිදි නිල සංඛ්‍යා ලේඛන අනුව එම මරණ සංඛ්‍යාව පුද්ගලයන් මිලියනයකට 147.2 බ්‍රසීලයේ එම අනුපාතය මිලියනයට 1800 ක් වන අතර, අමෙරිකාවේ මිලියනයට 1700 කි.

එරට සෞඛ්‍ය කාර්යමණ්ඩල මෙන්ම ආදාහනාගාර සේවකයන් ද වෙහෙසට පත්ව සිටී. වෛද්‍යවරු මෙන්ම හෙද කාර්යමණ්ඩල විවේක නොලබා සේවයේ යෙදී සිටිති. එම ඇතැම් දෙනා පවතින තත්ත්වය හමුවේ කම්පනයට පත්ව සිටින අයුරු දැක්වෙන ප්‍රකාශ දැකගත හැකි විය. රෝගීන් රෝහල්වලට ඇතුළත් වීමට පෙර රථවාහන තුළදීම ජීවිතයෙන් සමුගන්නා අයුරු බලා සිටීමට ඔවුන්ගේ ඥාතීන්ට සිදුව තිබේ. ඔවුන් කරා ඔක්සිජන් ළඟා වන විට ඔවුන් සිය අවසන් හුස්ම පොද නිදහස් කර අවසන්ය.

## එන්නත් තොග

ඉන්දියාව යනු ලොව ප්‍රධානම එන්නත් නිෂ්පාදකයාය. පවතින තත්ත්වය හමුවේ එරට වයස අවුරුදු 18 ට වැඩි වැඩිහිටි මිලියන 940 ක ජනගහනයටම එන්නත් ලබාදීම අද සිට ඇරඹේ. එසේ වුවද සෞඛ්‍ය අංශ උපුටමින් විදෙස් මාධ්‍ය වාර්තා කරන්නේ ඒ සඳහා ප්‍රමාණවත් එන්නත් මාත්‍රා තොග එරට සතුව නැති බවය. ඉන්දියාවේ එන්නත්කරණ වැඩසටහන් ඇරඹුණේ ඉකුත් ජනවාරියේදීය. ඒ වන විට දෛනිකව එන්නත් මාත්‍රා මිලියන 3 ක් සැපයීමේ හැකියාව තිබිණි. පසුව එය පහත වැටිණි. ඇස්ට්‍රා සෙනිකා එන්නත නිපදවන Serum නිෂ්පාදන ආපනයනය මසකට නිපදවන එන්නත් මාත්‍රා ගණන මිලියන 60 කි. Bharat Biotech සමාගම Covaxin මාත්‍රා මිලියන 10ක් පමණ මසකට නිෂ්පාදනය කරයි. 'නිව් යෝර්ක් ටයිම්ස්' වාර්තා කරන පරිදි තවත් සමාගමක් රුසියානු ස්පුට්නික් - V එන්නත ද මේ වසර අවසානය වන විට නිපදවීමේ සූදානමක සිටී. කෙසේ වුවද පවතින ඉල්ලුමට අනුව තවමත් ඇත්තේ හිඟයකි.

මෙවැනි පසුබිමක අගමැති මෝදි මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද පොළට යන ලෙස සිය ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටීම ඇතැම් පාර්ශ්වවල විවේචනයට ලක්ව තිබේ. ප්‍රකට ලේඛිකා, දේශපාලන ක්‍රියාකාරිනී අරුන්දතී රෝයි පවසන පරිදි ලෝකය මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයක් අත්විඳිමින් සිටී. රෝහල් කොරිඩෝරවල, මහමඟ මෙන්ම නිවෙස් තුළ මිනිසුන් මිය යමින් සිටියදී ඔවුන්ගේ ජීවිත බේරාගැනීමට රජයට නොහැකි වී ඇති බවට ඇය චෝදනා කරයි.



අගමැති මෝදි සහභාගි වූ දේශපාලන රැලිවල විශාල ජනතා සහභාගිත්වයක් දැකිය හැකි විය. බටහිර බෙංගාලයේ මැතිවරණය අවසන් අදියරට එළැඹ තිබියදී කොවිඩ් - 19 ප්‍රොටකෝල වලට අනුව ඡන්ද මධ්‍යස්ථානයට ගොස් ඡන්දය ප්‍රකාශ කර ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දායක වන ලෙස ඔහු ට්විටර් පණිවිඩයක් මඟින් ජනතාවගෙන් ඉල්ලා තිබිණි.

## දෙවැනි රැල්ල

දෙවැනි රැල්ල ආරම්භයත් සමඟ බරපතළම තත්ත්වයක් දිස්වූයේ දිල්ලියේය. එම තත්ත්වය තවමත් එලෙසමය. එසේ තිබියදී මේ වන විට ක්‍රමයෙන් ගම්බිම් කරා ද දෙවැනි රැල්ල ව්‍යාප්ත වෙමින් ඇත්තේ ඛේදනීය අයුරිනි. දිල්ලියේ තරම් පහසුකම් එම ප්‍රත්‍යන්ත ප්‍රදේශවල නොමැති බව පැහැදිලි කාරණයකි. සෞඛ්‍ය අංශ පවසන පරිදි ප්‍රජා ව්‍යාප්තිය අයහපත් අතට හැරී ඇත්තේ කළ යුත්තේ කුමක් ද, යා යුත්තේ කොහේද යන්න පවා ජනතාවට සිතාගත නොහැකි වී ඇත. ඇතැම් රෝහල්, රෝගීන් සමඟ පැමිණෙන ඔවුන්ගේ ඥාතීන්ට උපදෙස් දෙමින් සිටින්නේ, ඔක්සිජන් සිලින්ඩරයක් ද රැගෙන පැමිණෙන ලෙසටය. ඇතැම් දෙනා පවසා ඇත්තේ රෝහලේ ඔක්සිජන් තිබේ ද නැති ද යන්න තමන් නොදන්නා නමුත් ඔක්සිජන් සිලින්ඩරයක් ද සමගම එහි පැමිණි බවය. ඇතැම් අවස්ථාවල එය අවසන් වූ පසු යළි පිරවීම ප්‍රශ්නයක් වී තිබේ. ප්‍රාදේශීය රෝහල්වලට පැමිණෙන බරපතළ තත්ත්වයේ සිටින රෝගීන් දිසා රෝහල්වලට යොමු කිරීම සිදු වුවද එහිදී ද ඔක්සිජන් සැපයීමට හැකිවනු ඇතැයි සහතිකයක් නැත. ඉන්දියානුවන්ගෙන් බොහෝදෙනකුට සෙසු අය සමඟ හුවමාරු කර ගැනීමට ඇත්තේ එකම කතාවකි. ඒ, තම සමීපතමයන් ජීවිතය අයදිමින් අසරණව සිටින අයුරු සහ ඔවුන් රැක ගැනීමට දරන වෑයම ගැනය.




වසංගත තත්ත්වය වර්ධනය වෙමින් තිබීම පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ අමෙරිකා කාර්යාලය (PAHO) ද අනතුරු අඟවා තිබේ. එම ප්‍රධානියා පවසන පරිදි වයිරස ව්‍යාප්තිය වළක්වා ගැනීමේ ක්‍රම සහ පිළිවෙත් අනුගමනය කිරීම මෙන්ම එන්නත් අවශ්‍ය සැමටම ලබාගත හැකි අන්දමින් බෙදාහැරීම ද අවශ්‍ය වී ඇත. දකුණු අමෙරිකාවේ මේ වසරේ මුල් මාස 4 තත්ත්වය ඉකුත් වසරේ එම කාලයට වඩා බරපතළ බව ඇය පෙන්වා දී තිබිණි. මෙක්සිකෝ සිටි ප්‍රදේශයේ මිලියන 1.4 ක් දෙනාට ගත වූ සතිය තුළ වයිරසය ආසාදනය වී තිබේ. ඉකුත් සතියේ ලොව වාර්තා වූ කොවිඩ් මරණ අතරින් සෑම ¼ ක්ම අමෙරිකානුවෙකි. කැනඩාවේ ද ආසාදනයට ලක්වන සංඛ්‍යාව ඉහළ යාමක් පෙන්නුම් කරයි. PAHO ප්‍රධානියා රටවලින් ඉල්ලා සිටින්නේ තමන් සතුව එන්නත් අමතර තොග තිබේ නම්, ඒවා එන්නත් අවශ්‍ය නමුත් හිඟයක් ඇති සෙසු රටවලට ලබාදෙන ලෙසය.

## එන්නත්කරණ වැඩසටහන

බ්‍රසීලයේ ද ඉකුත් බ්‍රහස්පතින්දා වන විට කොවිඩ් මරණ සංඛ්‍යාව 400,000 ඉක්ම වූයේ එවැනි දෙවැනි රට බවට පත්වෙමිනි. ගත වූ මසක කාලයක් තුළ පමණක් එරටින් මරණ 100,000ක් වාර්තා විය. සෞඛ්‍ය විශේෂඥයින් අනතුරු අඟවන්නේ එළැඹෙන ශීත කාලයේදී මේ තත්ත්වය වඩාත් අයහපත් අතට හැරීමට ඉඩ ඇති බවය. අප්‍රේල් මාසය සටහන් වන්නේ බ්‍රසීලයේ වැඩිම කොවිඩ් මරණ සංඛ්‍යාවක් වාර්තා වූ මාසය වශයෙනි. බ්‍රසීලයේ මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ වසංගත ව්‍යාප්තියේ පාලනය වීමක් පසුගිය කාලයේ පෙන්නුම් කර තිබියදීය. අවදානම අඩු වී ඇති බවක් පෙනී යාමත් සමඟ අවධානය ගිලිහී ගිය බවක් අන් යුරෝපා රටවලදී මෙන්ම බ්‍රසීලයේ ද දැකිය හැකි විය. මේ වන විට එන්නත්කරණයට ලක්ව ඇත්තේ බ්‍රසීල ජනතාවගෙන් 6% ක් පමණි. ජනාධිපති ජොජීස් බොල්සොනාරෝ පවසන්නේ සෑම මරණයක් ගැනම කනගාටුවන බව සහ තුන්වැනි රැල්ලක් නොනඟීවා යැයි ප්‍රාර්ථනා කරන බවය. කෙසේ වුවද සමාජ දුරස්ථභාවය වැනි ක්‍රියාමාර්ගවලට ඔහු විරුද්ධතාවක් දක්වයි.

අමෙරිකාවේ පළමු එන්නත ලබාගත් බහුතරයක් දෙවැනි එන්නත ද ලබාගෙන අවසන්ව ඇතත් 1/12 ක් වැනි සංඛ්‍යාවකට තවමත් දෙවැනි මාත්‍රාව ලැබී නොමැති වීම සැලකිය යුතු කාරණයක් බව විශේෂඥයන්ගේ අදහසය. කොවිඩ් එන්නත්කරණ වැඩසටහන ඉතිහාසයේ දැවැන්තම එවැනි ව්‍යාපෘතිය බවට පත්ව තිබේ. කැලිෆෝනියා සරසවියේ, වසංගත රෝග පිළිබඳ විශේෂඥවරියක වන මොනිකා ගාන්ධි පවසන පරිදි 92% කට එන්නත ලබාදීමට හැකි වීම විශාල ජයග්‍රහණයකි. එන්නත් මාත්‍රා 2 ම ලබාගැනීමෙන් පසු රෝගයට එරෙහිව විශාල ප්‍රතිශක්තියක් ඇති වන බව දැනට සිදුව ඇති පර්යේෂණවලින් පෙනී ගොස් තිබේ. අමෙරිකාවේ වසංගත රෝග ප්‍රධානී වෛද්‍ය ඇන්තනී ෆෝසි ද එන්නතේ මාත්‍රා 2ම ලබාගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. එන්නතේ මාත්‍රා 2 ම ලබාගත් පළමු අමෙරිකානුවන් මිලියන 75 අතරින් පසුව වයිරසය ආසාදනය වී ඇත්තේ 580 කට පමණක් බව හඳුනාගෙන තිබේ. ඇතැම් විට අමතර ආරක්ෂාවක් සැලසීමට තවත් මාත්‍රාවක් ද ලබාදීම සිදුවේ.

දැනට පැහැදිලිව පෙනීයන පරිදි කොවිඩ් - 19 වසංගතය පාලනය කිරීමට හැකි ප්‍රබලම අවිය එන්නත්කරණ වැඩසටහනය. සෑම රටකටම එන්නත් සැපයීමේ අභියෝගය ලෝකය ඉදිරිපිට තිබේ. එම වගකීම බලවත් රටවලට වැඩිය. අමතර තොග රැස්කිරීම වෙනුවට මිය යන මිනිසුන් ජීවත්කරවීම වෙනුවෙන් ඒවා සැපයීමට හැකි නම් වඩා උතුම් බව වටහාගත යුතු වන්නේ ඔවුන්ම බැවිනි.


රෝහල්වල තදබදය, ICU ඇඳන් හිඟවීම, ඔක්සිජන් සැපයීමේ අභියෝගය, එන්නත් හිඟය වැනි කොවිඩ් වසංගතයත් සමඟ පැන නැඟී ඇති ගැටලු ගණනාව විසින්ම ලෝකයට සිතන්නට තවත් කාරණයක් ඉතිරි කර තිබේ. ඒ, එකිනෙකා මරාගැනීම වෙනුවෙන් න්‍යෂ්ටික ආයුධ ඇතුළු අවි ආයුධ තැනීමට අතිවිශාල ධනස්කන්ධයක් ද වැය කරමින් අඟහරු ලෝකයත් තරණය කිරීමට වෑයම් කරන අතර, එය මෙසේ සිදු වෙමින් ඇති බවය.



**ධම්මික සෙනෙවිරත්න**

# මැයි දිනයේ අරමුණ කම්කරු ජනතාවගේ අයිතීන් හා සේවය රැක ගැන්මයි

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා



**මෙවර 135වන මැයි දිනය වෙනුවෙන් කොවිඩ් 19 වසංගතය හමුවේ අපේ රටේ වැඩකරන පන්තිය මුහුණදී තිබෙන අභියෝග රජය ඒ සඳහා හඳුන්වා දී ඇති වැඩපිළිවෙළ පිළිබඳ කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා සමඟ 'දිනමිණ' සිදු කළ සංවාදයකි මේ.**

**1.මෙවර මැයි දිනය සැමරීම කොවිඩ් 19 නිසා අපහසු වෙලා නේද?**

කම්කරු ජනතාවගේ ජයග්‍රාහී දිනය වන මැයි දිනය මෙවර ජනතාවටත්,වෘත්තීය සමිතිවලටත්, දේශපාලන පක්ෂවලටත් කොවඩ්19 හෙවත් නව කොරෝනා වසංගතය නිසා උත්කර්ෂවත් ලෙස සැමරීමට නොහැකිවීම ගැන කනගාටු වෙනවා. මෙම උත්කර්ෂවත් දිනය කම්කරු දිනයේ සංකල්පය උද්දීපනය කරමින් සැමරිය යුතු උත්සවයක්. මෙම කොවිඩ් වසංගතය නිසා සැමරීමට නොහැකි වුණත් රටේ ජීවනාලිය වන කම්කරු ජනතාවගේ සේවාව ඇගයීම සැමරීම හා ඔවුන්ගේ අයිතින් ආරක්ෂා කිරීම මැයි දිනයේදී සිහිපත් කළ යුතුයි. විශේෂයෙන්ම මේ වන විට අපේ රජය පත්වුණායින් පස්සේ කොවිඩ් වසංගතය ඇවිල්ලා රටේ ආර්ථිකයට හා එදිනෙදා කටයුතුවලට විශාලතම බලපෑමක් කළත් ඒ තත්ත්වය තුළත් කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා දීර්ඝ කාලීනව බලපාන පනත් කෙටුම්පත් රාශියක් අපිට සම්මත කරගෙන ඔවුනගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට පුළුවන් වුණා.

**2.නමුත් ඇතැම් වෘත්තීය සමිති හා දේශපාල පක්ෂ කියනවා නේද මැයි දිනය රජයට නවත්වන්න හෝ තහනම් කරන්න බැහැ කියලා?**

අපි කිසිම දිනයක මැයි දිනය තහනම් කරලා නැහැ. හිටපු ජනාධිපතිවරයකු වූ ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පාලන සමයේ මැයි දින තහනම් කළ අවස්ථාවේ විශාල වශයෙන් අරගල අපි දැන් එවැනි කම්කරු අයිතින් පාවාදෙන කටයුතු කරන්නේ නැහැ. ලෝකයේ හා රටේ ඇති වී තිබෙන වසංගත තත්ත්වය හමුවේ වැඩකරන පන්තිය පාරට බස්සලා රටත් ජනතාවත් තව දුරටත් අපහසු තත්ත්වයට පත් නොකිරීමට තිබෙන වගකීම නිසා සෞඛ්‍ය බලධාරීන්ගේ ඉල්ලීම අනුව මැයි පෙළපාළි හා රැස්වීම් පවත්වන්න එපා කියලා ඉල්ලීමක් කෙරුවා පමණයි. රටත් ජනතාවත් අමාරුවේ දමන්න නොහැකි නිසා.

**3.වතු කම්කරුවන්ගේ රුපියල් දහසේ වැඩි වීම ගැන වත්මන් තත්ත්වය කොහොමද?**

මුලින්ම අපිට තිබුණු විශාල අභියෝගය තමයි විශේෂයෙන්ම තේ හා රබර් කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් දහස දක්වා වැඩි කරන්න කියලා විශාල ඉල්ලීමක් තිබුණා ඒ වගේම පසුගිය අයවැය ලේඛනය මගින් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශයක් කර තිබුණා එම වැටුප් වැඩි වීම දෙනවා කියලා. එම වැටුප ලබාදීමේ වගකීම පැවරුණේ කම්කරු ඇමැතිවරයා වශයෙන් මටයි. සාමානයෙන් ඒ වගේ අවස්ථාවකදී අපි මීට පෙර හාම්පුතුන් හා කම්කරුවන් අතර සාමුහික ගිවිසුමකට එළඹීමට මේ ගිවිසුම 2020 වසරේ දෙසැම්බර් 31න් අවසන් වුණා නමුත් එම සාමුහික ගිවිසුම අනුව ඔවුන්ට හිමිවුණේ රුපියල් හත්සීයක පමණ මූලික වැටුපක්. මේ පිළිබඳ සාකච්ඡාවට දොළහක් පමණ මම පවත්වලා එකගත්වයකට ගෙන එන්න බැලුවා හාම්පුතුන් හා වතු වෘත්තීය සමිති. නමුත් එය නොහැකිවුණා. හාම්පුතුන් එම වැටුප් වැඩි කිරීමට කැමැත්තක් දැක්වූයේ නැහැ. ඒ නිසා මම කම්කරු ඇමැතිවරයා වශයෙන් පඩිපාලක සභාව තුළින් ඒ යෝජනාව ගෙනැල්ලා අදාළ ආකාරයට සම්මත කරගෙන මගේ අනුමැතිය දීලා ගැසට් කර තිබෙනවා. ඒ ක්‍රියාව ගැන මම සතුටුවෙනවා. නමුත් වතු සමාගම් ඊට එරෙහිව අභියාචනාධිකරණයට ගිහිල්ලා රිට් ආඥාවක් ඉල්ලා තිබෙනවා. ඒ වගේම මගේ ගැසට් පත්‍රය නවත්වන්නැයි ඉල්ලා තිබුණා. නමුත් අභියාචනාධිකරණය එය අනුමත කර තිබුණේ නැහැ. මේ මාසයේ පටන් වතු කම්කරුවන්ට රුපියල් දහස ලැබෙනවා. කම්කරුවන් වෙත අපි දුන් සුවිශේෂී ජයග්‍රහණයක්. දැන් මේක දෙන්න කියලා විපක්ෂය බොහෝම කෑ ගහනවා නමුත් ඒඅය බලයේ සිටින විට එය කළේ නැත්තේ ඇයිද දන්නේ නැහැ. කම්කරු ජනතාව ලබාගත් ජයග්‍රහණයක්.

**4.කොවඩ්19 තත්ත්වය නිසා අත්සන් කළ ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම හා සේවක අයිතීන් සුරැකීමට ඔබ හඳුන්වා දුන් පනත් පිළිබඳ කතා කළොත්?**

මෙම කොවිඩ් වසංගතය පැමිණි අවස්ථාවේ සිටම විශාල වශයෙන් කම්කරු ජනතාවගේ රැකියා සුරක්ෂිත කිරීමට කම්කරු අමාත්‍යාංශයත් කම්කරු දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා පුළුවන් වුණා. ඒගේම ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම්වලට ඇවිල්ලා කොවිඩ් වසංගත කාලයේදී රැකියාවට පැමිණෙන්නට නොහැකි අයට නිවසේ සිට වැටුපෙන් භාගයක් දීමට ක්‍රමවේදයක් සකස් කළා. ඒ අනුවත් අපිට කම්කරු අයිතීන් දීමට හැකි වුණා. මෙවැනි අවස්ථාවකදි හාම්පුතුන්ට හිමිකමක් තිබෙනවා රැකියාව අවසන් කිරීමේ පනත අනුව කම්කරු දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් ඉදිරිපත් කරලා ඒ පනත යටතේ වන්දියක් ගෙවලා ඉවත් කරන්න. එවැනි අවස්ථාවකදී එදා ඒ සඳහා දුන් වන්දි මුදල වූයේ රුපියල් ලක්ෂ දොළහයි. එය දැන් රුපියල් ලක්ෂ විසිපහ දක්වා වැඩි කිරීමට කටයුතු කළා. තවත් කම්කරුවන්ට ප්‍රතිලාභ ලැබෙන එකක් තමයි කම්කරු වන්දි පනත. විශේෂයෙන්ම කම්කරු වන්දි ආඥාපනත. එහිදි සේවකයින් සේවය කරන අවස්ථාවකදී අනතුරක් සිදු වුව හොත් ඔහුට වන්දියක් හිමිවිය යුතුයි. ඒ වන්දි මුදල රුපියල් ලක්ෂ විස්ස දක්වා වැඩි කළා. එමෙන්ම සේවක අවම වැටුප අපි රුපියල් දොළොස් දහස් පන්සියය දක්වාත් වැඩි කරන්න ක්‍රියා කළා.

විශේෂයෙන් සේවක අර්ථසාධක අරමුදල ගත්තාම අපි මතක් කරන්න ඕනේ ටී. බී.ඉලංග-



**කොවිඩ් 19 නිසා අසාධාරණ ලෙස සේවකයින් දොට්ට දමන්න බැහැ. නමුත් සේවකයින් සමග එකඟත්වයෙන් සේවය අවසන් කරන එක එහෙම නැත්නම් සේවය අවසන් කිරීමේ පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුවෙන් අවසර ගත යුතු වෙනවා. එහිදි අපි වෘත්තීය සමිති සේවකයින් කැඳවලා අපි නීත්‍යනුකූල විසඳුමකට එනවා**

රත්න මැතිතුමා, සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය යන නායකයින් ඒ සමග මෙම අරමුදල හැදුවා. එම අරමුදල් ගෙවන්නේ නැති හාම්පුතුන්ට එරෙහිව නඩු දමනවා. නමුත් අපේ අධිකරණ පද්ධතියේ තිබෙන තදබදය නිසා නඩු බොහෝම කල් යනවා. එක් නඩු දිනයක සිට තවත් නඩු දිනයකට මාස හයක් විතර යනවා. ඒ නිසා මම කැබිනට් මණ්ඩලයේ අවසර ඇතිව නීතියක් සකස් කරගෙන තිබෙනවා. සමගාමි අධිකරණ බලයක් විශේෂයෙන්ම කම්කරු විනිශ්චය සභාවලට දෙන්න.එම විනිශ්චය සභාවල නඩු කල් යන්නේ නැහැ. ඒවාට එන නඩු ප්‍රමාණ අඩුයි. එසේ කළොත් අපිට පුළුවන් වෙනවා ඉක්මනට නඩු විසඳා සේවකයින්ට මුදල් දෙන්න. අපි අන්තර්ජාතික නීතිරීතිවලට අනුකූලව අවුරුදු දහසයට අඩු දරුවන් සේවයේ යෙදවීමට නොහැකි වන ලෙස නීතිරීති සකස් කිරීම. ඒවගේම අවුරුදු දහ අටට අඩු ළමයි අන්තරාදායක රැකියාවල සේවයේ යෙදවීමට නොහැකිවන ලෙසට නීතිරීති සකස් කිරීම.

ඒ වගේම අපේ රටේ විශාල සේවක පිරිසක් ඉන්දියාව, බංග්ලාදේශය ඇතුළු රටවල සේවය කරනවා. විශේෂයෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රයේ මේ ආකාරයට දහස් ගණනක් සේවය කරමින් සිටිනවා. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් බැර වෙන්නේ ඒ රටවල අරමුදල්වලටයි. ඒ නිසා අපි ඒ රටවල් සමඟ සාකච්ඡා කරලා දැන් අපි පනතක් හදලා තියෙනවා එකගත්වයකට ඇවිල්ලා එය පාර්ලිමේන්තුවේ අනුමැතිය ගෙන තිබෙනවා. එහිදි අපි මේ සේවකයෝ කොයි රටේ සේවය කළත් ලංකාවේ සේවක අර්ථසාධක අරමුදලට බැර කරන්න ගිවිසුම් ගත වෙලා සිටිනවා. ඒ කටයුතුත් ඉක්මනින් කෙරිලා තිබෙනවා.

පෞද්ගලික අංශයේ සේවකයින්ගේ යම් යම් හේතු මත වැඩ තහනම් කෙරෙනවා.එසේ සිදුවෙලා මාස ගණන් එම පරීක්ෂණ සිදු වෙන්නේ නැතිව තිබෙනවා. මේ පිළිබඳ නීතියක් නැහැ. ඒ අනුව පෞද්ගලික අංශයේ විනය නියෝග මාස හයක් තුළ දිය යුතුයි කියලා නීති සම්පාදනය කරන්න හැකි වුණා. ඒ වගේම පෞද්ගලික අංශයේ අවම විශ්‍රාම වයස හැට දක්වා වැඩි කළා. මෙය අර්ධ රාජ්‍ය සේවකයින්වත් ඇතුළත් වන ලෙස තමයි නීති සම්පාදනය කෙරෙන්නේ. ඒ වගේම හුගාක් හාම් පුතුන් සේවයින් බඳවාගෙන වසරක් දෙකක් කල්ගත වුණාට පස්සේ තමයි අර්ථසාධක අරමුදල් ගෙවන්න පෙලඹෙන්නේ. නමුත් දැන් අපි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කරන්න යනවා යම් සේවකයකු සේවයට බඳවාගෙන දින තිහක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීම සඳහා.

**5.මාධ්‍යවේදීන් සඳහා සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම හා පඩිපාලක සභාවක් හඳුන්වාදීමට- ක්‍රියා කළා නේද?**

සේවක අර්ථසාධක අරමුදල් ගැන කතා කරනවිට මාධ්‍යවේදීන් ගැනත් කියන්න ඕනේ විශේෂයෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට අර්ථසාධක අරමුදල් වැනි ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. ඒ සඳහා පඩිපාලක සභාවක් පත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කරගෙන යනවා. එමෙන්ම මාධ්‍ය ආයතන ඇතුළත සේවය කරන මාධ්‍ය වේදීනුත් ආවරණය වන පරිදි එම පඩිපාලක සභාව සකස් කිරීමයි අපේ බලාපොරොත්තුව. මේ ගැන සාකච්ඡා කිරීමට මාධ්‍ය ආයතනය හිමිකරුවන් හා මාධ්‍යවේදීන් කැඳවා පුළුල් සාකච්ඡාවක් කරන්න බලාපොරොත්තු වෙනවා. කොවිඩ් වසංගතය නිසා එය ටිකක් ප්‍රමාද වුණා.

**6.කාන්තා සේවිකාවන් සඳහාත් විශේෂ පනතක් හඳුන්වා දුන්නා නේද?**

වැඩබිම්වල කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය හා ඔවුන්ගේ ගෞරවය සුරකෙන පරිදි රැකියාවන් කිරීමේ පසුබිමක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සම්මත කරගන්නා ලද අංක 190 දරන වැඩ ලොව තුළ ප්‍රචණ්ඩත්වය හා හිංසනය තුරන් කිරීම සම්බන්ධ සම්මුතිය පිළිගනිමින් නීති සම්පාදනය සඳහා දැනටමත් කටයුතු කරගෙන යනවා. මේ සියලු කටයුතු කළේ දේශීය වශයෙන් වැඩකරන පන්තියේ සුබසිද්ධිය හා අවශ්‍යතා සඳහායි. එමෙන්ම ලංකා ට්‍රැක්ටර් සමාගම වසා දැමීම හේතුවෙන් එකසිය විසි දෙනකුට රැකියා අහිමි වෙලා තිබෙනවා. වසර දහ අටක් තිස්සේ එම සේවකයින්ට වන්දි ලැබිලා තිබුණේ නැහැ. අපි එම සේවකයින්ගේ වන්දි මුදල් ලබාදීමට කටයුතු කළා.

**7. විදේශ රටවලට ගොස් නොයෙකුත් බාධක මැද සේවය කරන සේවකයින් සඳහා ගෙන ඇති යහපත් පියවර කෙසේද?**

විදේශ රටවල සේවය කරන අපේ ශ්‍රී ලාංකික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඒ අය කොවිඩ් වසංගතයට මුහුණ දුන් අවස්ථාවේදී ඔවුන් ලංකාවට ගෙන්වා ගැනීමට විශාල සේවාවක් මාගේ අමාත්‍යාංශයටත් විදේශ සේවා නියුක්ති කාර්යාංශයටත් මම නියෝග කළා එම ආයතනවල වියදමින් විදෙස් සිට තම මව්රටට එන සේවකයින්ට නිරෝධායනය වීම සඳහා හෝටල් පහසුකම් දෙන්න කටයුතු කරන්න කියලා. ඒ අනුව හෝටල් කාමර හයසිය හතළිස් අටක් සොයාගෙන කණ්ඩායම් දෙකක් ගෙන්වලා නිරෝධායන කටයුතු කරගෙන යනවා. ඉතිරි අයවත් නිරෝධායන පහසුකම් ඇති කරලා ලංකාවට ගෙන ඒමට කටයුතු කරනවා. එමෙන්ම විදෙස් රැකියා සඳහා යන සේවක සේවිකාවන් සූරාකෑමට හා හිංසනයට ලක් නොවීමට අවශ්‍ය නීතිරීති මාලාවක් අපි දැන් සකස් කරගෙන යනවා. මේ අය පිටරට යැවීමේදී ජාවාරම්කරුවන් විසින් කරන අක්‍රමිකතා පිළිබඳ පසුගියදා ජනමාධ්‍යවල පවා පළ වුණා. ඒ පිළිබඳ මම විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් විශේෂ වාර්තාවක් කැඳවලා තිබෙනවා. ගුවන්තොටුපොළේදී ඔවුන් විවිධ අයතා ක්‍රම මඟින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි කරන්නේ නැතිව අනියම් මාර්ගයෙන් යැවීම වැළැක්වීම සඳහා අවශ්‍ය අවංක නිලධාරීන් ඊට පත් කරලා යවන්න. මම නියෝග දී තිබෙනවා. අපේ කාර්යංශයේ ලියාපදිංචි යන අයකුට දැනට ලැබෙන්නේ රුපියල් ලක්ෂ පහක රක්ෂණයක් පමණි. විශේෂයෙන් මැදපෙරදිග යන කාන්තාවන්ට හා පිරිමින්ට රුපියල් ලක්ෂ තිහයක ඩොලර් පහළොස් දහසක අනිවාර්ය රක්ෂණයක් හාම්පුතා දිය යුතුයි. ඒ අයගේ මරණයකදී, අසනීපයකදී කොවිඩ් වසංගතය වගේ හදිසි අවස්ථාවකදී ලංකාවට එන්න සිදු වුණොත් ඒ වගේ අවස්ථාවකදී ආරක්ෂණ දැලක් ලෙස මෙම රක්ෂණය ලබා දීම අනිවාර්ය කරන අවශ්‍ය නීතිරීති රෙගුලාසි ගෙන ඒමට කටයුතු කරනවා. එමෙන්ම බොහෝ කාලයක් සාකච්ඡා කළ එකක් තමයි විදේශ රැකියාවලට යන අයට සමාජ ආරක්ෂණ ක්‍රමයක් එනම් විශ්‍රාම වැටුපක් දෙන ක්‍රමවේදයක් ඒ ගැන කමිටු පත් කරලා කටයුතු කරමින් සිටිනවා.

**7.පෞද්ගලික අංශයටත් අර්ධ රාජ්‍ය අංශයටත් විශ්‍රාම වැටුපක් හඳුන්වාදීම ගැන අවධානය යොමු වී තිබෙනවා නේද?**

පෞද්ගලික අංශයේ අර්ධ රාජ්‍ය අංශයේ අයටත් විශ්‍රාම වැටුපක් සකස් කිරීම සඳහා සමාජ අරමුදලක් සකස් කිරීමේ වැඩපිළිවෙළක් ගැන අපි කටයුතු කරමින් සිටිනවා. කොවිඩ් වසංගතය වැනි ආපදාවකදී ඒ අයට රැකවරණය දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට.

ඉදිරියේදී කම්කරු විනිශ්චය සභා ඉදිරියේදී දැනට නීතිඥයින් පෙනී සිටින්න ඕනේ. ඒ තත්ත්වය වෙනස් කොට වෘත්තීය සමිති නියෝජිතයින්ට පෙනිසිටීම සඳහා අවකාශ ලබාදෙන වැඩපිළිවෙළකුත් සකස් කරගෙන යනවා.

**8. කොවිඩ් 19 ආශිර්වාදයක් කරගෙන සේවකයින්ට විවිධ අසාධාරණකම් කරන්න හාම්පුතුන් ක්‍රියා කරනවා නේද? ඒ ගැන සොයාබැලීමක් සිදු වෙනවාද?**

කොවිඩ් 19 නිසා අසාධාරණ ලෙස සේවකයින් දොට්ට දමන්න බැහැ. නමුත් සේවකයින් සමග එකගත්වයෙන් සේවය අවසන් කරන එක එහෙම නැත්නම් සේවය අවසන් කිරීමේ පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුවෙන් අවසර ගත යුතු වෙනවා. එහිදි අපි වෘත්තීය සමිති සේවකයින් කැඳවලා අපි නීත්‍යානුකූල විසඳුමකට එනවා සොයා බලනවා මේ අයට සිටින සේවක සංඛ්‍යාවත් සමග මේ ආයතනය ගෙන යන්න නොහැකිද කියලා. සේවකයින් අස්කරන්න නිකම්ම අපි අවසර දෙන්නේ නැහැ. එහිදි ආදායම් පෙර ලැබුණු ආදායම් ලැබෙන ඇණවුම් මේ සියල්ල සම්පූර්ණ පැහැදිලි නිරීක්ෂණයකට ලක් කරනවා. ඒවා සොයා බලා තමයි සේවකයින්ගේ සේවය අවසන් කරන්න පුළුවන්ද කියලා කම්කරු කොමසාරිස් අවසරය දෙන්නේ. එසේ සේවකයින්ගේ සේවය අවසන් කරන්න යනවා නම් අපේ නව වන්දි සූත්‍රය අනුව රුපියල් ලක්ෂ විසිපහේ වන්දිය අනුව තමයි සේවය අවසන් කරන්න බලාපොරොත්තු වන්නේ. දැනට එවැනි ඉල්ලීම් දෙසීයක් පමණ ඇවිල්ලා තිබෙනවා. කියන තරම් විශාල ප්‍රමාණයක් ඇවිල්ලත් නැහැ.

ඒ වගේම මම කම්කරු කොමසාරිස්ට උපදෙස් දුන්නා කොවිඩ්19 නිසා රැකියා අහිමි වූ සේවකයින්ගේ තොරතුරු සොයාගන්න කියලා. අපි සියලුම ජනමාධ්‍යවල දැන්වීම් පළ කරලා තොරතුරු එවන්න කියා ඉල්ලීමක් කළා. එහිදි අපිට වාර්තා වෙලා තිබෙන්නේ දොළොස් දහසක් රැකියා අහිමි වුණා කියලා. අපි බලාපොරොත්තු වුණු තරම් විශාල ප්‍රමාණයක් ලැබුණේ නැහැ. අනෙක මෙම වසංගතය නිසා සේවකයින්ට අසාධාරණයක් වෙනවා නම් අපිට දැනුම් දෙන්න පුළුවන්.

සටහන - අනුර ප්‍රේමලාල්




## පීඩාකාරී කොවිඩ් තුර්කියත් ගිල ගනී

කොරෝනා වසංගතයෙන් රටවල් රාශියක් මේ වනවිට විපතට පත්ව ඇත. එසේ විපතට පත් රටවල් අතර ඉන්දියාව ඉදිරියෙන්ම සිටී. සිය රටේ කොරෝනා වසංගත තත්ත්වය පසුගිය වසරේදී සාර්ථකව මර්දනය කරගත් නමුත් තුර්කියත් මේ අවස්ථාවේදී විපතට පත්ව ඇත. පසුගිය වසරේදී වසා නොදැමූ තුර්කිය මෙවර වසා දමන්නට එරට බලධාරීහු පසුගිය දා පියවර ගත්හ. ඒ අනුව ලබන මස 17 වන දා දක්වා තුර්කිය වසා දමා තැබෙනු ඇත.

වාර්තාවන්හි සඳහන් වන ආකාරයට තුර්කියේ ආසාදිතයන් සංඛ්‍යාව පසුගිය බදාදා කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබිණ. එදින එරටින් නව ආසාදිතයන් 40 444කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා විණ. දිනකට එහි මියයන ආසාදිතයන් සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇත. සාමාන්‍යයෙන් දිනකට 350කට ආසන්න ආසාදිතයන් සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් වන බව සඳහන් වේ. පවත්නා තත්ත්වය සම්බන්ධයෙන් අදහස් පළ කරමින් තුර්කි ජනාධිපති රෙසෙප් ටයීප් එර්ඩොගන් රූපවාහිනියෙන් ජාතිය අමතමින් සඳහන් කළේ මෙවැන්නකි.

"...දිනකට වාර්තා වන කොරෝනා ආසාදිතයන් 5000කට වඩා අඩු කරන්න අපි ඉක්මනින්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ.... එවැනි තත්ත්වයක් ඇති වෙන්න නම් ජනතාව නිවෙස් තුළටම වී සිටිය යුතුයි. බැහැරට යා යුත්තේ අවශ්‍යම දෙයකට පමණයි. අවශ්‍යම දේ හැරුණුවිට අනෙක් දේ අලෙවි කරන වෙළෙඳසැල් වසා දමන්න ඕනෑ...."

ඉස්ලාමීය බැතිමතුන් බහුතරයක් වසන තුර්කියට ඔවුන්ගේ ආගමික උත්සවයක් වන රාමසාන් උත්සවය ඉතාමත් තීරණාත්මක කාලයක් වනු ඇත. රාමසාන් උත්සවය මැයි මස මැද භාගයේදී අවසන් වෙයි. එම උත්සව සමයේදී ජනයාගේ ගමන් බිමන් වැඩිවනු නිසැකය. කොරෝනා වයිරස ව්‍යාප්තිය, උත්සව සමයේදී වැඩි වන්නට බෙහෙවින්ම ඉඩ ඇත. එමඟින් කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාවත්, කොරෝනා මරණ සංඛ්‍යාවත් වැඩි කෙරේ. ඒ අනුව කල් ඇතිව රට වසා දැමීම නුවණට හුරුයැයි තුර්කි බලධාරීන් තීරණය කර ඇත. රට වසා දැමීමෙන් ජනයාගේ සංචරණයන් සීමා වේ. උත්සව සමයේදී බඩු බාහිරාදිය මිලදී ගැනීමට සුපිරි වෙළෙඳසැල්වල සහ මහා මාර්ගවල ජනයා ඒකරාශි වීමක් ද සිදු නොවේ.

තුර්කියේ ඇන්කාරා අගනුවර තත්ත්වය යහපත් බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි. ඇන්කාරා නගරයෙන් තවමත් වාර්තා වන්නේ අඩුම මරණ සංඛ්‍යාවකි. එසේ වුවත් ඊයේ දිනය වනවිට එරට සිදුව ඇති මුළු කොරෝනා මරණ සංඛ්‍යාව 39 000ක් දක්වා ඉහළ ගොස් තිබිණ. තුර්කියෙහි සෞඛ්‍ය සේවාව සාමාන්‍යයෙන් ඉතා යහපත් මට්ටමක පවතී. එහෙත් ආසාදිතයන් සංඛ්‍යාව වැඩි වන්නට පටන් ගත හොත් තත්ත්වය වඩාත් භයානක අතට හැරෙනු ඇති බව තුර්කි සෞඛ්‍ය බලධාරීන්ගේ නිගමනයයි. දෙවන කොරෝනා රැල්ල ආරම්භ වත්ම තුර්කිය සංචරණ සීමා ආදිය පනවමින් එම තත්ත්වය ඉතා සාර්ථකව පාලනය කරගත්තේය. එවක දිනකට වාර්තා වූයේ කොරෝනා ආසාදිතයන් 6000කට ආසන්න සංඛ්‍යාවකි. හිටි අඩියේම වාගේ කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව වැඩි වන්නට පටන් ගත්තේ පසුගිය මාර්තු මාසයේදී සංචරණ සීමා ආදිය ලිහිල් කිරීම නිසා බව එරට බලධාරීහු පෙන්වා දෙති. කොරෝනා ආසාදිතයන් ගණන වැඩි වන්නට පටන් ගනිත්ම තුර්කි රජය එරට ජනයාට අදියරයෙන් අදියරය සංචරණ සීමා පැනවීමට පටන් ගත්තේය. එමඟින් යම් පාලනයක් ඇති වුව ද එම පාලනය පමණක් ප්‍රමාණවත් නොවන නිසා රට වසා දැමීමට පියවර ගත් බව බලධාරීහු පවසති.

තම රටට බලපා ඇති වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන කොරෝනා එන්නත දීම ද තුර්කි බලධාරීහු පසුගිය ජනවාරියේදී කඩිනම් කළහ. මිලියන 13.55කට කොරෝනා එන්නතෙහි පළමු මාත්‍රාව දී ඇත. චීනයේ නිෂ්පාදිත "සිනොවැක් කොරෝනාවැක්" එන්නතෙන් මාත්‍රා මිලියන 100ක් තුර්කිය චීනයෙන් ඇණවුම් කර තිබේ.

එසේ වුවත් තුර්කියේ කොරෝනා එන්නත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් නැති බවට ලෝක සෞඛ්‍ය බලධාරීන්ගෙන් චෝදනා එල්ල වේ. එවැනි පරිසරයක් පවතින අවස්ථාවකදී රජය පසුගිය මාර්තුවේදී සංචරණ සීමාවන් ද ඉවත් කළේයැයි තුර්කි බලධාරීන්ට දෝෂාරෝපණ එල්ලවෙමින් පවතී. එනිසා නොවිය යුත්තක් තුර්කි බලධාරීන් අතින් සිදුව ඇත.

මේ අවස්ථාවේදී රට වසා දැමීමට තුර්කි බලධාරීන් ගත් තීරණය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනයාගෙන් බහුතරය කැමැත්ත පළ කරති. කොරෝනා ව්‍යාප්තියේ වේගය පාලනය කර ගැනීමට රට වසා දැමීම යම් ප්‍රමාණයකින් උපකාරී වන බව සත්‍යයකි. එසේ වුවත් තම රටේ කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීමට ස්ථිර විසඳුමක් තිබිය යුතු බව එරට ජනයා අවධාරණය කරන්නෝය. ඒ සඳහා විද්‍යාත්මක සහ එකම වැඩසටහන එන්නත්කරණ වැඩපිළිවෙළ මිස අනෙකක් නොවන බව ද ඔවුහු පෙන්වා දෙති.

මංජුලා විජයරත්න

# බදියුදීන් 4-5 දිනවල පාර්ලිමේන්තු එවන්න

## වේත්‍රධාරී CIDයට ලියයි

**ස්වර්ණා විජේකෝන්**

අත්අඩංගුවට ගෙන රඳවා ගෙන ප්‍රශ්න කරන වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා ඉල්ලීමක් කළ හොත් ඒ මහතාට පාර්ලිමේන්තු රැස්වීම් සඳහා සහභාගිවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ලිඛිතව දන්වා ඇත.

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ උපදෙස් පරිදි මේ දැනුම් දීම කර තිබේ. මේ මස 4 සහ 5 යන දිනයන්හිදී පෙරවරු 10.00 සිට පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීමට තීරණය කර ඇති බැවින් පෙරවරු 9.30 වන විට මන්ත්‍රීවරයාව පාර්ලිමේන්තුවට කැටුව ඒමට කටයුතු කරන ලෙසද දන්වා තිබේ.

එමෙන්ම කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතු කොට ගෙන සෞඛ්‍ය බලධාරීන් විසින් දී ඇති උපදෙස් හා නිර්දේශ අනුව බදියුදීන් මහතාව පාර්ලිමේන්තුවට රැගෙන ආ යුතු බවද ප්‍රනාන්දු මහතා විසින් වැඩි දුරටත් දන්වා ඇත.

# බොරු චෝදනාවලට හිරේ ගිය බුද්ධි අංශ සාමාජිකයන් නිදහස් කරනවා

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

යහපාලන ආණ්ඩුව විසින් අභූත චෝදනා එල්ල කරමින් සිරගත කර සිටින හමුදා සහ පොලිස් බුද්ධි අංශ සාමාජිකයන් කඩිනමින් නිදහස් කිරීමට අවශ්‍ය නීතිමය පියවර ගන්නා බව ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතා දිනමිණට ඊයේ (30) පැවසීය.

වැරදි කර ඇති බවට තහවුරු වී ඇති බුද්ධි අංශ නිලධාරීන්ට නීතිය අකුරට ක්‍රියාත්මක කළ යුතු බවත් වැරදි නොකර බොරු චෝදනා මත අත්අඩංගුවේ පසු වන සහ සිරගත කර සිටින බුද්ධි අංශ සාමාජිකයන්ට සාධාරණයක් ඉටු කිරීම හිටපු හමුදා නිලධාරියකු වශයෙන් තමාගේ වගකීම බවත් හෙතෙම අවධාරණය කළේය.

රට වෙනුවෙන් අනන්තවත් කැප කිරීම් කළ හමුදා බුද්ධි අංශ නිලධාරීන් රකිනවා වෙනුවට ඉකුත් ආණ්ඩුව ඔවුන්ව සිරගත කරනු ලැබූ බවත් වර්තමාන ආණ්ඩුව විසින් මේ වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බවත් පෙන්වා දුන්නේය.



# සියලු උත්සව සති 2ක් තහනම්

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

විවාහ මංගල උත්සව සහ සියලු මහජන ඒකරාශි වීම්, උත්සව ලබන සතියේ සිට ක්‍රියාත්මක වන පරිදි සති 2කට තහනම් කළ බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා දිනමිණට ඊයේ (30) පැවසීය. දැනට රටේ පවතින කොවිඩ් වසංගතය වේගයෙන් පැතිර යෑමක් දක්නට හැකි බවත් එය අවම කිරීම සඳහා මේ තීරණය ගත් බවත් හෙතෙම අවධාරණය කළේය.

# ටී.බී. පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම අද

දිවංගත ටී.බී. ඉලංගරත්න මැතිතුමාගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම වෘත්තීය සමිති නායකයන් විසින් අද (01) පෙරවරු 8.30ට කොළඹ පෙරහර මාවත පිහිටි ඉලංගරත්න පිළිරුව අසලදී සිදු කෙරේ.

රටේ මැයි දිනය නිවාඩු දිනයක් කළ, අර්ථ සාධක අරමුදල, මහජන බැංකුව බිහි කළ තෙල් සංස්ථාව සහ රක්ෂණ සංස්ථාව ජනසතු කළ දිවංගත ඉලංගරත්න මැතිතුමා සැමරීමේ උත්සවය රට තුළ පවතින කොවිඩ් වසංගතය නිසා මෙවර ඉතා චාම්ව පවත්වන බව ටී. බී. ඉලංගරත්න සහෘද සංසදයේ ලේකම් රේණුක පෙරේරා මහතා පැවසීය.

# හරීන් ජූලි 14 තෙක් අත්අඩංගුවට ගන්නේ නෑ

## නීතිපති එකඟ වෙයි

**නෙල්කා මැදගෙදර**

පාස්කු ඉරු දින ප්‍රහාර සිද්ධිය පිළිබඳ සිය පියා දැනුම්වත්ව සිටි බවට මාධ්‍යයට ප්‍රකාශයක් කළ සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා ලබන ජූලි මස 14 වැනිදා තෙක් අත්අඩංගුවට ගැනීමක් නොකරන බව නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඊයේ (30) එකඟත්වය පළ කළේය.

එම ප්‍රකාශය සම්බන්ධයෙන් මේ වන විට විමර්ශන කටයුතු කරමින් පවතින අතර, තමාගේ උපදෙස් ගැනීමකින් තොරව හරීන් ප්‍රනාන්දු මහතා අත්අඩංගුවට නොගන්නා ලෙස නීතිපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දැනුම් දී තිබෙන බවද ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දුන්නේය.

තමා අත්අඩංගුවට ගැනීම වළක්වන ලෙස ඉල්ලා පාර්ලිමේන්තු හරීන් ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම ඊයේ (30) කැඳවූ අවස්ථාවේ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් ප්‍රියන්ත නාවාන මහතා මේ බව සඳහන් කළේය.

එස්. තුරෙයිරාජා, කුමුදුනී වික්‍රමසිංහ, මහින්ද සමයවර්ධන යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි.

එහිදී පෙත්සම්කරු අත්අඩංගුවට නොගැනීමට නීතිපතිවරයා එකඟත්වය පළ කිරීම නිසා පෙත්සම ඉවත් කර ගන්නේද යන්න පිළිබඳ විනිසුරු මඩුල්ල ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රොමේෂ් ද සිල්වා මහතාගෙන් විමසීමක් කළේය.

අත්අඩංගුවට ගැනීම මෙන්ම රඳවා ගැනීම සම්බන්ධයෙන්ද නියෝග ඉල්ලා මේ පෙත්සම ඉදිරිපත් කර ඇති නිසා එම කරුණු දෙකම නොවිය යුතු බව ඒ මහතා සඳහන් කළේය. කෙසේ වුවද මේ අවස්ථාවේදී පෙත්සම ඉවත් කර නොගන්නා බව ඔහු සඳහන් කළේය.

ඒ අනුව පෙත්සම ජූලි මස 14වැනිදා සලකා බැලීමට අධිකරණය තීරණය කළේය.

# බදියුදීන් අත්අඩංගුවට ගැනීම අසාධාරණයි

## පා.ම. රාජිත සේනාරත්න

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයා අත්අඩංගුවට ගත් ආකාරය සාධාරණ නැතැයි පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා ඊයේ (30) පැවසීය.

හෙතෙම මේ බව පැවසුවේ රිෂාඩ් බදියුදීන් මහතා නිදහස් කරන්නැයි බල කරමින් කොළඹ දවටගහ පල්ලිය අසලදී ඊයේ (30) පැවති උද්ඝෝෂණයට එක් වෙමිනි.

එම අත්අඩංගුවට ගැනීම රිෂාඩ් බදියුදීන් මහතාගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයේ සිටින, මුස්ලිම් ජනතා නායකයෙක් වන බදියුදීන් මහතාගේ අත්අඩංගුවට ගැනීම මඟින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සැක සංකා මතු කරන බවත් හෙතෙම කීවේය.

# රාසික් සහරාන්ගෙ සොහොයුරාට පුපුරන ද්‍රව්‍ය දීලා

## විමර්ශනවලින් අනාවරණය වෙයි

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ රක්ෂණ ශ්‍රියන්ත**

පාස්කු දා ප්‍රහාර සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ සිටින රාසික් රාසා නමැත්තා සහරාන් හෂීම්ගේ සොහොයුරාට 2018 වසරේදී යම් පිපිරීමක් අත්හදා බැලීම සඳහා පුපුරන ද්‍රව්‍ය දුන් බව පොලිසිය විසින් හෙළි කර ගෙන තිබේ.

මොහු විසින් පුපුරන ද්‍රව්‍ය සැඟවීමටද උදව් කර ඇති බවත් ත්‍රස්තවාදී ක්‍රියාවලට සෘජුවම සම්බන්ධ වී ඇති බවත් අනාවරණය වූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය මඟින් කළ විමර්ශනයකින් අනතුරුව මේ තොරතුරු හෙළි වූ බවද හෙතෙම අවධාරණය කළේය.

රාසික් රාසා නමැත්තා කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචි 28 හැවිරිදි පුද්ගලයෙකි. කල්මුණේ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන සිටි රාසික් රාසා නමැත්තා අධිකරණ නියෝගය මත අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවාගෙන සිටින අතර, ඔහුගෙන් තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට පොලිසිය සමත් වී ඇත.

පෙරේදා (29) දිනයේදී ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් අධිකරණයෙන් කළ ඉල්ලීමක් මත අදාළ සැකකරු නැවත රඳවා ගෙන ප්‍රශ්න කිරීම සඳහා ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් භාරයට ගෙන තිබේ.

2018 වසරේ වූ බවට පැවසෙන පිපිරීමෙන් තුවාල ලබා සිටි මොහොමඩ් රිල්වාන් යන පුද්ගලයා පාස්කු ප්‍රහාරයෙන් පසු කල්මුණේ සයින්දමර්දු ප්‍රදේශයේ නිවෙසක කර ගත් පිපිරවීමෙන් ජීවිතක්ෂයට පත් වූ බව පොලිස් පරීක්ෂණවලින් හෙළි විය.

මේ වන විට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පුද්ගලයන් 400කට ආසන්න පිරිසක් අත්අඩංගුවට ගෙන පරීක්ෂණ කර ගෙන යන බවත් සිද්ධියට අදාළ සැකකරුවන් සියලු දෙනා නීතියේ රැහැනට හසු කර ගන්නා බව ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න මහතා දිනමිණට ඊයේ (30) පැවසීය.

# කෝටි 32ක රත්රන් කටුනායකදී අත්අඩංගුවට

**සුභාෂිණී සේනානායක සහ කටුනායක ටී.කේ.ජී. කපිල**

රුපියල් තිස් එක් කෝටි හැත්තෑ ලක්ෂයක් (රුපියල් මිලියන 317 ක් ) වටිනාකමකින් යුත් කිලෝග්රෑම් 26ක් බර, රත්රන් තොගයක් කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළෙන් පිට කර ගෙන යෑමට සූදානම් වී සිටියදී රේගු මත්ද්‍රව්‍ය පාලන අංශයේ නිලධාරීන් පිරිසක් විසින් ඊයේ (30) උදෑසන අත්අඩංගුවට ගෙන තිබේ.

මේ අත්අඩංගුවට ගැනීම කටුනායක ගුවන් තොටුපොළ රේගු ඉතිහාසයේ මෙතෙක් කර ඇති වැඩිම වටිනාකම සහිත රේගු වැටලීම බව රේගු මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු) සුදත්ත සිල්වා මහතා දිනමිණට පැවසීය. රේගු මත්ද්‍රව්‍ය පාලන අංශයේ නිලධාරීන් පිරිසක් දීර්ඝ කාලයක් ආවේක්ෂණ රාජකාරිවල නියැළී සිටීමෙන් පසු මේ අත්අඩංගුවට ගැනීම කර තිබේ.

**බත්තරමුල්ල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත මහතා අභාවප්‍රාප්ත විය**



බත්තරමුල්ල ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත

**ඈනස්ලි රූපසිංහ මහතා**

2021.04.30 වන දින අභාවප්‍රාප්ත විය.

ඒ පිළිබඳ අවසන් කටයුතු පසුව දැනුම් දෙනු ලැබේ.

අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්.

# "ඔබට නිවන් සුව"

උපත 1962 12 31



විපත 2021 04 29

**එච්. ඩී. ජේ. රණසිංහ මහතා**

සොයුරු, ඔබ අපගේ සාර්ථකත්වයේ කොටස්කරුවෙක් විය. ඔබගේ හදිසි වියෝව අප කම්පා කරවිය.

අප ඔබගේ පවුලේ සාමාජිකයන් සමඟ සංවේගය බෙදා ගන්නෙමු.

ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ

කටුනායක.

01 වැනි පිටුවෙන්...

## කොතලාවල ආරක්ෂක...

ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ (KDU) දැඩි සත්කාර ඒකක තුනක් කොවිඩ් රෝගීන්ගේ දැඩි සත්කාරක සේවා සඳහා වෙන් කිරීමටත්, මේ ඒකක තුළ ICU ඇඳන් 24ක් සහ High Dependency Beds (HDU) ඇඳන් 12ක් ස්ථාපිත කර Hi-flow ඔක්සිජන් ඇතුළු සියලු පහසුකම් දීමටත් පියවර ගෙන ඇති බව ඇමැතිවරිය පෙන්වා දුන්නාය. මේ කටයුතු සොයා බැලීම සඳහා සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පෙරේදා (29) රාත්‍රියේ ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ විශේෂ නිරීක්ෂණ චාරිකාවකද නිරත වූවාය.

නිරීක්ෂණ චාරිකාවෙන් පසු පැවති විශේෂ සාකච්ඡාවේදී මේ දැඩි සත්කාර ඒකකය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන වෛද්‍යවරු 30ක්, හෙදියන් 80ක්, කනිෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් 25ක් කඩිනමින් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය ලේකම්වරයාට සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෞඛ්‍ය ඇමැතිවරිය උපදෙස් දුන්නාය.

## කොවිඩ් පාලනයට...

කොවිඩ් - 19 පරීක්ෂණ ධාරිතාව ඉහළ නැංවීම හා අහඹු නියැදි පරීක්ෂණ කිරීමේ ක්‍රියාවලිය ඒකාකාරීව පවත්වාගෙන යෑම තුළින් රෝගීගේ ආවේෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ එමඟින් රෝගීන්, රෝගී පොකුරු සහ ස්පර්ශකයන් හමු වන ආකාරය අනුව ප්‍රාදේශීය සංචරණ සීමා ප්‍රමාදයකින් තොරව පැනවීම, ප්‍රාදේශීය සංචරණ සීමා පැනවීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ සන්නිවේදනය කරන කාර්යක්ෂම යන්ත්‍රණයක් ඇති කිරීම මඟින් රෝග ව්‍යාප්තිය පාලනය කිරීම, සුවය ලැබූ රෝගීන් රෝහලෙන් පිටත් කිරීම සඳහා ඇති මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම, ප්‍රතිකාර මධ්‍යස්ථානවල ඇඳන් ප්‍රමාණය, දැඩි සත්කාර ඒකකවල ඇඳන් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා කෙටි හා දිගු කාලීන පිළියම් හඳුනා ගැනීම, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අවශ්‍ය පෞද්ගලික ආරක්ෂණ උපකරණ සහ ප්‍රමාණවත් ඔක්සිජන් ගබඩා තහවුරු කිරීම සහ කාර්යක්ෂමව බෙදා හැරීමේ යන්ත්‍රණයක් තහවුරු කිරීම යනාදි කාරණා 10කින් මේ යෝජනාවලිය සමන්විත වේ.

## සතොස...

ඊයේ (30) කොළඹ පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් ඇමැතිවරයා සඳහන් කර සිටියේ, පසුගිය සහන මල්ලට වඩා මෙවර සහන මල්ලට සම්බා සහ නාඩු හාල් කිලෝව බැගින් ඇතුළත් කර ඇති බවය.

සම්බා හාල් කිලෝග්‍රෑම් 1, නාඩු හාල් කිලෝග්‍රෑම් 1, පිටි කිලෝග්‍රෑම් 1, රතු ඔස්ට්‍රේලියානු පරිප්පු කිලෝග්‍රෑම් 1, සුදු සීනි කිලෝග්‍රෑම් 1, තායි හාල් මැස්සෝ ග්‍රෑම් 200, විෂ බීජ නාශක දියර මිලිලීටර් 50ක බෝතලයක්, මුහුණු ආවරණයක්, තේ කොළ ග්‍රෑම් 100ක්, සෝයා මීට් ග්‍රෑම් 50 පැකට් එකක්, කැලි මිරිස් ග්‍රෑම් 100 ආදිය සතොස සහන මල්ල 2හි ඇතුළත් වේ.

රුපියල් 1,000ක මිලට ඕනෑම සතොස ශාඛාවකින් මේ සහන මල්ල ගත හැකි බවද හෙතෙම කීවේය. ඒ අනුව මේ මස 2 වැනිදා සිට ශ්‍රී ලංකාව පුරා ඇති සතොස වෙළෙඳ මධ්‍යස්ථානවලින් සහන මල්ල ගත හැකි බවත් එම සහන මල්ල ගන්නා පාරිභෝගිකයන්ට රු. 5ක් අඩුවෙන් ග්‍රෑම් 400 කිරිපිටි පැකට් එකක්ද ගත හැකි බවද ඇමැතිවරයා කීවේය.

## රිෂාඩ් කේරළ...

හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් සහ කේරළයේ මේ ත්‍රස්තවාදී කණ්ඩායම් අතර, පැවති සම්බන්ධකම් පිළිබඳ බුද්ධි අංශ දීර්ඝ විමර්ශනයක් ආරම්භ කර තිබෙන අතර, 2010 වසරේදී බදුර්දීන් මහතා වෙන්නායිහි කළ සංචාරයක් සම්බන්ධවද මේ පරීක්ෂණය කරන කණ්ඩායම් සිය අවධානය යොමු කර තිබේ.

මේ සංචාරයේදීද ආගමික නායකයන් හමු වී ඇති අතර, එම නායකයන් සමඟ කළ සාකච්ඡා සම්බන්ධවද පරීක්ෂණ ක්‍රියාත්මක කර ඇත.කසලගෝඩ් ප්‍රදේශයේදී බදියුදීන් මහතාගේ පියා උපත ලබා ඇති බවත්, මේ හේතුවෙන් එම ප්‍රදේශයේ පදිංචි පවුල් කිහිපයක් සමඟ බදියුදීන් මහතාට සම්බන්ධකමක් ඇති බවට පරීක්ෂණ කණ්ඩායම් අනාවරණය කර ගෙන තිබේ. කරන පරීක්ෂණ සම්බන්ධව ඉන්දීය බුද්ධි කාර්යාංශය සහ පොලිසිය මෙරට සහාය ගැනීමට පියවර ගෙන ඇත. මේ ප්‍රදේශයේ සිටි පවුල් කිහිපයක සාමාජිකයන් අයි. එස්. අයි. එස්. සංවිධානයට බැඳී ඇති බවට ඉන්දීය බුද්ධි අංශ සොයා ගෙන තිබේ. ඔවුන් කිහිප දෙනකු ශ්‍රී ලංකාවට පැමිණ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ පිරිස් හමු වී ඇති බවටද හෙළිවී ඇති බව ඉන්දීය මාධ්‍ය වාර්තා පවසයි.

## නව ප්‍රභේදය...

මෙරටින් වාර්තා වන එංගලන්ත ප්‍රභේදය සම්බන්ධයෙන් අඛණ්ඩව පරීක්ෂණ කරන බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

කොවිඩ් මර්දන සෞඛ්‍ය උපදෙස් නිසි ලෙස පිළිපදින්නේ නම් වයිරසයෙන් ආරක්ෂා වීමට හැකි බවද ඒ මහතා කීය.

## තවත් වසම් රැසක් ...

මාතලේ දිස්ත්‍රික්කයට අයත් දඹුල්ල, ගලේවෙල, මාතලේ සහ නාඋල යන පොලිස් වසම් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල පොලිස් බල ප්‍රදේශය වහාම ක්‍රියාත්මක වන පරිදි ඊයේ (30) සිට හුදෙකලා කිරීමට තීරණය කළ බව යුද හමුදාපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

## කළ යුතු හොඳම දේ...

හකොවිඩ් පැතිරීම ඉතා ඉක්මණින් අවම කිරීම සඳහා කිසියම් විදියකට රට වසා දැමීමට අවශ්‍ය නම් එම තීරණය නිවැරදි වේලාවට ගැනීම වැදගත් බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බලධාරීන් නිවැරදි තොරතුරු දේශපාලන අධිකාරියට සහ තීරණ ගන්නන්ට දීමෙන් රට වසා දමන්නට වන්නේද යන තීරණය ගැනීමට බලධාරීන්ට හැකි වන්නේ යැයිද හෙතෙම පැවසීය.

කොවිඩ් දත්ත එක්රැස් කිරීම පවා අසම්පූර්ණ බවට පෙනී යන්නේ යැයිද, මේ අවස්ථාව හදිසි අවස්ථාවක් නිසා නොපමාව අවශ්‍ය වෙලාවෙදි නිවැරදි තීරණ ගැනීමට බලධාරීන් පියවර ගත යුතු යැයිද ඒ මහතා පැවසුවේය.

කොවිඩ් මර්දනය සඳහා රජයටත්, සෞඛ්‍ය බලධාරීන්ටත් උපරිම සහාය තම සංගමයෙන් දීම කරන බවද ඒ මහතා පැවසුවේය.

## ලෝක කම්කරු...

ලෝකයේ රටවල් රැසක්ම කොවිඩ් වසංගතය හමුවේ සිටින බැවින් කම්කරු දිනය සැමරීම සඳහා පෙළපාළි හා රැලි නොපැවැත්වීමට කටයුතු කර ඇතැයි විදෙස් වාර්තා සඳහන් කරයි. මේ අනුව දේශපාලන පක්ෂ රැසක් මෙන්ම සංවිධාන රාශියක් සිය මැයි දින පෙළපාළි හා රැලි අවලංගු කිරීමට කටයුතු කර තිබේ. මීට අමතරව ජනතා විමුක්ති පෙරමුණ, නව සමසමාජ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය ඇතුළු පක්ෂ රැසක් අන්තර්ජාලය හරහා සිය මැයි දින සැමරුම් කිරීමට සැලසුම් කර තිබේ.

කිසිදු කණ්ඩායමකට හෝ දේශපාලන පක්ෂයකට මැයි දින පෙළපාළි හෝ වෙනත් රැලි පැවැත්වීමට අවස්ථාවක් නොදෙන බවත් එලෙස පැවැත්වුවහොත් ඔවුන්ව සෞඛ්‍ය නීතිවලට අනුව දඬුවම් දීමට කටයුතු කරන බවත් පොලිස් මූලස්ථානය නිවේදනය කරයි.

# සංස්කෘතිය හා බෞද්ධාගමික පිළිගැනීම් රැකගැනීමට
# මහා සංඝරත්නය මැදිහත්ව සිටිනවා

## මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමි

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

මෙරට සංස්කෘතිය හා බෞද්ධාගමික පිළිගැනීම් සියල්ල අභියෝගයට ලක් කරන රාජ්‍ය නොවන සංවිධාන තිබෙන බවත් මෙම සංවිධාන මගින් සිදුකරන හානිය වළක්වා ගැනීමට මහා සංඝරත්නය මැදිහත් වී සිටින බවත් ඒ අනුව ත්‍රිපිටක සංරක්ෂණ පනතක් සකස් කිරීමට පියවර ගෙන ඇති බවත් මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නාහිමියෝ සඳහන් කළහ.

ඓතිහාසික මිහින්තලා මහා සෑයේ සුදු හුණු පිරියම් කිරිමේ පුණ්‍ය කටයුත්ත පෙරේදා (29) මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ සිදු කෙරුණු අතර එහිදි අනුශාසනාවක් සිදු කරමින් උන්වහන්සේ මේ බව පැවැසූහ. අනුබුදු මිහිඳු නා හිමියන් සිහිකරමින් පවත්වන ලේක්හවුස්- මිහින්තලා ආලෝක පුජාවට සමගාමිව වාර්ෂිකව මෙම මහා පින්කම සිදු වේ.

මෙවර මෙම පින්කමේ මුල්‍ය දායකත්වය අරලිය සමුහ ව්‍යාපාරයේ අධිපති ප්‍රසිද්ධ ව්‍යාපාරික ඩඩ්ලි. සිරිසේන මහතා විසින් සිදු කෙරිණ.

'ඉදිරියේදි ද මෙම මහා පින්කම සදහා සම්පුර්ණ මුල්‍ය දායකත්වය ලබා දෙන බවත් මෙම මහා පින්කමේ ආශිර්වාදයෙන් අප රටත් ලෝකවාසි සියලු ජනතාවටත් කොරෝනා වයිරසයෙන් මිදි නිදුක් නිරෝගිමත් ජිවිතයක් ගත කිරිමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන බවත් ප්‍රසිද්ධ ව්‍යාපාරික ඩඩ්ලි.සිරිසේන මහතා සදහන් කළේය.

මිහින්තලා රාජමහා විහාරාධිපති වළවාහැංගුණවැවේ ධම්මරතන නාහිමි, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස, ගැටමාන්නේ ගුණානන්ද යන නාහිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ ලෝම ධාතුන් වහන්සේලා තැන්පත් කර ඇති ඓතිහාසික මිහින්තලා මහා සෑයේ සුදු හුණු පිරියම් කිරිමේ පින්කම සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ඇරඹුණි. මෙම කටයුතු ආරක්ෂක අංශ නිලධාරින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදු කෙරේ.

මෙහිදි අනුශාසනාවක් සිදු කරමින් මහාචාර්ය මැදගොඩ අභය තිස්ස නාහිමියෝ මෙසේද පැවැසුහ:

අද මේ වන විට මිහිදු සංස්කෘතිය අතු ගාන්නට ගොඩක් වැඩ කෙරි ගෙන යනවා. බුදුන්වහන්සේ උපන්නේ ශ්‍රී ලංකාවේ කියා සඳහන් කරනවා. එතකොට මිහින්තලාවක් අවශ්‍ය නෑ. ඒ වගේම මේ අපේ දේශිය සංස්කෘතිය අපේ පිළිගැනිම් සියල්ල අභියෝගයට ලක් කරන විශාල රාජ්‍ය නොවන සංවිධාන පිටු පස්සෙන් සිට කරන බරපතළ හානියක් මේ රටේ සිදු වෙනවා. එම දේවල් වළක්වා ගැනිමට මහා සංඝරත්නය මැදිහත් වෙලා මහා නායක අනුනායක නාහිමිවරු එකතුවි ත්‍රිපිටක සංරක්ෂණ පනතක් පවා සකස්කර පාර්ලිමේන්තුවේ අනුමත කර ගැනිම සදහා අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබෙනවා.

අපේ සංස්කෘතියට පහර නොදී සංස්කෘතියෙන් ජනතාව ගැලෙව්වේ නැත්නම් බුදු දහම විනාශ කරන්න බැහැ. මේ වසර දෙදහස් ගණනක් මේ සංස්කෘතිය පවත්වාගෙන ඇවිත් තිබෙන්නේ මේ රටේ ගහට පොත්තට පොත්තට ගහ වගේ අපේ බෞද්ධයන් හා සංස්කෘතිය. මේ ඉතිහාසයත් එක්ක තිබෙන බැඳීම නිසයි.සංස්කෘතික බැඳීම් කඩන්න කුමන්ත්‍රණ කරන්නේ.බොහොම සුළු පිරිසක් මෙය ප්‍රචාරය කරනවා.

ව්‍යාපාරික අපේ ඩඩ්ලි.සිරිසේන මහතා මෙම කාර්යට දායකත්ව සැලසීම උසස් පිංකමක් බවද උන්වහන්සේ වැඩිදුරටත් පැවැසූහ.

මිහින්තලය පිළිබදවත් මෙය කෙබදු ස්ථානයක්ද යන්න පිළිබඳවත් මේ රටේ කිසිවෙකුටත් අමුතුවෙන් කිවයුතු නෑ.මිහින්තලය පිළිබඳව සඳහන් කරද්දි කියන්න වෙන්නේ ශ්‍රි ලාංකීය සංස්කෘතියේ තොටිල්ල කියලවත් තිඹිරිගෙය කියලවත් නොව ගර්භාෂය කියලයි. ශ්‍රි ලාංකිය සංස්කෘතියක් ඇද්ද,බෞද්ධ සංස්කෘතියක් ඇද්ද ,සිංහල සංස්කෘතියක් ඇද්ද මේ අවුරුදු දෙදහස් ගණනක ඉතිහාසයට මේ සමස්තය ප්‍රදානය කරන්නේ මේ මිහින්තලාවෙන්.



### මිහින්තලා මහා සෑයේ හුණු පිරියම් ඇරැඹේ



හුණු පිරියම් කිරිමේ පුණ්‍ය කටයුත්තේ අවස්ථාවක්

මිහිදු මහා රහතන් වහන්සේ ශ්‍රී ලංකාවට එන්නට කලින් ලංකාවේ ඉතිහාසය පිළිබදව මහා වංශයේ සදහන් වනවා.බුදුරජාණන්වහන්සේ වඩින්නේ ඊට වසර තුන්සියකට පමණ කලින් ක්‍රිස්තු පුර්ව හයවන ශත වර්ෂයේ මිහිදු මාහිමි වැඩම කරන්නේ ක්‍රිස්තු පුර්ව තුන්වන ශත වර්ෂයේ ,එවකට තිස් දෙහැවිරිදි මිහිදු මාහිමි තමයි ලංකාවට වැඩම කරන්නේ.

අපේ පළමු හාමුදුරුවෝ මහණ කෙරෙන්නේ මෙම ස්ථානයේ.අරිට්ඨ කුමාරයා පැවිදි කරවන්නෙත් මේ ස්ථානයේදිමයි.ධාතුන් වහන්සේලා දකින්නට වඳින්නට ලැබෙනවා නම් බුදුන් දකින්නට වඳින්නට ලැබෙනවා වගෙයි.ඒ නිසා මේ චෛත්‍ය රාජයාණන් වහන්සේ කියන්නේ බුදු හාමුදුරුවොමයි.මේ චෛත්‍ය සලපතළ මළුවෙන් පටන් අරගෙන එතනින් පසුව සීල සමාධි ප්‍රඥා ත්‍රිශික්ෂාවන් ඒ වගේම ධර්මස්කන්ධය ඉන් පසු කෙළවර දක්වා ගිහින් අවසානයේදි නිර්වාණය තමයි සංකේතවත් වන්නේ චුඩා මාණික්‍යයෙන්. අපේ කලාකරුවා මේ පුජනිය ස්ථානයට ධර්මය එකතු කළා.ඒ නිසා චෛත්‍ය රාජයාණන් වැඳපුදා ගන්නවා කියන්නේ එයට කරන මහා උතුම් උපහාරයක්,කකුසඳ,කෝනාගම ,කාශ්‍යප,ගෞතම යන සතර බුදුන් වහන්සේ වැඩහිටිය ස්ථානයක් මිහින්තලාව. ඒ වගේම අනාගතයේ බුදුවන මෛත්‍රි බුදුහාමුදුරුවොත් මෙම ස්ථානයට වැඩම කරනවා.ඒ නිසා මේ චෛත්‍යයට කළ උපහාරය විශාල ආනිසංස ගෙන දෙන කාර්යයක් බවද උන්වහන්සේ වැඩිදුරටත් පැවැසූහ.

මිහින්තලා රජමහා විහාරාධිපති ආචාර්ය වළවාහැංගුනවැවේ ධම්මරතන නාහිමි මෙහිදි අනුශාසනාවක් සිදු කරමින්:

ඓතිහාසික මිහින්තලා රාජමහා විහාර පුදබිම ජාතික උරුමයක් ලෙස ගැසට් කර තිබුනත් එහි සීමා නිර්ණය සඳහන් කර නොමැති බවත් එහෙයින් සීමා නිර්ණය ගැසට් කර දිමට කටයුතු කරන මෙන් උන්වහන්සේ ඉල්ලා සිටිති.

රාජ්‍ය පොසොන් පින්කම මෙපමණ කාලයක් ගැසට් කර තිබුණේ නෑ. පසුගිය කාලයේ මෛත්‍රිපාල ජනාධිපතිතුමත් හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාටත් බල කර කියලා තමයි මෙය ගැසට් කර ගත්තේ. දැන් පොසොන් පින්කම රාජ්‍ය උත්සවයක් ලෙස සඳහන් වි තිබෙනවා.

මෙය ජාතික උරුමයක් හැටියටත් හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ගැසට් කිරිමට කටයුතු කළා,හැබැයි සීමා නිර්ණය තිබුණේ නෑ.අපේ අනුනායක හිමියන්ටත් මේ පිළිබඳව දැනුම්වත් කළා.රජයේ අවධානය යොමුකර ඒ සීමා නිර්ණය ගැසට් කර දෙන්න කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

අද මේ මිහින්තලා මහා සෑයේ පමණක් නොව සේල චෛත්‍ය,දාන ශාලා,සංඝාවාස,ධාතු මන්දිර ආදි සියලු විහාර ආරාමවල තීන්ත අලේප කිරිම සදහා සියලුම මුල්‍ය දායකත්වය දරන්නේ අපේ ව්‍යාපාරික ඩඩ්ලි. සිරිසේන මහතායි.ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ,අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ යන මහත්වරුගේ හා ආරක්ෂක ලේකම්, ජෙනරාල් කමල් ගුණරත්න මහතාගේ මගපෙන්විම යටතේ මෙහි කටයුතු ගුවන් හමුදාව,නාවික හමුදා,යුධ හමුදාව,සිවිල් ආරක්ෂක බළකාය ඇතුළු ආරක්ෂක අංශවල ශ්‍රමදායක්ත්වය ඇතිව මෙහි ඉදිකිරිම් සදහා ශ්‍රම දායකත්වය ලබා දෙනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිංහල රජ දවසින් පසුව මහා සංඝරත්නයේ උපදේශක සභාවක් මාසිකව පවත්වනවා.උන්වහන්සේලා ඒ අඩුපාඩු කියා දෙනවා.මෙතන තමයි සම්බුද්ධ ශාසනයේ මුලස්ථානය.දළදා වහන්සේ,අටමස්ථාන ,සොළොස්මස්ථාන ශ්‍රි මහා බෝධීන් වහන්සේ ඇතුළු මේ සියලු දේවල් ලැබෙන්නේ මිහිදු මාහිමි වැඩමවීම නිසයි.මෙම ස්ථානයේ තමයි පංච සීල ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ. චුල්ලහත්ති පදෝපම සුත්‍රය දේශනා කළේ, හතළිස් දහසක් අවි බිම තිබ්බේ.ඒ වගේම පණ්ඩුක උපාසක මහණ කරන්නේ උපසම්පදා කරන්නේ,අඹ පැනය රුක්රෝපණ,ධර්ම දේශනා සුවිශේෂි කරුණු ගණනාවක් සිදුවුයේ මේ උතුම් පුදබිමේ.මේ සියලු සතා සිවුපාවා හා පරිසරයත් ආරක්ෂා කරන්න කියා එදා මිහිදු මාහිමි දේවානම් පියතිස්ස රජ තුමාට දැන්වූවා.

ලෝකයේ පළමු අභය භූමිය, පළමු රෝහල, ගල්ලෙන් හැට අටක් සාදා පුජා කරමින් සිදුකළ පළමු ආරාම පුජාව හා භාෂාව, සංස්කෘතිය, ශිෂ්ටාචාරය කැටයම් මුර්ති, කලාව,වාරි කර්මාන්ත මේ සියල්ල ආරම්භ වන්නේ මේ උතුම් ස්ථානයේ.

මෙම අවස්ථාවට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ආර්.එම් වන්නිනායක, ලේක්හවුස් ආයතනයේ මෙහෙයුම් අධ්‍යක්ෂ නීතිඥ කනිෂ්ක විතාරණ, නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (ආයතනික කටයුතු) චන්දන බංඩාර, මෙහෙයුම් කළමණාකාර ගයාන් බංඩාර, පහසුකම් කළමනාකාර අර්ජුන සිරිවංශ, සුභ සාධක කළමනාකාර ෂමින්ද විජේතුංග යන මහත්වරු සහ ත්‍රිවිධ හමුදාව පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ නිලධාරීහු රැසක්ද එක්ව සිටියහ.

# පාර්ලිමේන්තුව රැස් වීම ලබන සතියේ දෙදිනයි

**ස්වර්ණා විජේකෝන්**

ලබන සතියේ පාර්ලිමේන්තු රැස්වීම් මැයි 04 වනදා සහ 05 වැනිදා යන දිනවලදී පමණක් පැවැත්වීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කර ඇත. කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (30) පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී මෙම තීරණය ගෙන තිබේ.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත පිළිබඳ විවාදය මැයි 05 වැනිදා පැවැත්වීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කර ඇත. එම විවාදය පෙරවරු 10.00 සිට රාත්‍රී 8.00 දක්වා සම්පූර්ණ දිනය තුළදීම විවාද කිරීමට තීරණය වූ බවද පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ප්‍රකාශ කළේය.

එමෙන්ම විපක්ෂය කළ යෝජනාවකට අනුව කෝවිඩ් 19 අභියෝගය හමුවේ රටේ පවතින වර්තමාන තත්ත්වය පිළිබඳ සභාව කල්තැබීමේ විවාදයක් මැයි 04 වනදා පෙරවරු 11.00 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වීමටද එහිදී තීරණය වූ බවද දසනායක මහතා සඳහන් කළේය.

පාර්ලිමේන්තුව පැවැත්වෙන දින දෙකේදීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාචික ප්‍රශ්න විමසීම සඳහා සහ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න විමසීම සඳහා කාලය වෙන්නොකිරීමටද තීරණය කළ බව මහලේකම්වරයා පැවැසීය.

මැයි 04 වනදා පෙරවරු 10.00 සිට පෙරවරු 11.00 දක්වා කාලය තුළදී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ වන නියෝගයක්ද, සුරාබදු ආඥා පනත යටතේ වන නිවේදන 04ක්, වැට් බදු සම්බන්ධව පනත් කෙටුම්පත සහ දේශීය ආදායම් බදු පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට ද පක්ෂ නායකයෝ එකඟ වූහ. ඉන් අනතුරුව පෙරවරු 11.00 සිට දිවා ආහාරය සඳහා සභාව කල්තැබීමකින් තොරව පස්වරු 5.30 දක්වා විපක්ෂය විසින් ඉල්ලා සිටි රටේ වත්මන් තත්ත්වය පිළිබඳ සභාව කල් තැබීමේ විවාදය පැවැත්වෙන බව මහලේකම්වරයා පැවැසීය.

එමෙන්ම මැයි 05 වනදා පෙ.ව 10.00 සිට රාත්‍රී 8.00 දක්වා පාර්ලිමේන්තුව දිවා විවේකය සඳහා කල් තැබීමකින් තොරව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත විවාදයට ගනු ලබන බවද දසනායක මහතා සඳහන් කළේය.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම සඳහා සභානායක, විදේශ කටයුතු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ මහා මාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරුද කැබිනට් අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, මහාචාර්ය ජී. ඇල් පීරිස්, ඩලස් අලහප්පෙරුම, වාසුදේව නානායක්කාර සහ ප්‍රසන්න රණතුංග, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අනුර කුමාර දිසානායක, ගයන්ත කරුණාතිලක, ඩිලාන් පෙරේරා, මනෝ ගනේෂන් සහ එම්. ඒ. සුමන්තිරන් යන මහත්වරුද සහභාගී වූහ.

# ජනාධිපති කාර්යාලයේ මහජන සේවා අඛණ්ඩව

**මහින්ද අලුත්ගෙදර**

උද්ගතව ඇති කොවිඩ් 19 ව්‍යාප්තිය හමුවේ සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පරිදි දෛනික කාර්යාලීය සේවක සංඛ්‍යාව අවමය දක්වා සීමා කර තිබුණ ද ජනාධිපති කාර්යාලයෙන් මහජනතාවට සැපයෙන සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑමට තීරණය කර තිබේ.

රෝගය පැතිරයෑම පාලනය සඳහා පනවා තිබෙන සීමාවන් නිසා මහජනතාවට ජනාධිපති කාර්යාලයට පැමිණීමට ඇති අපහසුවද සැලකිල්ලට ගෙන දුරකථන, තැපෑල සහ විද්‍යුත් තැපෑල යන සන්නිවේදන මාර්ග ඔස්සේ ජනතා ඉල්ලීම් දැනුම් දීමටත්, ඉටුකිරීමටත් අවස්ථාව සලසා දී ඇත.

ඉදිරි සති 02ක කාලයේ දී, ජනාධිපති කාර්යාලයේ මහජන සම්බන්ධතා අංශය, ඔම්බුඩ්ස්මන් කාර්යාලය සහ ජනාධිපති අරමුදල සමග පහත සඳහන් දුරකථන/ ෆැක්ස් අංක ඔස්සේ සම්බන්ධ වීමට හැකියාව පවතී. ඒ අනුව ජනාධිපති මහජන සම්බන්ධතා අංශය - 0114354550/0112354550, Fax 0112348855, publicaffairs@presidentsoffice.lk ද ඔම්බුඩ්ස්මන් කාර්යාලය - 0112338073, ombudsman@presidentsoffice.lk සහ ජනාධිපති අරමුදල - 0112354354, Fax 0112331243, fundsecretary@presidentsoffice.lk ඔස්සේ සම්බන්ධ වියහැකිය.

# හරීන් අත්අඩංගුවට ගන්න හදනවා කියලා ගෙන යන්නේ අමූලික බොරු ප්‍රචාරයක්

## ඇමැති මහින්ද අමරවීර

**ක්‍රිසන්ති විතාරණ**



සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා අත්අඩංගුවට ගැනීමේ සූදානමක් ඇතැයි විපක්ෂය නගන චෝදනා පදනම් විරහිත බවත් රජය තුළ එවැන්නක් පිළිබඳව අඩු තරමින් සාකච්ඡාවක් හෝ කර නැති බවත් පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවැසීය.

අමාත්‍යවරයා මේ බව සඳහන් කළේ පෙරේදා (29) පරිසර අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවක දී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ අමාත්‍ය මහින්ද අමරවීර මහතා මෙසේද කීය:

කිසිදු පුද්ගලයෙක් අත් අඩංගුවට ගැනීමට හෝ නිදහස් කිරීමට රජය මැදිහත් වන්නේ නැහැ. ඒක නීතිපතිතුමන් විසින් ගරු අධිකරණය වෙතින් ඉල්ලීමක් කළොත් ඒ මත සිදුවන දෙයක්. එසේ නැතිව රජය, අගමැතිතුමා, හෝ අතිගරු ජනාධිපතිතුමා හෝ කිසි විටෙක කිසියම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මැදිහත් වන්නේ නැහැ.

පාස්කු ප්‍රහාරය සම්බන්ධව පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා විශාල කතාවක් කළා. පාස්කු ප්‍රහාරය කියන්නේ මේ රටේ යුද්ධයක් නැති කාලෙක එල්ල වු බරපතළම ත්‍රස්ත ප්‍රහාරයයි. ඉන් කතෝලික ජීවිත රැසක් මොහොතකින් අහිමි වුණා. ඒ සම්බන්ධව එම ජනතාවට විශාල වේදනාවක් තිබෙනවා. ඒ සම්බන්ධව වගකිව යුතු පුද්ගලයන් අත් අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කිරීම රජයේ වගකීමක්.

මගේ අදහස නම් මෙම කාරණය කිසිවෙක් විසින් හෝ සැහැල්ලු කාරණයක් ලෙස නොගත යුතුයි. හරීන් ප්‍රනාන්දු මහතා ඒ ගැන අනිත් අය නොදන්නා කරුණු දන්නවා නම් ඒවා ආරක්ෂක අංශ වෙත හෙළි කිරීම ඔහුගේ යුතුකමක්. ඒත් ඔහු දැන් රෝහල්ගත වී සිටිනවා. ඒ අතරේ රජය විසින් ඔහු අත් අඩංගුවට ගැනීමට කටයුතු කරනවා කියමින් රජයට බොරු චෝදනා කරනවා.

# වරාය නගරයෙන් රජයට අයත් වීමට තිබූ කොටසේ
# 10% ක් යහපාලනය චීන සමාගමට පවරා දුන්නා

## ඇමැති වාසුදේව නානායක්කාර

**අනුර ප්‍රේමලාල්**

වරාය නගරය සම්බන්ධයෙන් විපක්ෂය ගෙන යන ප්‍රචාරයන් සම්පූර්ණ අසත්‍ය බවත් ඒවා නිසි අධ්‍යයනයකින් යුතුව ජනතාව සත්‍ය දැනගත යුතු බවත් ප්‍රජාතන්ත්‍රික වාමාංශික පෙරමුණේ නායක හා ජලසම්පාදන ඇමැති වාසුදේව නානායක්කාර මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ සිය අමාත්‍යාංශයේ ඉකුත් (29) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින්ය. එහිදි වැඩිදුරටත් අදහස් දැක්වු ඇමැතිවරයා මෙසේද කීය:

වරාය නගරය ගොඩ නැගීම ආරම්භ වන්නේ අපේ ආණ්ඩුවක් යටතේ. මේක පටන් ගත්තේ ඒ හදන සමාගමට 33%යි. ඊළඟට පොදු සාමාන්‍ය මහජනයාගේ අවකාශය 33%යි. විවිධාකාර මහජන අවකාශයන් හා රජයට 33% යි. වශයෙන්. ඒත් යහපාලන ආණ්ඩුව ආපු හැටියෙ මේ වරාය නගරයේ කටයුතු නැවැත්තුවා. නැවැත්තුවට පස්සේ අවුරුද්දක් ගියා. ඊට පස්සේ ඒ ඉදිකිරීම් අංශය භාර ගෙන තිබුණු ඒ චීන සමාගම නඩු දැම්මා. නඩු දාලා ඉවර වෙලා බරපතළ වන්දියක් ඉල්ලුවා. ඒ ගොල්ලන් මේ ගිවිසුමට ඇවිල්ලා කරපු වියදම් වලින් ඒගොල්ලන්ට වෙච්ච අලාභය ඉල්ලා. ඒ පාර යහපාලන ආණ්ඩුව කළේ මොකද එහෙමනං නඩු යන්න ඕනෙ නෑ අපි ඕගොල්ලන්ට තව 10%ක් දෙන්නම් කියලා ඒගොල්ලන්ට තිබුණු 33% චීන සමාගමට 43% කළා. ඒක අඩු වුණේ අපෙන්. අර පොදු පහසුකම් සඳහා තිබෙන 33% ප්‍රදේශයේ එහෙම්මම තියෙනවා. එහෙම තමයි අපට තිබුණ 33% තවත් 10%කින් අඩු වුණේ. ඒ අඩුවෙච්ච 10% අය කරගන්න තියෙන්නේ සජිත් ප්‍රේමදාස - රනිල් වික්‍රමසිංහ ඇතුළු යහපාලන ආණ්ඩුවෙන්. එහෙම ක්‍රමයක් අපේ රටේ නීතියේ නෑ. ඒකයි අඩුපාඩුව කවුරුහරි ආණ්ඩු පාලනයක් ගෙන යන කාලයේ යම් ආණ්ඩු තීරණයක් අරගත්තොත් ඒ තීරණය පසුකාලීනව රටට හානියක් හා අලාභයක් වුණොත් ඒක ඒ පුද්ගලයන්ගෙන් අය කර ගැනීමෙ ක්‍රමයක් තියෙන්න ඕනෑ.



# කොවිඩ් පාලනයට අතරමැදි සත්කාරක සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට පියවර

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය ආසාදිතයන් වාර්තා වීම වැඩිවීමත් සමඟ රෝහල් පද්ධතියට ඇති විය හැකි බර අවම කිරීමේ අරමුණෙන් අතරමැදි සත්කාරක සේවා මධ්‍යස්ථාන (Intermediate Care Centers) ස්ථාපිත කිරීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය තීරණය කරයි.

සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට මෙන්ම ඇඳන් ධාරිතාව 200කට වැඩි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අවධානය යොමු කර ඇති බවත් ඒ සඳහා රජයේ සහ පෞද්ගලික ආයතනවල ගොඩනැඟිලි ලබාගැනීම සිදු කරන බවත් ඇමැතිවරිය පැවසුවාය.

දැනටමත් ආයතන කිහිපයක ගොඩනැඟිලි මේ සඳහා ලබාදීමට කැමැත්ත පළකර ඇති බවත් අවශ්‍ය ඇඳන්, ලොකර්ස් සහ අනෙකුත් අවශ්‍යතා සපයා ගැනීම කෙරෙහි අවධානය යොමුව ඇති බවත් ඇමැතිවරිය ප්‍රකාශ කළාය.

කොවිඩ් මර්දනයේ දී පැනනඟින වාහන අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම කෙරෙහි සාකච්ඡාවක් ද අමාත්‍යාංශය තුළදී පැවැත්විණ. විශේෂයෙන් කොරෝනා මර්දනයේදී සුවසැරිය කාර්යභාරය පිළිබඳව ද සාකච්ඡා වූ අතර ග්‍රාමීය ප්‍රදේශවල සුවසැරිය ගිලන්රථ සේවාව ඉටුකිරීම සඳහා අතිරේක ගිලන් රථ ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කර තිබේ.

මෙම සාකච්ඡාව සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයුම්) විශේෂඥ වෛද්‍ය ලාල් පනාපිටිය, ලෝක බැංකු ව්‍යාපෘති අධ්‍යක්ෂ වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) වෛද්‍ය සුදත් ධර්මරත්න, අධ්‍යක්ෂ වෛද්‍ය සැපයුම් අන්වර් හම්ඩානි මහත්වරු සහභාගී වූහ.

# කොරෝනාවෙන් ලොව ගලවා ගැනීමට මෙවර කම්කරු දිනය යොදා ගන්න

## රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න



කොරෝනා වයිරසයෙන් ලොව ගලවා ගැනීමට මෙවර කම්කරු දිනය යොදාගන්නැයි සමස්ත කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින බව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා කම්කරු දිනය වෙනුවෙන් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේය. එම නිවේදනයේ මෙසේද සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කම්කරු දිනය සැමරුවේ 1927 වසරේ වන අතර ලංකා ඉතිහාසයේ පළමු මැයි රැලිය ද ආරම්භ කෙරුණේ 1933 දීය. ඒ කොළඹ ප්‍රයිස් පිටියේ සිට ගාලු මුවදොර පිටිය දක්වාය. 1956දී මැයි දිනය මෙරට නිවාඩු දිනයක් ලෙස නම් කර තිබේ. කම්කරුවාගේ අයිතීන් සුරකිමින් මුළු ලොවම බියගන්වන කොවිඩ් 19 මාරයා ලොවෙන් තුරන් කොට සෞඛ්‍ය උපදෙස් පිළිගනිමින් මේ ව්‍යසනයෙන් රට, ලොව ජයගන්නට අප සියලු දෙනා එක්සත්ව එක්සිත්ව පෙළගැසී කටයුතු කරමුයැයි ශ්‍රී ලංකාවාසී ජනතාවගෙනුත් ලෝකවාසී ජනතාවගෙන් ඉල්ලා සිටිනවා යැයිද කීය.



ඡායාරූපය-රුක්මාල් ගමගේ

දැතිරෝද පණ පොවපු බලවේග නැවතිලා
වසංගත භීතියෙන් මුළු රටම රත් වෙලා
සටන් - පෙළපාළි නෑ රතු කොඩිය තනි වෙලා
කොවිඩ් සටනට බහිමු එක හඬට නැඟිටලා

රත්නසිරි පතිරණ

# ජනහිතකාමී වැඩබිමක් සුරක්ෂිත දේශයකට අපි කැප වෙමු

## කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

අනුර ප්‍රේමලාල්



ජනහිතකාමී වැඩබිමක් - සුරක්ෂිත දේශයක් සඳහා කැප වෙමු යැයි මෙවර මැයි දිනය වෙනුවෙන් නිවේදනයක් නිකුත් කරමින් කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රකාශ කර සිටියි. මානව වර්ගයාගේ යහපැවැත්ම, සුරක්ෂිතතාව හා අනාගත අභිලාෂ මුදුන්පත් කරලීමට සිය ශ්‍රමය කැපකර වැඩකරන ජනතාව ඇගයීම හා සැමරීමට වෙන් කර ඇති මැයි දිනය නිමිත්තෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම කම්කරු ඇමැතිවරයා වශයෙන් මා ලද භාග්‍යයක් කොට සලකමි. කොරෝනා වසංගතය හේතුවෙන් පෙර පරිදි මැයි දින පෙළපාළි රැලි,උත්සව හා සැමරුම් පැවැත්වීමට නොහැකි වීම වැඩකරන ජනතාවට මෙන්ම රජයට ද කනගාටුවකි.


ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

## මධ්‍යම පළාත - 2 - 2021 මැයි මාසය

### ගිණිගත්හේන විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### හැටන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-04 10:00-17:00
තොග : ආගයිල් ගල් කොරිය, කියෙන්නැම් ගල්වැඩපොල - හැටන්, කියෙන්නැම් කාර්යාලය, කොටගල R.D.M කම්හල, කුඩාගම ගල් කොරිය, වර්ල්ඩ් වයිඩ් එන්ටප්‍රයිසස්
තොග සහ බෙදහැරීම් :
බෙදහැරීම් : ආගයිල් නව යෝජනා ක්‍රමය, කොලම්බු කොමාර්ෂල් කොම්පැනි, ලොක්හිල් රොසිටා ගොවිපල, මහවැලිගම රුවන්පුරගම.

#### නෝර්ටන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-04 09:00-17:00
තොග සහ බෙදහැරීම් : බ්‍රොඩ්ලන්ඩ් තේ කම්හල
බෙදහැරීම් : , බෙලිලෙන, කළුගල ගම, කළුකොහුතැන්න, මීගස්තැන්න

### කෑගල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### මොරොන්තොට පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-04 09:00-17:00
තොග : හල්මේසා සෝ මිල්, ජල පවිත්‍රාගාරය (මොරොන්තොට - ජල සැපයුම), ජල මණ්ඩලය හල්මේසා
බෙදහැරීම් : රොටුව කෙසෙල්වත්ත මොරොන්තොට සහ අලපලාව, මොරොන්ටෝටා නිව් සබ් (හෙල්මේසා පාර)

2021-05-06 09:00-17:00
තොග : හුංගම්පොල රබර් කර්මාන්ත ශාලාව
බෙදහැරීම් : හුංගම්පොල පන්සල

2021-05-08 09:00-17:00
තොග : හුංගම්පොල රබර් කර්මාන්ත ශාලාව
බෙදහැරීම් : හුංගම්පොල පන්සල

2021-05-10 08:30-17:00
බෙදහැරීම් : හිග්ගොඩ මාබෝපිටිය, හිග්ගොඩ තිකපිටිය

2021-05-13 09:00-17:00
තොග : හුංගම්පොල රබර් කර්මාන්ත ශාලාව, ජ්ලයිවුඩ් (ලක්මැනියර් මීදෙනිය), ජල පවිත්‍රාගාරය (මොරොන්තොට - ජල සැපයුම)
බෙදහැරීම් : හපුවිට උඩගම, හුංගම්පොල පන්සල, රොටුව කෙසෙල්වත්ත මොරොන්තොට සහ අලපලාව, මීදෙනිය,

#### රඹුක්කන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-05 09:00-17:00
තොග : පින්නවල - 1, පින්නවල - 2, පින්නවල - 3
තොග සහ බෙදහැරීම් : හිරිවඩුන්න ජල සම්පාදන මණ්ඩලය
බෙදහැරීම් : දුනුකේවෙල, පිටියේගම, වාගොල්ල

2021-05-07 08:00-17:00
තොග : සෞඛ්‍ය මධ්‍යස්ථානය (අලි අනාථාගාරය), රවි අපනයන (පුද්) සමාගම නාරන්බැද්ද
බෙදහැරීම් : අලි අනාථාගාරය, එරමිණිගොල්ල නව උපපොල, හල්පිටිය, කිරිවන්දෙනිය, නාරන්බැද්ද, වැලිකන්ද කොළණිය - අදියර 02

2021-05-08 08:00-17:00
තොග : , P.T.K.කර්මාන්ත ශාලාව, රඹුක්කන ප්‍රාදේශීය සභාව
තොග සහ බෙදහැරීම් : රඹුක්කන තෙල්මෝල
බෙදහැරීම් : රඹුක්කන කොටස - 11, , ලංකා ගමනා ගමන මණ්ඩලය, මඩවල - රඹුක්කන ඩයලොග් කුළුණ, හස්තිපුර (මහවත්තකැලේ), රෝහල පාර, හුරීමලුව, , පින්නවල පාසැල අසල, රඹුක්කන කොටස - 1, රඹුක්කන නගර - කොටස 111, රඹුක්කන ප්‍රාදේශීය උපපොල, රිජන්ට් උපපොල රඹුක්කන

2021-05-10 08:00-17:00
තොග සහ බෙදහැරීම් : වැලිගමුව රෙදි කර්මාන්ත ශාලාව
බෙදහැරීම් : ගබ්බල මැදගම , ගබ්බල, කොටවෙල, වැලිගමුව හන්දිය

2021-05-12 08:00-17:00
තොග : කොම්පෝස්ට් කර්මාන්ත ශාලාව - රඹුක්කන
බෙදහැරීම් : අළුගොල්ල, දැලිවල, , හේවාදිවල, හේවාදිවල විද්‍යාලය, සියඹලන්ගමුව

#### තුල්හිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-05 08:00-17:00
බෙදහැරීම් : , මොබිටෙල් කුළුණ වද්දෙනිය, වද්දෙනිය, විමලගම

2021-05-07 08:30-17:00
බෙදහැරීම් : කන්දේගම

2021-05-10 08:00-17:00
තොග : බෝයගනේ ඇපරල්,
බෙදහැරීම් : අක්වත්ත, මාස්පොත, පස්පොලකන්ද, පින්නගොඩ කන්ද, රාගල්කන්ද, රන්වල, ඇගල්ල දැදිගම ගල් වැඩපොල (විජය ගල්)

2021-05-10 08:30-17:00
බෙදහැරීම් : කන්දේගම

2021-05-11 08:00-17:00
තොග : වෝටර් පොම්ප වේරපිටිය
බෙදහැරීම් : , බටුවත්තකෙත, බෙලිගල, දෙමටැනුව ඇලිගල, හතගොඩ පරගහලියද -01, කුඹල්ගම, මකුද්දල, වේරගොඩ - මොබිටෙල් කුළුණ, පලපොළුව, මකුද්දල පල්ලේවෙල (ගල්කඩුව), වඩුකද මෙතියගම.

2021-05-12 08:00-17:00
බෙදහැරීම් : , බුරුන්නාව, , ගස්නෑව උඩකොටස, ගස්නාව ඔබේනවත්ත, ඉහල මොරවක, ඉඹුලෝවිට බුළුගහතැන්න, , පීල්ල කුඹුර, තෝලංගමුව, උඩකුඹුර, උඩකුඹුර හන්දිය, වැටකොලුවාව (ඔත්තාපිටිය)

### මාවනැල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### දිප්පිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-05 09:00-17:00
බෙදහැරීම් : දස්වත්ත

2021-05-06 09:00-17:00
බෙදහැරීම් : දිප්පිටිය

2021-05-10 09:00-17:00
බෙදහැරීම් : , දෙබත්ගම, එලහිපිටිය, , හත්ගම්පොල, මොරාගම්මන, විල්පොල

2021-05-13 08:30-17:00
බෙදහැරීම් : පත්තල

#### හෙම්මාතගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-03 08:30-17:00
බෙදහැරීම් : අම්බලාව-බලත්ගම

2021-05-06 09:00-17:00
තොග : යුනික් ගාමන්ට්
බෙදහැරීම් : තල්ගස්පිටිය හබ්බාලක්වා, වඩුවාවල

2021-05-08 08:30-17:00
බෙදහැරීම් : අම්බලාව-බලත්ගම

2021-05-11 08:30-17:00
බෙදහැරීම් : අම්බලාව-බලත්ගම

2021-05-13 08:30-17:00
තොග : මාර්ග සංවර්ධන ව්‍යපෘතිය - මිශ්‍ර කිරීමේ මධ්‍යස්ථානය

#### මාවනැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-03 08:30-17:00
බෙදහැරීම් : දනාගම

2021-05-03 08:30-18:00
බෙදහැරීම් : නාත්කුරුගම

2021-05-03 09:00-17:00
තොග : අතාවුද ගල් වැඩපොල - මාවනැල්ල, ඉලුක්ගොඩ ගල් මෝල, රිවර් ව්‍යු ගාර්ඩ්න් හීන්දෙණිය - මාවනැල්ල
බෙදහැරීම් : , දනාගම කොලනිය, ඉලුක්ගොඩ i, ඉලුක්ගොඩ ii (නව), කෝන්දෙනිය, රුහකෙටුගම, මැල්ලකැලේ

2021-05-07 09:00-17:00
බෙදහැරීම් : රුවන්දෙනිය

2021-05-08 08:30-17:00
බෙදහැරීම් : දනාගම

2021-05-09 08:30-17:00
තොග : අල් මුබාරිස් පුද්ගලික සමාගම, ඇරෝමා රබර් කර්මාන්ත ශාලාව, , ෆුඩ් සිටි මාවනැල්ල, , මාවනැල්ල රෝහල, සේෆ්වේ කර්මාන්ත ශාලාව, සපුමල් කර්මාන්ත ශාලාව, ජල සම්පාදනය කොට්ටාපිටිය, විජිත සමූහය
තොග සහ බෙදහැරීම් : කප්පාගොඩ, රබර් කර්මාන්ත ශාලාව - මාවනැල්ල
බෙදහැරීම් : , , , බෙලිගම්මන i, බෙලිගම්මන ii, හසන් මාවත, කොට්ටවත්ත, මාරාව, මාවනැල්ල නගරය, නාදෙනිය, නාත්කුරුගම, නයාවල , නව නත්කුරුගම, තකියා පාර , තකියා පාර නව උපපොල

2021-05-11 08:30-17:00
බෙදහැරීම් : කෝන්දෙනිය

2021-05-11 8:30-18:00
බෙදහැරීම් : නාත්කුරුගම

2021-05-12 09:00-17:00
තොග : කොඩිතුවක්කු ගල් වැඩපොල, , පහල කඩුගන්නාව ජල ප්‍රවාහන මණ්ඩලය, වින්ස්ලන්ඩ් රියලිටි ගොවිබිම
බෙදහැරීම් : හිඟුල්ඔය, නව මාකඩවර උඩුවැව, නව උපපොල හිඟුල

### නාවලපිටිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### ගම්පොල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-02 08:30-17:00
විදුලිය විසන්ධි කරනු ලබන ස්ථාන :
බෙදහැරීම් :

2021-05-02 09:00-12:00
තොග : ඩීන් සයිඩ් කම්හල - ගම්පොල
බෙදහැරීම් : බෝවල, බෝවේලා පන්සල, , කීරපනේ, මවුන්ට් ටෙම්පල්, උනන්බුව

2021-05-07 09:00-13:00
බෙදහැරීම් : , , , , , , , , තල්වතුර - ii, උඩෝවිට, , වෙලිගල්ල - ii

#### නාවලපිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-05 08:30-17:00
බෙදහැරීම් : ඉඟුරුඔය -II

2021-05-06 08:30-17:00
බෙදහැරීම් : කටුකිතුල

2021-05-08 08:30-17:00
බෙදහැරීම් : ඉඟුරුඔය -II

### නුවරඑළිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### වලපනේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-04 09:00-17:00
තොග : ඇපල් රිච් කර්මාන්තය
තොග සහ බෙදහැරීම් : බ්‍රෙමලිවත්ත, එල්මා වත්ත, හයිෆොරස්ට් කම්හල, මහකුඩගල කම්හල, මතුරට කුරුදුඔය (මතුරට කම්හල)
බෙදහැරීම් : වෙයාලි වැලි කොටස, ගලබොඩ - දුල්ගොල්ල - 1, ගලබොඩ ගම, ග්ලෙන්ඩවන් වත්ත, ගෝනාකැලේ, හයිෆොරස්ට් බංගලාව, ලොරිස්ටන්, මහකුඩගල, රිලාමුල්ල

2021-05-11 09:00-17:00
තොග : රාගල ජල පොම්පාගාරය
තොග සහ බෙදහැරීම් : බෲක්සයිට් වත්ත, ඩෙල්මාවත්ත, ලිඩස් වත්ත, රාගල නගරය -1, ශාන්ත ලෙනාඩ් වත්ත
බෙදහැරීම් : ඩික්සන් කෝනර්, හල්ග්‍රන්ඔය, මන්ත්‍රිතැන්න, රාගල නගරය - 1, රාගල නගරය 2, රාගල නගරය 3, සමගිපුර, ස්ටැෆර්ඩ් කම්හල

### පේරාදෙණිය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

#### ඊරියගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-06 09:00-17:00
තොග : මෙස්නා තේ මධ්‍යස්ථානය
බෙදහැරීම් : දියපලාගොඩ, ගිරාකන්ද, කෙහෙල්වල, කිරිබත්කුඹුර, , නව කිරිබත්කුඹුර (කිරිබත්කුඹුර හන්දිය), මොලදණ්ඩ, නානුඔය, රතවන ගම, සූරියගොඩ

#### යටිනුවර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-04 09:20-17:20
බෙදහැරීම් : ඇම්බැක්ක, ගගුල්දෙණිය (හිද්දවුල), හැපාන, , උරුලෑවත්ත

2021-05-06 09:30-17:30
තොග : මාලිගාතැන්න බූස්ටර් පොම්පාගාරය
තොග සහ බෙදහැරීම් : දඹගොඩ (ජල සැපයුම)
බෙදහැරීම් : මාමුඩුවෙල, වල්ගොව්වාගොඩ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත - 02), ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය.

විදුලි බලයෙන් සැසිරිමත් දිවියක්

ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක

ඩී. මිහිඳුකුල - කොච්චිකඩේ විශේෂ

# කොවිඩ්වලින් පීඩාවට පත් මීගමුවේ ධීවරයන්ට තුන්කෝටි හැටලක්ෂයක මූල්‍ය ප්‍රතිපාදන



දිසත
දස අත ම එක තැන

කොරෝනා වසංගතය හේතුවෙන් ජන ජීවිතය කඩා වැටුණු ධීවර වෘත්තිකයන්ට නැවත එම වෘත්තිය දියුණු කර ගැනීම සඳහා මීගමුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් රුපියල් කෝටි තුනයි ලක්ෂ හැටක මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් බව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය මහතා පැවසීය. බහුදින ධීවර යාත්‍රා මිල දී ගැනීමට හය දෙනකුට ද එන්ජින් මිල දී ගැනීමට හත් දෙනකුට ද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එක් අයකුට ද වශයෙන් මූල්‍ය ප්‍රතිපාදන පිරිනමන ලද බව එම බැංකුවේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත) සිසිල් ද සිල්වා මහතා පවසා සිටියේය.

මීගමුව වැල්ලවීදිය ඒකාබද්ධ ධීවර කාර්යාලයේ පැවති මේ උත්සව අවස්ථාවට බැංකුවේ සභාපති මහින්ද සාලිය, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි සිසිල් ද සිල්වා, සහකාර සාමාන්‍යාධිකාරි දීප්ති මහනාම, දිස්ත්‍රික් කළමනාකරු (ගම්පහ/ කොළඹ දිස්ත්‍රික්ක) ඩී. එම්. ඒකනායක, මීගමුව බැංකු කළමනාකරු එල්. ඩබ්ලිව්. ඩී. ආර්. නිශාන්ත යන මහත්වරු එක්ව සිටියහ.

ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

# වැල්ලවාය කොවිඩ් මර්දන කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම සූම් තාක්ෂණයෙන්

වැල්ලවාය නගරය ඇතුළු ග්‍රාමසේවා වසම් දෙකක් හුදකලා කිරීමත් සමඟ ජනතාව මුහුණපාන ගැටලු හා අවශ්‍යතා සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පෙරේදා (29) වැල්ලවාය ප්‍රාදේශීය කොරෝනා මර්දන කමිටුවේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් සූම් තාක්ෂණය ඔස්සේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් චන්දන රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. එහිදී මේ වන විට පවතින සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් අදහස් දක්වමින් වැල්ලවාය අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය මංජුල ඇපා මහතා පවසා සිටියේ නව ආසාදිතයන් 36ක් වැල්ලවාය ආශ්‍රිතව වාර්තා වී ඇති බවයි. ඒ අතර පසුගිය දිනවල සිදු කළ පීසීආර් පරීක්ෂණ 271ක ප්‍රතිඵල ලැබීමට නියමිතව ඇති බවත් තවත් සාම්පල 200කට අධික ප්‍රමාණයක් ලබා ගැනීමට සූදානම් කර ඇති බවත් ඒ මහතා කියා සිටියේය. හුදකලා කර ඇති ගම්මානවල ජනතාවට අවශ්‍ය ආහාර පාන මිල දී ගැනීම සඳහා ගම්මානවල ඇති ව්‍යාපාරික ස්ථානවලට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා වසමේ ග්‍රාම නිලධාරි සමෘද්ධි හා ආර්ථික සංවර්ධන නිලධාරීන්ගෙන් සැදුම්ලත් යාන්ත්‍රණයක් සකස් කර ඇති බව පැවසූ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් චන්දන රත්නායක මහතා වැඩිදුරටත් පවසා සිටියේ හුදකලා කර ඇති නගරයේ පිහිටි රාජ්‍ය ආයතන හා බැංකු ඇතුළු ආයතනවලට පැමිණීමට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපිය අවසර පත්‍රයක් ලෙස යොදා ගැනීම කළ යුතු බවයි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි එස්. එච්. පියසුමන මහතා පවසා සිටියේ පවතින තත්ත්වය පාලනය වන තුරු ජනතාව නිරන්තරයෙන්ම සෞඛ්‍ය ආරක්ෂිතව කටයුතු කළ යුතු බවත් සංචරණයන් හැකි තරම් සීමා කරමින් සෞඛ්‍ය අංශ වෙත සහාය දීමට කටයුතු කළ යුතු බවත්ය. වැල්ලවාය ප්‍රාදේශීය සභාවේ සභාපති ආර්. ඩී. හරමානිස් මහතා පවසා සිටියේ ප්‍රදේශයේ වාර්තා වන ඕනෑම මළ ගෙදරක් ආශ්‍රිතව විෂබීජහරණය කිරීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇති බැවින් ඒ සඳහා ජනතාව දැනුම්වත් කිරීම අවශ්‍ය බවයි. හුදකලා කර ඇති ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් ජනතාව දැනුම්වත් කිරීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගනිමින් ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කර ඇති බව පැවසූ වැල්ලවාය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. රත්නායක මහතා වැඩිදුරටත් පවසා සිටියේ ඇතැම් පුද්ගලයන් ගමන් බිමන් කටයුතු සිදු කිරීම දක්නට ඇති බැවින් ඉදිරි දිනවලදී මාර්ග බාධක ශක්තිමත් කිරීම සිදු කරනා බවයි.

නාඋල සමූහ

# අළුගොල්ල වසමේ ජනතාවට දසදහසේ බඩු මල්ලක්

හුදකලා කරන ලද නාඋල - අළුගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පුද්ගලයන් 133 දෙනකුට රුපියල් දසදහසක් වටිනා බඩු මළු බෙදා දී අවසන් බව නාඋල aප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රකාශ කළේය. රුපියල් 1,330,000.00ක මූල්‍ය වටිනාකමකින් යුතු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් මේ බඩු මළු අළුගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පදිංචි පවුල් සඳහා බෙදා දීමට නියමිත බව මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී නාඋල ප්‍රාදේශීය ලේකම් චින්තක ඉලංගසිංහ මහතා කියා සිටියේය. නාඋල - අළුගොල්ල ග්‍රාම නිලධාරි වසම කෝවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් හුදකලා කර තිබූ අතර පසුගියදා (28) වන විට කෝවිඩ් ආසාදිත පවුල් සංඛ්‍යාව 28 දක්වා ඉහළ ගොස් තිබිණි. නාඋල ප්‍රදේශයේ ව්‍යාප්ත වන කෝවිඩ් වයිරස් තත්ත්වය පාලනය කිරීම සඳහා නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය, නාඋල ප්‍රාදේශීය සභාව, නාඋල සමෘද්ධි මහ සංගමය ඇතුළු රාජ්‍ය ආයතන රැසක් එක්ව මේ විශේෂ වැඩපිළිවෙළ ක්‍රියාවට නංවා තිබිණි.

ඩබ්ලිව්. විදානපතිරණ - ඇඹිලිපිටිය සංචාරක

# හොර මත්පැන් වැටලීම්වලින් 24කට දඩ

ඇඹිලිපිටිය සුරාබදු කාර්යාලය මඟින් තම බල ප්‍රදේශයේ පසුගියදා සිදු කළ වැටලීම්වලදී හොර සුරා ජාවාරම්කරුවන් 24 දෙනකු ග්‍රහණයට ගෙන ඇඹිලිපිටිය අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණයට නඩු භාණ්ඩ සමඟ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන් වරද පිළිගැනීම හේතුවෙන් එම වැරදිවලට අදාළව ඔවුන්ට රුපියල් එක් ලක්ෂ අසූදහසක (රු.180,000) දඩ නියම විය.

මේ වැටලීම්වලදී ඉත්තකන්ද, තුංකම, සූරියකන්ද, ඕමල්පේ, කොළොන්න ප්‍රදේශවලදී කසිප්පු පෙරූ 06ක්, කසිප්පු මි.ලී. 15,750ක් සහ පෙරීමේ උපකරණ සමඟ ද, කසිප්පු විකුණූ 16ක්, කසිප්පු මි.ලී. 31,900 ක් සමඟ ද, රජයේ අනුමත අරක්කු සහ බියර් බලපත්‍ර නැතිව විකුණූ 02ක් ද ග්‍රහණයට ගෙන තිබේ. මෙහිදී කසිප්පු පෙරූ 06 දෙනාට එක් අයකුට රු. 15,000 බැගින් රු.90,000ක් ද කසිප්පු විකුණූ 16 දෙනාට එක් අයකුට රු. 5000 බැගින් රු. 80,000ක් ද අරක්කු සහ බියර් විකුණූ දෙදෙනාට එක් අයකුට රු. 5000 බැගින් රු. 10,000 ක් ද වශයෙන් දඩ නියම කර තිබිණි. මේ වැටලීමට ඇඹිලිපිටිය සුරාබදු ස්ථානාධිපති සුරාබදු පරීක්ෂක ආර්. ඒ. සරත්චන්ද්‍ර මහතා ඇතුළු එම කාර්යාලීය නිලධාරීහු එක් වී සිටියහ.

ඩබ්ලිව් රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

# අසරණ පවුලකට දානපතියන් තිදෙනකුගෙන් අතහිත



දැරණියගල, මාලිබොඩ, මහයාය, ගලපලවත්ත පදිංචි අඩුආදායම්ලාභී පවුලක් වන රුක්මන් අනුර කුමාර මහතා ඇතුළු පවුලේ අය සඳහා ස්වශක්තියෙන් නැඟීසිටීමට වෙළෙඳසලක් පවත්වා ගෙන යෑම සඳහා බියගම පදිංචි කේ. කස්තුරු ආරච්චි, ශාන්ත කුමාර හා ඉනෝකා ප්‍රියන්ති යන අය විසින් රුපියල් ලක්ෂ 3ක පමණ ද්‍රව්‍යමය ආධාර පරිත්‍යාගයක් පසුගියදා සිදු කරන ලදි. දැරණියගල පේරුපල්ල ශ්‍රී අභිනවාරාම විහාරයේ විහාරාධිපති අවිස්සාවේල්ල වග ශ්‍රී වජිර වංශ හිමියන්ගේ අවවාද අනුශාසනා පරිදි මෙය සිදු කර තිබිණි.

එම්. පී. කුමාර - කොටදෙණියාව සමූහ

# රාමඤ්ඤ මහ නිකායේ මහ නාහිමි අක්තපත්‍ර ප්‍රදානය කල් යයි

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ මහ නාහිමියන් එම පදවියට පත් කිරීම සම්බන්ධයෙන් වන අක්තපත්‍ර ප්‍රදානය කිරීම නිමිත්තෙන් ලබන 7 වැනිදා කොළඹදී පැවැත්වීමට නියමිතව තිබූ රාජ්‍ය උත්සවය දින නියමයක් නැතිව කල් දමා තිබේ. පවත්නා කෝවිඩ් තත්ත්වය හේතුකොටගෙන මේ පියවර ගෙන ඇති අතර ඒ බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා සහ බෞද්ධ කටයුතු කොමසාරිස් සුනන්ද කාරියප්පෙරුම මහතා විසින් මීරිගම මිනිඔළුව විද්‍යාවාස පිරිවෙනේදී මහ නාහිමියන් වෙත නිල වශයෙන් දැනුම් දෙන ලදි.

අක්තපත්‍ර ප්‍රදානයෙන් අනතුරුව 9 වැනිදා මිනිඔළුව විද්‍යාවාස පිරිවෙනේදී පැවැත්වීමට නියමිතව තිබූ මහ නාහිමියන් පිළිගැනීමේ උත්සවය ද නොපැවැත්වීමට විහාරස්ථ දායක සභාව පුමුඛ සංවිධායක කමිටුව තීරණය කර තිබේ.

චන්ද්‍රතිලක රත්නායක - ඉබ්බාගමුව විශේෂ

# මුල්ලේගම සුමනවංස හිමිගේ ජන්ම දිනයට රෝගී අයියා-නගෝ දෙපළකට නව නිවෙසක්





ඉබ්බාගමුව පොල්ගොල්ල නැෂනල්වත්ත ශ්‍රී බෝධිරාජ විහාරයේ අධිපති මුල්ලේගම සුමනවංස හිමියන් විසින් තම 64 වැනි ජන්ම දිනය නිමිත්තෙන් උන්වහන්සේගේ මූලිකත්වයෙන් සහ මඟපෙන්වීම යටතේ ප්‍රදේශයේ දානපතියන්ගේ දායකත්වයෙන් කුඩා පැල්පතක ජීවත්වූ අසරණ පවුලක් වෙනුවෙන් නිවෙසක් ඉදි කර ඔවුන් වෙත පිරිනැමීම පසුගියදා සිදු කර තිබිණි. කුරුණෑගල -මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරයාය ග්‍රාම නිලධාරි වසමේ බඩගමුව ගම්මානයේ කිසිවකුගේ ආධාරයක්, උපකාරයක් නැතිව ජීවත් වූ ශාරීරික හා මානසික දුබලතාවකින් පෙළෙනා එක කුස උපන් සොයුරකුට සහ සොයුරියකට මේ නව නිවෙස පිරිනමනු ලැබිණි. එස්. ඒ. සුනිල් ජයසූරිය නමැති සොයුරාගේ වයස අවුරුදු 59කි. ඔහුගේ නැඟණිය වූ එස්. ඒ. චන්ද්‍රලතාගේ වයස අවුරුදු 56කි. ඔවුන්ගේ මවුපියන් ජීවතුන් අතර නැති අතර සමෘද්ධි සහනාධාරයෙන් එදා වේල සරිකර ගෙන ඇති මේ සොයුරා සහ සොයුරිය කටුමැටි ගැසූ පැල්පත තුළ මෙතෙක් ජීවත් වූයේ දහසකුත් එකක් දුක් කරදර විඳිමිනි. නිවෙස සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ ද පරිත්‍යාගශීලීන් විසින් පිරිනමා තිබිණි. නිවෙසට අවශ්‍ය විදුලිය නොමිලේ ලබාදීමට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය මඟින් කටයුතු කරගෙන යන බව ද විහාරාධිපති හිමියෝ පැවසූහ. මේ අවස්ථාව සඳහා දිඹුල ආරණ්‍ය සේනාසනයේ දොළුවේ ධම්මරතන හිමියෝ ද සහභාගි වී සිටියහ.

මෙහිදී අනුශාසනාවක් කළ දිඹුල ආරණ්‍ය සේනාසනයේ ධම්මරතන හිමියෝ,

"ලක්ෂ ගණනින් වියදම් කොට ඇතැම් උදවිය උපන්දින සාද පවත්වන සමයක දුප්පත් අසරණ පවුලකට හිසට සෙවණක් ලබාදීමට සුමනවංශ හිමියන් තීරණය කිරීම ඉතාමත් උදාර කටයුත්තක්. මෙවැනි අසරණ පවුල් මේ රටේ තවත් සිටිනවා. හිස් උපන්දින සාද නොපවත්වා මෙවැනි අසරණ පවුල් සඳහා පිහිට වන ලෙස මා ලක්වාසී සැදැහැවතුන්ගෙන් ඉල්ලා සිටිනවා."

ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# වෙන්නප්පුවේ සුපිරි වෙළෙඳසලකින් විස්කි බෝතල් තුනක් උස්සලා

වෙන්නප්පුව නගරය තුළ පවත්වාගෙන යනු ලබන සුපිරි වෙළෙඳසලක් බිඳ එහි අලෙවියට තබා තිබූ විස්කි බෝතල් තුනක් සොරාගෙන ගිය බවට පැමිණිල්ලක් ලද බව වෙන්නප්පුව පොලිසිය ප්‍රකාශ කළේය. කිසියම් පිරිසක් විසින් වෙළෙඳසලේ ඉදිරිපස වීදුරු දොරටුව බිඳ දමා ඇතුළු වී එහි සවි කර තිබූ සීසීටීවී කැමරා පද්ධතියට හානි කර ඇති අතර පසුව එම දර්ශන පටිගත වන යන්ත්‍රයද ගලවාගෙන ගොස් තිබේ.

එක් අයකු හෝ කණ්ඩායමක් මේ කොල්ලය සිදු කර ඇති අතර මෙහි ලාච්චුවල කිසිදු මුදලක් නොතිබීම හේතුවෙන් දුම්වැටි පැකට් තුනක් හා විස්කි බෝතල් තුනක් ද රැගෙන ගොස් ඇත. මේ වෙළෙඳසලේ භාණ්ඩ අඩුවක් ඇද්දැයි සෙවීම පිණිස භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර සිදු වූ මුළු පාඩුව පසුව දැනුම්දෙන බවට එම වෙළෙඳසල් පාලනාධිකාරිය පොලිසියට දන්වා ඇත. වෙන්නප්පුව පොලිසියේ අපරාධ විමර්ශන ඒකකය තවදුරටත් පරීක්ෂණ සිදු කරයි.

ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# හලාවත ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

කෝවිඩ්වලට සාර්ථකව මුහුණදී සිය ජීවිත ආරක්ෂා කරගත හැකි මාර්ග සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් රැසක් මේ දිනවල හලාවත පොලිසිය මඟින් ක්‍රියාත්මක කර තිබේ. මේ අනුව හලාවත නගරය තුළ පිහිටි ජනතාව බහුලව ගැවසෙනා පොදු එළවළු වෙළෙඳපොළ භූමිය, පෞද්ගලික හා ලංගම බස් රථ නැවතුම්පලවල් මෙන්ම මුන්නේශ්වරම පුද බිම තුළ ද මේ වැඩසටහන් ක්‍රියාත්මකය.

මේ දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලට උසස් පොලිස් නිලධාරීන් ද එක්ව තිබේ.



කේ. ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

# අම්පාර මොරගහපල්ලම විදුහලේ සිසු නියමු අබිසෙස් මංගල්‍යය

අම්පාර දිස්ත්‍රික්කයේ දමන කොට්ඨාස අධ්‍යාපන කලාපයට අයත් අම්/මොරගහපල්ලම විද්‍යාලයේ 2021 වර්ෂය සඳහා 'සිසු නියමු අබිසෙස් මංගල්‍යය' අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යාපන පරිපාලන අධ්‍යක්ෂ හා දමන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ අශෝක පතිරණ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අම්/මොරගහපල්ලම විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී විදුහල්පති ජී. එම්. ඒ. රත්නසිරි මහතාගේ අධීක්ෂණය හා මෙහෙයවීම මත සිදු කෙරිණි. මෙදින හිටපු ශිෂ්‍ය නායක මණ්ඩලය වෙත ඉතා වටිනා සහතිකපත් ප්‍රධානය කිරීමක් ද විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදි. 2021 වර්ෂය සඳහා 1-5 ශ්‍රේණි අතරින් ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා සිසු දරුවන් 12ක් සහ 6-13 ශ්‍රේණි වෙනුවෙන් සිසුන් 27කට ශිෂ්‍ය නායක නායිකාවන් ලෙස නිල ලාංඡන පලඳවන ලදි.

මේ සිසු නියමු අබිසෙස් මංගල්‍යය සඳහා අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජ අධ්‍යාපන පරිපාලන අධ්‍යක්ෂ අශෝක පතිරණ මහතා, සීවලී විද්‍යාලයේ විදුහල්පති කේ. ජී. ඉන්ද්‍රසේන මහතා, හිඟුරාණ මහා විද්‍යාලයේ විදුහල්පති ආර්. පත්මසිරි මහතා, කොක්නහර විද්‍යාලයේ ඉංග්‍රීසි විෂය භාර උදය මහතා, ව්‍යාපාරික බන්දුල රණවීර මහතා, විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය සහ මවුපියෝ ද එක්ව සිටියහ.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත
## 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය
## මැතිවරණ කොට්ඨාස අංක : 19 - බදුල්ල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉන්දික හතුරුසිංහ,**
**සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,**
**මැතිවරණ කොට්ඨාස අංක 19- බදුල්ල.**

**2021 අප්‍රේල් මස 30 වැනි දින,**
**බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.**

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත
## 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය
## මැතිවරණ කොට්ඨාස අංක : 21 - රත්නපුර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**සුරංග අඹගහතැන්නෙ,**
**සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,**
**මැතිවරණ කොට්ඨාස අංක 21-රත්නපුර.**

**2021 අප්‍රේල් මස 30 වැනි දින,**
**රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.**

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල
පළවූ හා පළනොව ඡායාරූපවල දළ
සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත.
ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය
නම් පුවත්පතේ නම, දිනය සහ
ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා
හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත
## 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය
## මැතිවරණ කොට්ඨාස අංක : 22 - කෑගල්ල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**එස්.ඩබ්ලිව්. වෙල්ගම,**
**සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,**
**මැතිවරණ කොට්ඨාස අංක 22- කෑගල්ල.**

**2021 අප්‍රේල් මස 30 වැනි දින,**
**කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.**

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත
## 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය
## මැතිවරණ කොට්ඨාස අංක : 20 - මොණරාගල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉන්දික ගයාන් පතිරණ,**
**සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,**
**මැතිවරණ කොට්ඨාස අංක 20- මොණරාගල.**

**2021 අප්‍රේල් මස 30 වැනි දින,**
**මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

# මධ්‍යම පළාත 1 - 2021 මැයි මාසය

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : දඹුල්ල

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : දඹුල්ල

2021-05-05 වේලාව : 09:00-17:00

**තොග** : හෝටල් සංකීර්ණය කන්ඩලම, හොටෙල් ව්‍යාපෘතිය - නව (කාශ්‍යපගම), රංගිරි හාල්මෝල, ඇල්චෙමි හෙවි මෙට්ල්, අප්සරා හෝටලය, මාස් ට්‍රොපිකල් ෆුඩ් නිෂ්පාදන, වසන්ත හාල් මෝල, සෙල්ටෙල් කුලුන

**බෙදාහැරීම්** : කොලොන්ගහ ඇළ - 1 (කන්ඩලම පාර), මහසෙන්ගම, කන්ඩලම පාර 1 වෙනි සැතපුම් කණුව, සීගිරිය හෝටලය, විල්හත (29 කොටස), දඹුල්ල සංවර්ධන සැලැස්ම, ඇරැව්වල, පිහිල්ල මූකලාන, ඇරැව්වල 1 කණ්ඩලම පාර 2 වෙනි සැතපුම් කණුව, කන්ඩලම වැව, යක්කුරුගල, කාශ්‍යපගම, තල්කොටේ යෝජනා ක්‍රමය, දියකැපිල්ල

2021-05-08 වේලාව : 09:00-17:00

**තොග** : K.T.R.-H.M.N.G. මොහොමඩ් හාල් මෝල මොරගොල්ලාව), KTC හාල් නිෂ්පාදකයෝ, ලංකා පොලිසැක් (2), නිෂාම් (ජයවර්ධන) හාල් මෝල, පෙරේරා හෝටලය - නව, අයේෂා හාල් මෝල, කල්චරල් හෙරිටේජ් සහ ස්පා, ටාටා සහ මිඩ්ලන්ඩ් හාල් මෝල, දඹුලුඔය හාල් මෝල, තිලංකා හෝටලය, ජේ.සි ගම්මානය, වික්ටෝරියා හාල් මෝල, ලංකා ප්ලාස්ටික් (පොලිසැක් - 1), දිල්රුක්ෂි ගොවිපල

**බෙදාහැරීම්** : ආදාහනමළුව, බිංතඹර යෝජනා ක්‍රමය දඹුල්ල, රත්මල්ගහ ඇල 1, තිත්තවැල්ගොල්ල, තිත්තවැල්ගොල්ල 11, යාපාගම, දඹුල්ල - යාපාගම, මැදමුල්ල යෝජනා ක්‍රමය, පුවක්අත්තාවල 1, රත්මල්ගහඇල 2 (කුඩාගම්මානය), යාපාගම සියඹලාවැව යෝජනා ක්‍රමය, පුවක්අත්තාවල 11, කිරිගොල්ල වීහේන්පිටිය, පහලවැව යාපාගම

2021-05-12 වේලාව : 09:00-17:00

**තොග** : සීගිරිය ඩයලොග් කුලුන - කායංවල, ෆොන්ටයින් බ්ලූ සීගිරිය (පුද්) සමාගම, විල්උයන (රෝයල් හෙරිටේජ්), ගුවන් හමුද කඳවුර, සීගිරිය තානායම - නව, ඇහැලගල ලේක් රිසෝට්, ප්‍රේස්කෝ වෝටර් විලා, සීගිරිය විලේජ් හෝටලය, අප්සරා හෝටලය, ටෙලිකොම් සීගිරිය, ෆලවර් ගාර්ඩ්න්, හොටෙල් ව්‍යාපෘතිය - නව (කාශ්‍යපගම), සීගිරිය තානායම, එලිෆන්ට් කොරිඩො හෝටලය

**බෙදාහැරීම්** : සීගිරිය හෝටලය, කිඹිස්ස, මහසෙන්ගම, මයිලත්තාව/ කලාපුරයාය සීගිරිය, දියකැපිල්ල, ගල්කොටුව, රන්ගිරිගම, එගොඩවැව දඹුල්ල, සීගිරිය ( නව නගරය), සීගිරිය තෙන්නකෝන් මාවත එලගල පාර, වැව අද්දර - කායන්වල, කෑගල්ලයාය -2 මයිලත්තාව, සීගිරිය නව කෞතුකාගාර යෝජනා ක්‍රමය, කාශ්‍යපගම, කායම්වල දුවන්ගල, තල්කොටේ යෝජනා ක්‍රමය

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : පල්ලෙපොල

2021-05-03 වේලාව : 09:00-17:00

**තොග** : අළුත්වේ එටිසලාට් සහ ඩයලොග් කුලුන

**බෙදාහැරීම්** :, චීන රාජ්‍ය ඉදිකිරීම් (පුවක්පිටිය), බම්බරගස්වේවා - අයි, නිලගම, නිලගම හකිරිලා, අළුත්වේවා එගොඩයා

2021-05-04 වේලාව : 09:00-17:00

**බෙදාහැරීම්** : ගලේවෙල පොළ, ගලේවෙල නගරය (පීපල්ස් බිනාක් අසල), ගලේවෙලා නගරය (පාත්කොලගොල්ල පාර), පුවාක්පිටියා ආර්ඊ, ගලේවෙල නගරය නව, ආහාර නගරය - ගලේවෙල, රන්වෙදියාව, බම්බාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දඹගොල්ල, ගලේවෙල පට්කොලා බස් නැවතුම), කලහකලේ සීබීඕ

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : ගලගෙදර

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නුගවෙල

2021-05-04 වේලාව : 09:00-17:00

**තොග** : ලං.ග.ම. නුගවෙල

**බෙදාහැරීම්** : බටුඅඹේ, එඩරුතැන්න

2021-05-08 වේලාව : 09:00-17:00

**තොග** : ඩෙල්මා ලංකා (පුද්.) සමාගම, ඩෙල්මා ගිනිපෙට්ටි කර්මාන්ත ශාලාව,

**තොග සහ බෙදාහැරීම්** : බෝලගල

**බෙදාහැරීම්** : විගුහුම්පොල, අලදෙනිය නගරය, පල්ලේකොටුව, පල්කුඹුර ජල ව්‍යාපෘතිය, පල්කුඹුර, බෙරනගම

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : පූජාපිටිය

2021-05-04 වේලාව : 09:00-17:00

**බෙදාහැරීම්** : මිරිස්සල අඹතැන්න, මිරිස්සල ලීමෝල

2021-05-08 වේලාව : 09:00-17:00

**බෙදාහැරීම්** : මිරිස්සල අඹතැන්න, මිරිස්සල ලීමෝල

2021-05-13 වේලාව : 09:00-17:00

**බෙදාහැරීම්** : මිරිස්සල ලීමෝල, මිරිස්සල අඹතැන්න

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : නුවර නගරය

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය :

2021-05-06 වේලාව : 08:30-16:30

**බෙදාහැරීම්** : නවයාලතැන්න

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : කටුගස්තොට

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : වත්තෙගම

2021-05-06 වේලාව : 08:30-16:30

**තොග** : මහවැලි අධ්‍යාපන විද්‍යාලය, පල්ලෙගුන්නෑපාන සමුපකාරය, ජල සම්පාදන මණ්ඩලය (හයි ලිෆ්ට්) පොල්ගොල්ල, සෙලින්කෝ සසෙක්ස් විද්‍යාලය - පොල්ගොල්ල, මහවැලි වේල්ල පොල්ගොල්ල, , වයිරස් ලැබ් පොල්ගොල්ල, ජල සම්පාදන මණ්ඩලය( ලෝ ලිෆ්ට්) පොල්ගොල්ල

**බෙදාහැරීම්** : දෙරගමුව හන්දිය, ඩයලොග් බේස් ස්ටේෂන් පහල ගුන්නෑපාන, ලේවැල්ල සිරිමල්වත්ත, උඩුගුන්නෑපාන, පල්ලෙගුන්නෑපාන,

2021-05-11 වේලාව : 08:30-16:30

**තොග** : ලං.ග.ම. වත්තේගම, , බංගලාගෙදර, එන්.අයි.සී.ඩී. ගොඩනැගිල්ල, ඩී.සී.එස්.එල්., ඩී.සී.එස්. එල්./පිඑල්සි, පල්ලේතලවින්න ගාමන්ට් (පෙන්ගුයින්)

**බෙදාහැරීම්** : මීගම්මන පේෂකර්මාන්තය, තුංකඳුර, උඩතලවින්න ඩයලොග් බේස් ස්ටේෂන්, උඩතලවින්න නව, ගලදෙනිය, ගල්අම්බලම, මඩවල මුස්ලිම් පල්ලිය, වලඅරඹ, මීගම්මන උතුර, වත්තේගෙදර, රෝයල් කිං ඩම්, 1 වෙනි සැතපුම් කණුව පුවක්ගහදෙනිය, දූන්කොළවත්ත, ඕඩිල්ලෝව, සර්වෝදය, වියනමුල්ල, වාසනාකන්ද, දෙරගමුව, පොල්ගොල්ල නගරය

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : කුණ්ඩසාලේ

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : දුම්බර

2021-05-03 වේලාව : 08:30-17:00

**තොග** : අඹගහලන්ද ගම්මැද්ද

2021-05-04 වේලාව : 08:30-17:00

**තොග** : කුඹුක්කඳුර පල්ලිය පාර

**බෙදාහැරීම්** : දනනන්දන ලී මෝල

2021-05-04 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : දුම්බර ඊසීඑස්සී, කුන්ඩසාලේ ප්‍රාදේශීය සභාව, සත් මැච් රාජවෙල්ලා (අළුත්වත්ත)

2021-05-08 වේලාව : 08:30-17:00

**තොග** : අලුත්වත්ත - ii, A.R.M බිල්ඩර්ස්

**බෙදාහැරීම්** : සමරසිංහ ඩොලමයිට්, අලුත්වත්ත - i, නිහාල් ඩොලමයිට්

2021-05-09 වේලාව : 08:30-17:00

**තොග** : ජෙටිකා කලා නිකේතනය, ටෙලිකොම් - කුණ්ඩසාලේ, කාර්මික කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය

**බෙදාහැරීම්** : සාසා නිවාස යෝජනා ක්‍රමය, ජනසවිගම-ii, ලක්සෙන්පාය හමුද කඳවුර, ජනසවිගම, පල්ලේකැලේ සෝයා ව්‍යාපෘතිය ii, , පල්ලේකැලේ හමුද කඳවුර, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය, පල්ලේකැලේ ගම්මානය, ප්‍රයිම් ලැන්ඩ් රෙසිඩන්ස්, පලාත් සභා කාර්යාලය, ස්මාර්ට් ෂර්ට් ඇඟලුම් කම්හල, පල්ලේකැලේ සෝයා ව්‍යාපෘතිය i

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : හසලක

2021-05-03 වේලාව : 08:00-17:00

**බෙදාහැරීම්** : 2 වන සැතපුම් කණුව, 9වෙනි සැතපුම් කණුව අඹගහපැලැස්ස, , කපුවත්ත 25 ඇල, කොලොන්යාය, මොරයාය, පරගහමූකලාන, වේරගම, බුලත්වැල්කඳුර, මිනිපේ 12 ඇල, වේරගන්තොට, 34 ගලේවත්ත රබර්වත්ත, 6 වෙනි සැතපුම් කණුව (අඹගහපැලැස්ස), කොටිකාපොලලන්ද, රත්දෙනිගල ඩැම් පෙදෙස, ලං.වි.ම. කඳවුර රන්ටැඹේ, බැමිය, මහවැලි ගොඩනැගිලි ප්‍රදේශය රත්දෙනිගල, පල්ලේවත්ත 11 (47 ඇල), උඩයාගල, පල්ලේවත්ත -i, , N.C.C කඳවුර රන්ටැඹේ, 7 වෙනි සැතපුම් කණුව (අඹගහපැලැස්ස), බටුවත්ත, , හඳගනාව ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රමය, 5 වන සැතපුම් කණුව, 33 ඇල - ගලේයාය ජල ව්‍යාපෘතිය, රඹුකේඇල 29 ඇල යෝජනා ක්‍රමය, තණකොටුව

2021-05-03 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : පල්ලවත්ත - අයි, කොටිකා පොලාලන්ද, පල්ලෙවත්ත II (47 එල), බුලත්වෙල්කන්දුරා, පරගහමුකලන, වේරගම, වේරගන්තොට, හරිස්පත්තුව සහල් මෝල, එස්ඩී සහ සීසී, බටුවත්ත

2021-05-07 වේලාව : 09:00-17:00

**තොග** : 2 ඇල

**බෙදාහැරීම්** : මහඅස්වැද්දුම, කාර්මික විද්‍යාලය - හසලක, තෝරපිටිය වැල්ගහවාඩිය, රණමුරේ, තෝරපිටිය ඉලුක, රත්නැල්ල දඹවැල්ගොල්ල, හසලක ඇල්හේන, කීනපැලැස්ස, නාරන්ගමුව

2021-05-10 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : මල් රණවීර මාවත, ගුරුළුපොත, ගුරුළුපොත සහල් මෝල

2021-05-11 වේලාව : 09:00-17:00

**තොග** : අබේනායක ගල් මෝල, දමිත් ගල්මෝල - ගුරුවෙල යාය

**බෙදාහැරීම්** : Dewagiriya, කුඹුකන්දන, ගුරුවෙලයාය යෝජනා ක්‍රමය, මාරක, රදුන්නේවැව යෝජනා ක්‍රමය, මල්ගම්මන, දේවගිරිය එගොඩගම, දුනුවලපිටිය ගහේයාය, මැදකන්ද, බෝගස්වැව අංක 02 යෝජනා ක්‍රමය, මාරක ගහේයාය, , ජල පිවිසුම - දුණුවලපිටිය

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : කරලියද්ද

2021-05-06 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : සිරි දිගනා, වටපාන, පුටුහපුව, උඩිස්පත්තුව නගරය - ii, රත්මුල්ල, ඉස්කොලාමුදන, පොඩල්ගොඩ, හීල් ඔයා වටගල කෝටාසා, ඊඩන් ග්‍රෝව්, කන්දකුම්බුර රෙටියාගම

2021-05-10 වේලාව : 08:00-17:00

**තොග** : තෙල්දෙණිය රෝහල

**බෙදාහැරීම්** : රඹුක්වැල්ල, යුරෝ ෆැෂන්, ක්‍රිස්ටල් ෆැක් - ii, කරල්ලියද්ද නව නගරය, පහුරුගොල්ල (රඹුක්වැල්ල), තෙල්දෙණිය පවර්ලූම් (ක්‍රිස්ටල් ෆැක් - i)

2021-05-10 වේලාව : 08:30-17:00

**තොග** : තෙල්දෙණිය රෝහල

**බෙදාහැරීම්** : කරල්ලියද්ද නව නගරය, පහුරුගොල්ල (රඹුක්වැල්ල), තෙල්දෙණිය පවර්ලූම් (ක්‍රිස්ටල් ෆැක් - i), ක්‍රිස්ටල් ෆැක් - ii, යුරෝ ෆැෂන්, රඹුක්වැල්ල

2021-05-11 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : උදවේලා, පහුරුගොල්ලා බංග්ලෝ, පාහුරුගොල්ල ගම්මානය, වෙගල - අයි, වෙගල කපුහේනා - ii,

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : උඩුදුම්බර

2021-05-04 වේලාව : 08:00-17:00

**තොග** : මහවෙල, මැදිවක ගංගොඩ

**බෙදාහැරීම්** : නව මඩුගල්ල, උඩපිටවල, එයාර් ටෙල් කුලුන ගලපිටමඩ - මඩුගල්ල, දේවහන්දිය, මඩුගල්ල, මැටිවලතැන්න, කලල්ගමුව, කළුන්තැන්න, පල්ලෙ පිටවල, හපුකන්ද, කලවල, ගලපිටගම මිනුවන්ගමුව, උඩදුම්බර - කලවැල්ල

2021.05.10 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : උඩදුම්බර, තම්මිටියාව, පොපිටි - අයි, ඔයතන්න පොපිටි, පොපිටි - ii,

2021.05.11 වේලාව : 8.30-17.00

**බෙදාහැරීම්** : මැද මහනුවර රෝහල, දෙඩම් ගොල්ල, වේවත්ත රාජවෙල්ලා සිට වේවතෙන්න, මේදමහන්වරා, තේනාලන්ද

2021-05-12 වේලාව : 08:30-17:00

**බෙදාහැරීම්** : වැවතැන්න රජවැල්ල, දෙඩම්ගොල්ල

### විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : මාතලේ

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මාතලේ

2021-05-04 වේලාව : 08:00-17:00

**තොග** : ටෝයෝ ප්ලාස්ටික්, ටෙලිකොම් උකුවෙල

**බෙදාහැරීම්** : තවලන්කොය, නාගොල්ල, උකුවෙල නගරය, මාරුකොනවත්ත එයාටෙල් කුලුන,

2021-05-06 වේලාව : 09:00-17:00

**තොග** : ජල පිවිසුම (තුළුමග), ජල පවිත්‍රාගාරය

2021-05-09 වේලාව : 09:00-17:00

**තොග** : ජල පිවිසුම (තුළුමග), ජල පවිත්‍රාගාරය

2021-05-11 වේලාව : 08:00-17:00

**තොග** : ටෙලිකොම් උකුවෙල, ටෝයෝ ප්ලාස්ටික්

**බෙදාහැරීම්** : මාරුකොනවත්ත එයාටෙල් කුලුන, තවලන්කොය, උකුවෙල නගරය, නාගොල්ල

#### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : වේරගම

2021-05-07 වේලාව : 09:00-17:00


**බෙදාහැරීම්** : පොල්වත්ත කන්ද -1, කඩුව ගම්මානය, වෙනිවැල්ගොල්ල, පොල්වත්ත කන්ද - 11,

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත - 01), ලංකා විදුලිබල මණ්ඩලය, නො. 04, අස්ගිරිය පාර, මහනුවර.**

*විදුලි බලයෙන් සැපිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT



LAKE HOUSE


තරුණී
කාලීන දැනුම | මැහුම් | ගෙතුම් | අත්කම් | අතිරේක
දශක පහක් පුරා - කාන්තා නැණ පහන් දැල්වූ
කාන්තා පුවත්පත

## නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කය, වේල්ලවීදිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1B/F3/U7 මුවදෙර උයන ෆර්ගියුෂන් පාර, කොළඹ 15 පදිංචි **පාක්කියසාමි තිමලා** නමින් හැඳින්වූ මා මෙතැන් පටන් **පාක්කියසාමි නිරූෂියා** යන නමින් හඳුන්වන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට - P. නිරූෂියා**

ලුහුඬු දැන්වීම්
රැකී රක්ෂා



325

**ඇබෑර්තු**

විවිධ

ආරක්ෂක නිලධාරී / OIC - වැටුප් රු. 38000/- ආපාර්ට්මන්ට් - ගල්කිස්ස, දෙහිවල, අත්තිඩිය, කිරුළපන රෙස්ටුරන්ට් - බොරැල්ල - විශේෂ දීමනා. 0772205009 031717

## වාසගම් හෝ නම් වෙනස් කිරීම්

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල නගරය කොට්ඨාසයේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛන අංක 2405 යටතේ මගේ පුතාගේ නම **මොහොමඩ් ෂහීඩ් ඉම්බ්‍රම්** යනුවෙන් සඳහන් කොට තිබුණද. මින් ඉදිරියට මගේ පුතාගේ නම **තුවාන් ෂහීඩ් ඉම්බ්‍රම් (Thuwan Shaheed Imbram)** යනුවෙන් භාවිත කරන බව රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. **තුවාන් ෂහීඩ් ඉම්බ්‍රම් (Thuwan Shaheed Imbram)** පුතා වෙනුවෙන්

පියා වන **තුවාන් හයිසූර් ඉම්බ්‍රම්**,
අංක-479/G, රෂිමා පටුමග, පස්සර,
ග්‍රාමනිලධාරී වසම 88L පස්සර නගරය
නැගෙනහිර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පස්සර.

---

**1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011) 2 242 9491**

LAKE HOUSE

---

### දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර

# ලංසු සඳහා ආරාධනයයි

## පයාගල අම්බෙ සිට මුහුදට බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීම

### (අවසන් අදියර) - 2021

1.1) පයාගල අම්බෙ සිට මුහුදට වැසි ජලය බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීම (අවසන් අදියර) - 2021 සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 15.3 ක් (වැට් නොමැතිව) වන අතර, ඉදිකිරීම් කාලය **මාස 05 කි.**

1.2) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සීඩා) විසින් සංවර්ධිත, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ හා ශ්‍රේණිගත කිරීමේ යෝජනාක්‍රමය යටතේ, C04, C05 හා C06 හෝ **ඉහළ (වැසි ජලය බැහැර කිරීම)** ශ්‍රේණියක් සතු ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙත ටෙන්ඩර් ලේඛන නිකුත් කරනු ලැබේ.

1.3) **ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු රුපියල් පන්දහසක් (රුපියල් 5,000.00) ගෙවීමෙන්, කළුතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී** වෙතින් පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් ලේඛන ලබාගත හැකි අතර, **ලංසු ඇපකරය වශයෙන් රුපියල් එක් ලක්ෂ පනස් පන්දහසක් (රුපියල් 155,000/=) වටිනා දින 77 ක් දක්වා වලංගු බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.**

1.4) අදාළ ලංසු ලේඛන, **2021.04.30 දින සිට 2021.05.20 දින දක්වා,** සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී **පෙරවරු 9.00 හා පස්වරු 2.30 අතර** කාලය තුළ රාජකාරී දිනවල, සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී නිකුත් කරනු ලැබේ. (ඇමතුම් අංක 034-2222604, ෆැක්ස් - 034-2226467).

1.5) ටෙන්ඩර් ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි අතර, අවශ්‍ය වැඩි විස්තර **කළුතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැක.**

1.6) පිටපත් දෙකක් වශයෙන් සකස් කොට සම්පූර්ණ කළ ටෙන්ඩර් **සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර** යන ලිපිනයට යොමු කොට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන්, **2021.05.21 දින පෙරවරු 10.00 ට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලැබී ඇති ටෙන්ඩර් එදිනම පෙරවරු 10.05 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්හට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුහට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත. **පෙරවරු 10.00 ට** පසුව ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

1.7) මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් **2021.05.13 දින පෙරවරු 10.00ට** කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වීමට නියමිතය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**කළුතර.**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

## මාර්ග සංවර්ධන අධිකාරිය

### මහාමාර්ග අමාත්‍යාංශය

**පහත සඳහන් කාර්යාලය පිහිටුවීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් බදු පදනම යටතේ අවශ්‍යව ඇත.**

### විධායක ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය

අපේක්ෂිත ගොඩනැගිල්ල පහත සඳහන් පහසුකම් සපුරාලිය යුතුය :

1. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2500 ක් විය යුතු අතර, අවම වශයෙන් පර්චස් 40 ක වපසරියක් සහිත ඉඩමක් විය යුතුය.
   (a) හොඳින් වාතාශ්‍රය සහිත කාමර අවම වශයෙන් 03 ක් තිබිය යුතුය. (අභ්‍යන්තර වැසිකිළි 01 ක් සහිතව)
   (b) පොදු වැසිකිළි පහසුකම් 02 ක් තිබිය යුතුය.
   (c) විදුලිය, ජල සැපයුම, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන සබඳතාවය, ජලය ගබඩා කර ගැනීමට ලීටර් 1,000 ක ධාරිතාවයකින් යුතු ටැංකියක් තිබිය යුතුය.
2. ගොඩනැගිල්ල නගර මධ්‍යයේ සිට කි.මී. 1ක් තුළ පිහිටිය යුතුය.
3. ප්‍රධාන පාරට සමීපව හෝ ගොඩනැගිල්ලට පහසුවෙන් ළඟාවිය හැකි අවම වශයෙන් ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 200 ක දුරකින් පිහිටා තිබිය යුතුය.
4. වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතුය. (අවම වශයෙන් වර්ග අඩි 720 ක් විය යුතුය.)

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමිකරුවන් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම සමග අදාළ විස්තර සහිතව මිල ගණන් පතක් පහත සඳහන් ලිපිනයට 2021-05-13 දිනට පෙර යොමු කරන්න.

ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරෙහි "**කාර්යාල ගොඩනැගිල්ල සඳහා මිල ගණන් පත**" යනුවෙන් සඳහන් කරන්න.

**සභාපති,**
**වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**පුත්තලම් පාර, කුරුණෑගල.**

---

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### උතුරු මැද පළාත

01. උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ සඳහන් ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකිරීමට ඇති කර්මාන්තයේ ඇස්තමේන්තු ගත වටිනාකම (VAT හා අනෙකුත් බදු හැර) රු. මිලියන 50 ට අඩු බැවින් අංක 04/2016(iii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය අදාළ වනු ඇත.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර පහත වගුවේ සඳහන් CIDA ලියාපදිංචිය සපුරා තිබිය යුතුය.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවන්ට මෙයද ඇතුළත්වේ. පසුගිය වසර පහ තුළ අඛණ්ඩව රු. මිලියන 3.5 ට වැඩි වටිනාකමකින් යුත් සමාන ස්වභාවයේ ගොඩනැගිලි කර්මාන්තයක් සාර්ථකව නිමා කර තිබීම හෝ පසුගිය වසර පහ තුළ සමාන ව්‍යාපෘති තුනක නියැලී සිටි තාක්ෂණ නිලධාරියෙකු (NCT Civil/NVQ 5) සේවයේ නියුක්ත කිරීම.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු අනුරාධපුර, හරිස්චන්ද්‍ර මාවතේ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙතින් (දුරකථනය : 025-2234728, ෆැක්ස් : 025-2234728, ඊමේල් : info@lgd.nc.gov.lk) ලබාගත හැකි අතර 0830 පැය හා 1500 පැය අතර පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

06. ආපසු ගෙවනු නොලබන රු. 3,500/- ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021 අප්‍රේල් 30 වෙනි දින සිට 2021 මැයි 20 වෙනි දින දක්වා 0900 පැය හා 1500 පැය අතර අනුරාධපුරය, හරිස්චන්ද්‍ර මාවතේ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.

07. පිටපත් දෙකකින් යුත් ලංසු, 2021 මැයි 21 වෙනි දින 1300 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. ලංසු, දින 77 ක් (2021.08.06 දක්වා) වලංගු විය යුතුය.

| අංක | වැඩ විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු.) | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| 01 | ඇලහැර ප්‍රාදේශීය සභාවේ දියබෙදුම සති පොළ ඉදිකිරීම | මිලියන 5.50 ක් | දින 120 ක් | සී 6-සී 7 ගොඩනැගිලි ඉදිකිරීම් | 55,000.00 | 2021.09.03 |
| 02 | ඇලහැර ප්‍රාදේශීය සභාවේ අත්තනකඩවල සති පොළ ඉදිකිරීම | මිලියන 5.80 ක් | දින 120 ක් | සී 6-සී 7 ගොඩනැගිලි ඉදිකිරීම් | 58,000.00 | 2021.09.03 |
| 03 | ඇලහැර ප්‍රාදේශීය සභාවේ දියබෙදුම සාප්පු ගොඩනැගිල්ලේ උඩු මහල ඉදිකිරීම | මිලියන 5.30 ක් | දින 120 ක් | සී 6-සී 7 ගොඩනැගිලි ඉදිකිරීම් | 53,000.00 | 2021.09.03 |

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව,**
**පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය (බිම් මහල),**
**හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.**
**2021.04.28**

---

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# වාරිමාර්ග අමාත්‍යාංශය
# ටෙන්ඩර් දැන්වීමයි

### (ජාතික තරඟකාරී ලංසුකරණය)

## මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

වාරිමාර්ග අමාත්‍යාංශයේ මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (PPC) වෙනුවෙන් වැලිකන්ද, වාරිමාර්ග අමාත්‍යාංශයේ මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2021 මැයි 25 වන දින 1100 පැය දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අයිතම අංකය | විස්තරය | කොන්ත්‍රාත් අංකය | ලංසු ලිපිලේඛන කට්ටලයකට ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | අවශ්‍ය CIDA/ ICTAD ශ්‍රේණිය ලියාපදිංචි ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| 1 | 0+630km සිට 4+030km දක්වා දම්මින්න - වලමන්ඩිය පාර වැඩිදියුණු කිරීම (මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් හැර රු. මිලියන 123.00. කොන්ත්‍රාත් කාලය දින 301) | MORBDP/Con/ RD/2021-11 | රු. 20,500.00 | C4 හා C3 මහාමාර්ග |
| 2 | 6+500km සිට 7+000km දක්වා මාදුරුඔය දකුණු ඉවුරේ ප්‍රධාන ඇළ ඉදිකිරීම (මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් හැර රු. මිලියන 107.00 කොන්ත්‍රාත් කාලය දින 301) | MORBDP/Con/ MC/2021-14 | රු. 19,000.00 | C4 හා C3 වාරිමාර්ග හා ජල අපවහන |
| 3 | 12+430km සිට 13+300km දක්වා මාදුරුඔය දකුණු ඉවුරේ ප්‍රධාන ඇළ ඉදිකිරීම (මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් හැර රු. මිලියන 172.00 කොන්ත්‍රාත් කාලය දින 336) | MORBDP/Con/ MC/2021-28 | රු. 27,000.00 | C4 හා C3 වාරිමාර්ග හා ජල අපවහන |
| 4 | 13+300km සිට 13+900km දක්වා මාදුරුඔය දකුණු ඉවුරේ ප්‍රධාන ඇළ ඉදිකිරීම (මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් හැර රු. මිලියන 181.00 කොන්ත්‍රාත් කාලය දින 336) | MORBDP/Con/ MC/2021-29 | රු. 28,500.00 | C3 හා C2 වාරිමාර්ග හා ජල අපවහන |
| 5 | 13+900km සිට 14+492km දක්වා මාදුරුඔය දකුණු ඉවුරු ප්‍රධාන ඇළ ඉදිකිරීම (මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් හැර රු. මිලියන 176.00 කොන්ත්‍රාත් කාලය දින 336) | MORBDP/Con/ MC/2021-30 | රු. 27,500.00 | C4 හා C3 වාරිමාර්ග හා ජල අපවහන |

CIDA/ICTAD ලියාපදිංචි කිරීමේ යෝජනාක්‍රමය යටතේ ඉහත සඳහන් ශ්‍රේණිය හා ක්ෂේත්‍රය සතු ලංසුකරුවන් පමණක් ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති.

අපේක්ෂිත ලංසුකරුවන්හට එක් එක් ලංසුව සඳහා ලංසු ලිපිලේඛන කට්ටලයකට ගෙවිය යුතු ඉහත සඳහන් ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ගෙවීමෙන් 2021 මැයි 01 වන දින සිට 2021 මැයි 24 වන දින දක්වා රාජකාරී දිනවල 900 පැයත් 1500 පැයත් අතර, වැලිකන්ද වාරිමාර්ග අමාත්‍යාංශයේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සමාගමේ/ ආයතනයේ ලිපිශීර්ෂයක් මත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය. ලංසුකරුවන්හට එක් ටෙන්ඩරයකට වඩා වැඩි ගණනකට ලංසු ඉදිරිපත් කළහැකි වුවද ලංසුකරුගේ ධාරිතාවයේ සීමා අනුව තෝරාගැනීම සිදුකරනු ලැබේ.

ලංසු ලිපිලේඛන 2021 මැයි 01 වන දින සිට 2021 මැයි 24 වන දින දක්වා සාමාන්‍ය රජකාරී දිනවල 900පැයත් 1500 පැයත් අතර, වැලික්ද වාරිමාර්ග අමාත්‍යාංශයේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂා කළ හැකිය.

පිටපත් දෙකකින් යුතු මුද්‍රා තබන ලද ලංසු ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ කොන්ත්‍රාත් නාමය හා අංකය පැහැදිළිව සඳහන් කර ලංසු ඉදිරිපත් කළයුතු අවසාන වේලාවට පෙර වැලිකන්ද වාරිමාර්ග අමාත්‍යාංශයේ, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. ඉන් අනතුරුව වහාම ලංසු විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් දෙදෙනෙකුට (02) නොවැඩි ගණනකට පැමිණ සිටිය හැකිය. වැඩි විස්තර සඳහා දුරකථන 027-3288912 ඔස්සේ වැලිකන්ද වාරිමාර්ග අමාත්‍යාංශයේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ අමතන්න.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය,**
**වාරිමාර්ග අමාත්‍යාංශය, වැලිකන්ද.**
**(දු.ක. 027-3288912)**

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 8 - මාතර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මාතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී.ඩබ්ලිව්. පෝෂිතා කෞමදි,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 8 - මාතර.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
මාතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 9 - හම්බන්තොට

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස හම්බන්තොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 9 - හම්බන්තොට.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
හම්බන්තොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 10 - යාපනය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස යාපනය හා කිළිනොච්චි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්.සී. අමල්රාජ්
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 10 - යාපනය.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 12 - මඩකලපුව

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මඩකලපුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. සසීලන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 12 - මඩකලපුව

2021 අප්‍රේල් මස 30 වැනි දින,
මඩකලපුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 11 - වන්නි

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මන්නාරම, වවුනියාව හා මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. ජෙනිටන්
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 11 - වන්නි

2021 අප්‍රේල් මස 30 වැනි දින,
වවුනියාව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 4 - මහනුවර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 4 - මහනුවර.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 3 - කළුතර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 3 - කළුතර.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 2 - ගම්පහ

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ.ජේ.එස්. මාධව,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 2 - ගම්පහ.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 1 - කොළඹ

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී.ඒ.එස්. සේනාරත්න,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 1 - කොළඹ.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 18 - පොළොන්නරුව

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස පොලොන්නරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පියුමි ආටිගල,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 18- පොළොන්නරුව.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
පොළොන්නරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 17 - අනුරාධපුර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස අනුරාධපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්.බී.එම්. සුල්ෆාන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 17- අනුරාධපුර.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 16 - පුත්තලම

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස පුත්තලම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. රේගන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 16- පුත්තලම.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
පුත්තලම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 15 - කුරුණෑගල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගමලත්ගේ දිල්ප් නිශාන්ත,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 15-කුරුණෑගල.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 14 - ත්‍රිකුණාමලය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුදාකරන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 14- ත්‍රිකුණාමලය.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 13 - දිගාමඩුල්ල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස අම්පාර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී.ටී.අයි. වික්‍රමරත්න,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 13-දිගාමඩුල්ල

2021 අප්‍රේල් මස 30 වැනි දින,
අම්පාර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 7 - ගාල්ල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ.යූ. චන්ද්‍රලාල්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 7 - ගාල්ල.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 6 - නුවරඑළිය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී.එස්. පතිරණ,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 6 - නුවරඑළිය.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

## 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

## මැතිවරණ කොට්ඨාස අංක : 5 - මාතලේ

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හිදී, පරීක්ෂා කර බැලීම පිණිස මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කුමරිනී ප්‍රතාපසිංහ,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 5 - මාතලේ.

2021 අප්‍රේල් මස 30 වැනි දින,
මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දීය.

# කොරෝනා අඩු වුණොත් ජාතික වෙසක් උත්සවය නාගදීපයේදී



**උතුරු පළාත් විශේෂ-රසුල දිල්හාර ගමගේ**

ජාතික වෙසක් උත්සවය පැවැත්විය හැකි ආකාරය පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමට විශේෂ රැස්වීමක් නාගදීප විහාරාධිපති හිමියන්ගේ හා යාපනය දිසාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (29) නාගදීප රාජමහා විහාරස්ථානයේදී පැවැත්විණි.

රජය විසින් සියලු ආගමික උත්සව මැයි 31දා දක්වා නතර කොට ඇති පරිසරයක ජාතික වෙසක් උත්සවය නාගදීපයේ පැවැත්විය හැකි ආකාරය ගැන මෙහිදී කරුණු සාකච්ඡා කොට තිබේ.

යාපනය නාගදීප රජමහා විහාරාධිපති නවදගල පදුමකිත්ති නායක හිමියෝ සහ කනපතිපිල්ලේ මහේසන් දිසාපතිවරයා සඳහන් කොට ඇත්තේ කොරෝනා වසංගතයේ යම් අඩුවීමක් දක්නට ලැබුණහොත් නාගදීපයේදී ජාතික වෙසක් උත්සවය පැවැත්වීමට හැකි වන අන්දමට දැනට කටයුතු සූදානම් කළ යුතු බවටයි.

මේ සාකච්ඡාවට නාවික හමුදාවේ යුද හමුදාවේ හා පොලීසියේ නිලධාරීහුද රාජ්‍ය නිලධාරීහුද සහභාගි වී සිටියහ.

# හිටපු පොලිස්පති මහින්ද බාලසූරියගේ අවසන් කටයුතු අද

**රක්ෂණ ශ්‍රියන්ත**

ශ්‍රී ලංකා පොලීසියේ 32 වැනි පොලිස්පතිවරයා වූ මහින්ද බාලසූරිය මහතා අභාවප්‍රාප්ත විය.

පෙරේදා (29) සවස කොළඹ නාරාහේන්පිට ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික රෝහලකදී ඒ මහතා අභාවප්‍රාප්ත වී ඇත.

අසනීප තත්ත්වයක් හේතුවෙන් මිය ගිය ඒ මහතා මියයන විට 68 හැවිරිදි වියේ පසුවිය.

මහින්ද බාලසූරිය මහතා 1978 වර්ෂයේ ආධුනික සහකාර පොලිස් අධිකාරීවරයකු ලෙස පොලිස් සේවයට එක් වී ඇති අතර 2010-2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ පොලිස්පතිවරයා ලෙසද කටයුතු කර තිබේ.

යුද්ධයේ අවසන් සමයේ උතුරු සහ නැගෙනහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස රාජකාරි කරමින් විශේෂ මෙහෙවරක් සිදු කළ අයකු වන අතර එම අවධියේ පොලිස් විශේෂ කාර්ය බළකායට නායකත්වය ලබාදුන්නේද ඒ මහතාය.



පොලිස් හදිසි ඇමතුම් අංක 119 සන්නිවේදන සේවාවේ නිර්මාතෘවරයා වන්නේද ඒ මහතාය.

2014 වසරේ නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසද හෙතෙම කටයුතු කළේය

ඒ මහතා බ්‍රසීලයේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙසද කටයුතු කර තිබේ.

ඒ මහතාගේ දේහය 524/01/A, ගෝනවල, කැලණිය නිවෙසේ තැන්පත් කරඇති අතර අවසන් කටයුතු අද (01) සවස 3.00ට බොරැල්ල කනත්තේදී සිදු කිරීමට නියමිතය.

# රාජ්‍ය පරිපාලන සේවයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එස්.කේ.එස්. කොඩිකාර අභාවප්‍රාප්ත වෙයි

රාජ්‍ය පරිපාලන සේවයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සම්මානනීය ලේඛක එස්.කේ.එස් කොඩිකාර මහතා (80) ඊයේ (30) අභාවප්‍රාප්ත වෙයි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මංජුලා සහ පූර්ණ, විශාඛා විද්‍යාලයේ ස්වේතාගේ පියාණන් වූ ඒ මහතා ජල සම්පාදන අමාත්‍යාංශයේ මාධ්‍ය අධ්‍යක්ෂ මහේන්ද්‍ර හරිස්චන්ද්‍ර මහතාගේ මාමණ්ඩියයි. අවසන් කටයුතු අද (01) පස්වරු 3.00ට කොට්ටාව ආදාහනාගාරයේ දී සිදු කෙරේ. දැනට දේහය කොට්ටාව අතුරුගිරිය පාරේ අමරසූරිය මාවතේ අංක 657 නිවෙසේ තැන්පත් කර ඇත.



# අණ නොතකා ගිය වැලි ටිපර් රියට හමුදාවෙන් වෙඩි

**උතුරු පළාත් විශේෂ-රසුල දිල්හාර ගමගේ**

යාපනයේ වඩමාරච්චි නැගෙනහිර කුඩත්තනෙයි ප්‍රදේශයේදී නාවික හමුදාවේ අණ නොතකා ධාවනය කළ වැලි ටිපර් රථයකට නාවික හමුදාව ඊයේ (30) උදෑසන වෙඩි තබා ඇත.

නාවික හමුදා වෙඩි තැබීමෙන් පසුව ටිපර් රථය නතර කළ නීති විරෝධී වැලි ජාවාරම්කරුවන් ටිපර් රථය අතහැර කැලයට පලාගොස් තිබේ.

නාවික හමුදා භට පිරිසක් මේ මාර්ගයේ සෝදිසි මෙහෙයුමක නිරතව සිටියදී කැලෑබද ප්‍රදේශයක සිට වැලි පටවාගෙන පැමිණි ටිපර් රථයක් දැක එය නතර කිරීමට සංඥා කළ අවස්ථාවේදි එය නොනවත්වා ධාවනය කරවීමට රියැදුරා උත්සාහ කළ නිසා නාවික හමුදා නිලධාරීන් ඊට වෙඩි තබා ඇත.

ටිපර් රථයට ඉදිරියෙන් ඔත්තු බලමින් ගමන් කළ බවට සැක කෙරෙන යතුරු පැදියක්ද සොයා ගෙන ඇති අතර නාවික හමුදාවේ වෙඩි තැබීම්වලින් කිසිවකුට තුවාල සිදු වී නැත.

## දවසේ රාහු කාලය

උදේ 09.02 සිට 10.35 දක්වා රාත්‍රී 09.13 සිට 10.40 දක්වා

## දින තත්ත්වය

මේෂ රවි 18 භාග බක් අව විසේනිය ලත් ශනි දින ඉර උදාව 05.57ට ඉර බැසීම 06.19ට මුල නැකත උදේ 10.20න් ගෙවී පුවසල නැකත ලබයි. බක් අව විසේනිය තිථිය සවස 04.49න් ගෙවී අව සැටවක තිථිය ලබයි. ශිව යෝගය අලුයම 04.42න් ගෙවී සිද්ධ යෝගය ලබයි. කෞලව කරණය අලුයම 05.53න් ගෙවී තෛතිල කරණය ලබා එය සවස 04.49න් ගෙවී ගරජ කරණය ලබයි

විෂ කලාව - ලිංග යෝනි අමෘත කලාව - ඇස මරු සිටින දිසාව - නැගෙනහිර

යෝගිනි - දකුණ - සුබ දිසාව - උතුර



සුබසෙත ජොෂේඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යෙතිෂවේදී **අජිත් ධර්මසිරි**

## 2021.05.01 සෙනසුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
05.57 - 06.57 දක්වා - සෙනසුරු හෝරාව
06.57 - 07.57 දක්වා - ගුරු හෝරාව
07.57 - 08.57 දක්වා - කුජ හෝරාව
08.57 - 09.57 දක්වා - රවි හෝරාව
09.57 - 10.57 දක්වා - සිකුරු හෝරාව
10.57 -11.57 දක්වා - බුධ හෝරාව


**සවස**
11.57 - 12.57 දක්වා - සඳු හෝරාව
12.57 - 01.57 දක්වා - සෙනසුරු හෝරාව
01.57 - 02.57 දක්වා - ගුරු හෝරාව
02.57 - 03.57 දක්වා - කුජ හෝරාව
03.57 - 04.57 දක්වා - රවි හෝරාව
04.57 - 05.57 දක්වා - සිකුරු හෝරාව

**රාත්‍රී**
05.57 - 06.57 දක්වා - බුධ හෝරාව
06.57 - 07.57 දක්වා - සඳු හෝරාව
07.57 - 08.57 දක්වා - සෙනසුරු හෝරාව
08.57 - 09.57 දක්වා - ගුරු හෝරාව
09.57 - 10.57 දක්වා - කුජ හෝරාව
10.57 -11.57 දක්වා - රවි හෝරාව

**අලුයම**
11.57 - 12.57 දක්වා - සිකුරු හෝරාව
12.57 - 01.57 දක්වා - බුධ හෝරාව
01.57 - 02.57 දක්වා - සඳු හෝරාව
02.57 - 03.57 දක්වා - සෙනසුරු හෝරාව
03.57 - 04.57 දක්වා - ගුරු හෝරාව
04.57 - 05.57 දක්වා - කුජ හෝරාව

**බබාට නමක්**

උදේ 10.20 දක්වා මුල නැකත උදාව පවතින අතර, එතෙක් උපදින දරුවනට යෙ, යො, බ, බි අකුරු ද ඉන් පසු පුවසල නැකත උදාවන බැවින් එතැන් සිට උපදින දරුවනට බු,ධ අකුරු ද දිනට අනුව ප, බ, හ, ම අකුරු ද මුල් කොට බබාට නමක් දැමීම සුබයි.



## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - ගෘහ දිවියේ සතුට

මේෂ ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. ආර්ථික ප්‍රතිලාභ හා ගෘහ ජීවිතයේ සතුට අභිවෘද්ධිය ඇති වේ. තම දින චර්යාව කාර්ය බහුල වන අතර, යම් යම් ශාරීරික අපහසුතා ද දැනෙන දිනකි. තම සිතට එන අරමුණු සඵල කර ගැනීමට ඉතා ශක්තිමත් අධිෂ්ඨානයක් ගෙන දෙන දිනකි. සමාජයේ කැපී පෙනෙන චරිතයක් වීමට ඔබට හැකියාව ලැබේ.

### වෘෂභ ලග්නය - මානසික අසහනය මතු වේ

වෘෂභ ලග්නයට අනුව අද ඔබට නව ආර්ථික ගැටලුවකට මුහුණදීමට සිදු වේ. ඒ නිසා මානසික අසහනය මතු කෙරේ. තම විශ්වාසවන්ත අය වෙතින් ද විශ්වාසය බිඳ වැටෙන කටයුතු උදා වේ. ඒ අතර තමාගේ ව්‍යාපාරයක් අඩාළ වන බව ද පෙනේ. පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු පවතී. කාර්ය බහුල මෙන්ම වෙහෙසකාරි දිනකි.

### මිථුන ලග්නය - නව ආයෝජන උදා වේ

මිථුන ලග්නයට අනුව අද ඔබට ආර්ථික වශයෙන් උසස් ප්‍රතිඵල උදාවේ. ලැබීම් අතර කලකට ඉහත ඔබ කෙනෙකුට දී නැවත ලබාගැනීමට නොහැකිව තිබූ මුදලක් යළි ලැබීමට නියමිතයි. තම ව්‍යාපාර දියුණුව හා නව ආයෝජන ක්‍රම උදාවීම හා සමාජයේ පිළිගැනීමකට ලක්වන මට්ටමේ කරුණු උදාවේ. දණහිස ආශ්‍රිත උවදුරු පෙන්වයි.

### කටක ලග්නය - රැකියා අභිවෘද්ධිය

කටක ලග්නයට අනුව අද ඔබට රැකියා අතින් උසස් වේ. විවිධ ක්‍රම මගින් ආදායම් ලැබේ. රැකියා ස්ථානගතව තිබූ බාධා අවසන්වේ. නව රැකියාවකට කර තිබූ ඉල්ලීම සපලවනු ඇත. පරිගණක ක්ෂේත්‍රයේ කටයුතු කරන අයට සුබ වන අතර, කාර්ය බහුල වන දිනකි. ඔබට තම නිවසේ අලංකරණ කටයුත්තකට මුල්වීමට සිදුවේ. ආගමික පසුබිමක් ද නිවෙස තුළ දක්නට ලැබේ.

### සිංහ ලග්නය - ආර්ථික ප්‍රතිලාභ රැසක්

සිංහ ලග්නයට අනුව අද ඔබට පෙරපිං මහිමයෙන් සපලවන කටයුතු පිළිබඳ පෙන්වා දෙයි. තමා පෙර දිනක කරන ලද ආයෝජනයක ප්‍රතිලාභ ලැබේ. මවුපිය පාර්ශ්වයෙන් දැඩි සහයෝගය ද පියාගේ කටයුතු සිය වගකීම් යටතට ගැනීමට ද සිදුවේ. ඒ සඳහා වැඩිහිටි පාර්ශ්ව වෙතින් ආශිර්වාද ලැබෙන දිනකි. තුනටියේ ඇතිවිය හැකි ආපදාවක් නිසා එදිනෙදා කටයුතු කෙරේ බාධා එල්ල වීමට පුළුවන. .

### කන්‍යා ලග්නය - හදිසි ධන සම්පත්

කන්‍යා ලග්නයට අනුව අද ඔබ විශේෂයෙන් පරිස්සම් විය යුතුය. බාහිර ආපදා රැසකට ඔබට මුහුණ දීමට සිදු වේ. තම එදිනෙදා කටයුතු සිතට වද දෙන බවක් පෙනෙන්නට තිබේ. තුනටියේ ආපදා මතු කළ ද ආර්ථික ලැබීමකට හේතු වෙයි. තමාට හදිසි ධන සම්පත් උරුමයක් ද සහිතයි. ලොතරැයි ජය උරගා බැලීමට උනන්දු වන්න. තම ශරීර සෞඛ්‍යය මෙන්ම තම මව පිළිබඳව ද සැලකිලිමත් වීම සුබයි.

### තුලා ලග්නය - තරග විභාග ජය

තුලා ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ සුවිශේෂී කඩඉම් කීපයකට මුහුණදීමට හැකිවේ. විවාහ අභිවෘද්ධිය මෙන්ම අවිවාහක අයට මංගල යෝජනා සම්මත වීම හා තරුණ තරුණියන්ගේ ආදර සබඳතා සවිමත් වීම මෙහිදී පෙනෙන්නට තිබේ. තමා මීට පෙර මුහුණ දී සිටි විභාගයක තරගයක ප්‍රතිඵල බුක්ති විඳීමට හැකි වන දිනකි.

### වෘශ්චික ලග්නය - වෘත්තීය කටයුතුවලට බාධා

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට සමාජයේ විවිධ තාඩන පීඩන එල්ල විය හැකිය. තවද තම එදිනෙදා වෘත්ති මය කටයුතු කෙරේ තර්ජන හා බාධා එල්ල විය හැකිය. එසේම ශරීර සෞඛ්‍ය අතින්ද පරිස්සම් විය යුතුය. අධික ලෙස ආහාර ගැනීම වෙනුවට සැහැල්ලු ආහාරපාන ගැනීම සුබයි. කොලෙස්ටරෝල්, සීනි අවදානම ඇති අය සැලකිළිමත් වන්න. තෙල් සැර උෂ්ණ කෑම වෙනුවට ඇඟ නිවෙන ආහාරපාන සුදුසු වෙයි.

### ධනු ලග්නය - සෙසු අයගෙන් ප්‍රශංසා

ධනු ලග්නයට අනුව ඔබට සුබයි. චන්ද්‍රයාගේ ගමන අනුව ආර්ථික ලාභ , දරුසම්පත් හිමිවීම මෙහිදී පෙනෙන්නට ඇති අතර, අන් අය වෙනුවෙන් වෙහෙසීමට පත්වන දිනකි. නව ආයෝජන ප්‍රතිලාභ, රැකියා ප්‍රතිලාභ මෙන්ම සෙසු අය වෙතින් ප්‍රශංසා හිමි වීමට ද ඉඩ ලැබේ. ආගමික කටයුතු රැසක නියැළෙන අතර, සිතට සහනය ගෙනදෙන දිනකි. ආහාරපාන නිසා අජීර්ණ පවා ඇතිවීමට පුළුවන.

### මකර ලග්නය - ව්‍යාපාර සපල වේ

මකර ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ සුවිශේෂී කඩඉමකට මුහුණදීමට හැකි වේ. වාහන ලාභ, ඉඩකඩම් හා නිවාස හිමිකම පිළිබඳ සතුටු විය හැකි දිනකි. තමා එදිනෙදා කරගෙන ආ ව්‍යාපාර සපල වීම, රැකියාගත උසස්වීම් ප්‍රතිලාභ හා වැඩිහිටි පාර්ශ්වවලින් ඇප උපකාර හිමි වීමට ද නියමිතය. පපුවේ විවිධ රෝග ශ්වසන අපහසුතා දැනෙන දිනක් වුවද බිය විය යුතු නැත.

### කුම්භ ලග්නය - නඩුහබවලින් සහනය

කුම්භ ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා 03 වැන්නේ සිට ගෙනෙන ප්‍රතිලාභ රැසක දේපළ උරුමකම් හිමිකම් හා තම සහකරු හෝ සහකාරිය වෙතින් ලැබෙන ප්‍රතිලාභ ද මෙහිදී වැදගත් වෙයි. නඩු හබවලින් සහනය ද නීති අංශ වෙතින් සහනය ද උදාවේ. තම දූ පුතුන්ගේ කටයුතු කෙරේ වැඩි කැපවීමක් කිරීමට සිදුවන අතර, ඒ අයගේ ජයග්‍රහණ නිසා තමාට යම් යම් ප්‍රශංසා ද හිමි වනු ඇත. ආගමික කටයුතු බහුල වන දිනකි.

### මීන ලග්නය - මූල්‍යමය ප්‍රතිලාභ රැසක්

මීන ලග්නයට අනුව අද ඔබට හදිසි ධනය හිමි වන දිනකි. ලොතරැයි ජය මෙහිදී ප්‍රධාන වෙයි. මගතොට ගමන් කරන විට උදා වන ජයග්‍රහණ මූල්‍ය ප්‍රතිලාභද සහිතයි. තමාගේ විකුණා ගැනීමට නොහැකිව තිබූ ඉඩමක් නිවෙසක් හෝ වාහනයක් සාධාරණ මිලට විකුණා ගැනීමට ඔබට අවස්ථාව උදාවේ. කෙනෙකු විසින් කාලයක් තිස්සේ ඔබට කරගෙන ආ පීඩාකාරි කටයුත්තක් අවසන් වන ලකුණු පෙනේ.

# දැයෙන් සමු ගත් පොදු ජන නායකයා රණසිංහ ප්‍රේමදාස

(හිටපු ජනපති රණසිංහ ප්‍රේමදාස මහතා 1993 මැයි මස 01 දා ජීවිතයට සමු දී අදට (01) වසර 28කි මේ ලිපිය ඒ නිමිත්තෙනි.)



"දසලක්ෂ සංඛ්‍යාත නිහඬ ජනතාවගේ කටහඬ වීමට මට හැකි නම්, ඔවුන් දුකින් මුදා ගන්නා ප්‍රධාන අවිය වීමට මට හැකි නම්, මම එය මගේ ශ්‍රේෂ්ඨතම ජයග්‍රහණය ලෙස සලකමි"යනුවෙන් පැවසුවේ ශූර කථිකයකු, දේශකයකු, නව කතාකරුවකු, කෙටිකතාකරුවකු, කවියකු, ගීත රචකවකු, නව සංකල්ප හා නිර්මාණවලින් පිරුණු සිතක් ඇත්තකු හා පොදු ජන හදවත් දිනාගත් ජනතා දේශපාලකයකු හා නායකයකු වූ රණසිංහ ප්‍රේමදාසයන්ය. ඔහු පොදු ජන හදවත් දිනා ගත් ජනතා දේශපාලකයකු වශයෙන් කීර්තියට පත් විය. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා වෙතින් දේශපාලන අත්පොත් තැබූ මා හට දේශපාලනයේ ඉදිරි ගමනට අත්වැල වූයේ ආර්.ප්‍රේමදාස මහතාය. දකුණු පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වූ විට පක්ෂ නායකයා වූ ප්‍රේමදාස මහතා මට පණිවිඩයක් එව්වේ සුචරිත මන්දිරයට පැමිණ තමා හමුවන ලෙසය. මා එතුමන් හමුවීමට නියමිත වේලාවට සුචරිතයට ගියෙමි.

රණසිංහ ප්‍රේමදාස මහතා මා බලාපොරොත්තුවෙන් සිටියේය. එතුමන් මා පිළිගෙන මගෙන් එකවර ඇසුවේ වජිර මේ පළාත් සභා ඡන්දයෙන් ගාලු දිස්ත්‍රික්කයේ පළමුවැනියා වෙන්න ඔබට බැරිද?මා එවිට කීවේ පළමුවැනියා වෙන්න තිබුණ නමුත් දැන් මහ ඇමැති අපේක්ෂකයා ලෙස එම්.එස්. අමරසිරි මහත්තයා පක්ෂය විසින් නම් කර තියෙන්නේ. ඒ නිසා අමාරුයි. ඇයි අමාරු? ඡන්දයට වියදම් කරන්න මුදල් නැද්ද ප්‍රේමදාස මහතා පෙරළා මගෙන් ප්‍රශ්න කළේය. මට පළමුවැනියා වීමට තරම් ලොකු මුදලක් වැය කරන්න මුදල් නැහැ. ප්‍රේමදාස මහතා මදක් කල්පනා කර දුරකථනයෙන් ඇමතුමක් ගෙන තවත් අයකුට කතා කළේය. ඔහුට ප්‍රේමදාස මහතා පැවසුවේ අපේ පක්ෂයේ දේශපාලනය කරන ගාල්ලේ තරුණ දේශපාලකයෙක් මා ඔබ හමුවට එවනවා. ඔහු මටත් පක්ෂයටත් බලාපොරොත්තු තියාගන්න පුළුවන් තරුණයෙක්. ඔබ ඔහුව බලාගන්න ඕනෑ. ඔහුට අවශ්‍ය සහයෝගය දෙන්නැයි කියා රිසීවරය තැබීය. මා දෙස බැලූ ප්‍රේමදාස මහතා ලියුමක් ලියා මා අතට දී දැන්ම ගිහින් ඔබ මොහුව හමුවන්න. ඔබට ඔහු උදව් කරාවි. ගාල්ලේ පළමුවැනියා වෙලා මා හමුවන්න. මම ඔබ බලාගන්නම් කීය.

ප්‍රේමදාස මහතා දුන් ලිපිය රැගෙන මම අදාළ ව්‍යාපාරිකයා හමුවීමි. ඔබ ගැන ජනාධිපතිතුමා මට කීවා. ඔබට ඡන්දයට යන වියදම් මම දරන්නම්. මට බජට් එකක් හදල දෙන්න. දකුණු පළාත් සභා ඡන්දයට පෙර ජනාධිපති ප්‍රේමදාස මහතා ඝාතනය විය. එයින් අපගේත් රටේත් පක්ෂයේත් බලාපොරොත්තු සුණු විසුණු වී ගියේය. මම දිස්ත්‍රික්කයේ පළමුවැනියා නොවුණද ජයග්‍රහණය කළෙමි. ප්‍රේමදාස මහතා දිවංගත වුවද ඔහු හඳුන්වා දුන් ව්‍යාපාරික මහතා ප්‍රේමදාස මහතාට පොරොන්දු වූ අයුරෙන් මගේ මැතිවරණයට වියදම් කළේය. ඒ මහතා අදද තම ව්‍යාපාර පවත්වාගෙන යන බව සිහිපත් කරනුයේ කෘතගුණ පූර්වකවය.

ප්‍රේමදාස මහතා දේශපාලනයේ යෙදෙන අයගේ අතින් නොඅල්ලා නාඩි වැඩ කරන හැටි හොඳින් දැන සිටි නායකයකු බව මේ සිදුවීමෙන් බොහෝ සිදුවීම්වලින් මම දැන සිටියෙමි. කොපමණ බාධක පැමිණියද තමා නිවැරදි ලෙස ආරම්භ කළ ක්‍රියා අතරමඟ නොනවත්වා එය කිරීමට අසීමිතව කැප වෙන නායකයකු වශයෙන් අප ප්‍රේමදාස මහතා දැන හඳුනාගෙන සිටිමු. මිරිසවැටි දාගැබ යළි පිළිසකර කිරීම ජේතවනාරාම දාගැබ පිළිසකර කිරීම ආදී කටයුතුවල වගකීම් පැවරුණේ ප්‍රේමදාස මහතාටය. මිරිසවැටිය ගොඩනැංවීම විටින් විට අඩාළ විය. වරක් සියල්ල සුනු විසුනු කරමින් මිරිසවැටිය කඩාගෙන බිමට වැටිණි. අපවත් වී වදාළ කොටුගොඩ ධම්මාවාස මහ නා හිමියන් මියන්මාරයට වැඩම කිරීමෙන් පසු ප්‍රේමදාස මහතාට තොරතුරක් හෙළි කරන්න යෙදුණි. තොරතුරු ලැබුණේ මියන්මාරයේ සිටි සිත දියුණු කරගත් අධ්‍යාත්මික ශක්තියෙන් හෙබි හිමි නමකගෙනි. උන් වහන්සේ පවසා තිබුණේ දැනට සිදු කරන මිරිසවැටි පිළිසකර කිරීමේ කටයුතු නවතා නියමිත පිළිවෙත් පුරා එය සිදුකළහොත් මිරිසවැටියේ නිර්මාණ කටයුතු අවසන් කළ හැකි බවයි. නැති නම් එය කෙසේවත් සිදු කිරීමට නොහැකිවන බවයි. සියල්ල ඇසූ ප්‍රේමදාස මහතා මියන්මාරයට පිරිසක් යවා එය පැවසූ හිමියන් හමුවී සියලු විස්තර තවත් හොඳින් දැනගෙන මිරිසවැටියේ පිළිසකර කටයුතු මහා රැයක කොටුගොඩ මහ නාහිමියන් ද වැඩමවා යළි ආරම්භ කළහ. සියල්ල නිසියාකාරව සිදු විය.

අද මහමෙව්නාවේ විරාජමාන වන අංග සම්පූර්ණ මිරිසවැටි මහ දාගැබ ජාතිය සතුවූයේ ඒ අකාරයෙන් ප්‍රේමදාස මහතාගේ නොපසුබට උත්සාහයෙනි. මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව සහ බෝසත් පිළිමය වසර සිය ගානක් මහ පොළොව සිපගෙන තිබිණි. බොහෝ අය මවිත කරවමින් එම ප්‍රතිමා ඔසවා තිබූ ආකාරයට ප්‍රතිෂ්ඨාපනය කළේ ප්‍රේමදාස මහතාගේ වීර්යය හා අධිෂ්ඨාන පාරමිතාවල ප්‍රතිඵලයක් ලෙසය.

සෑම ගම් උදා භූමියකම නව දාගැබක් ඉදිකර එම දාගැබට මෙරට විසූ වීරවරයකුගේ නමකින් හඳුන්වන්නට ප්‍රේමදාස මහතා ක්‍රියා කළේය. ඇඹිලිපිටියේ දුටු ගැමුණු මහා සෑය, බුත්තල කැප්පෙටිපොළ මහා සෑය, කඹුරුපිටියේ අනගාරික ධර්මපාල මහා සෑය, පොළොන්නරුවේ ඩී.එස්. සේනානායක මහා සෑය එයට නිදසුන්ය.

අහුන්ගල්ලේ දුම්රිය හා බස්රිය ගැටී එක තැන තිස් ගණනක් මිය පරලොව ගියේ ලංකාවේ භයානකම දුම්රිය අනතුරින් ලොවම කම්පා කරමිනි. වසර ගණනාවක් දුම්රිය ආරක්ෂක ගේට්ටුවක් නොතිබුණු නිසා සිදු වූ මේ ඛේදවාචකය සිදු වූයේ ප්‍රේමදාස මහතා ජනාධිපතිවී මාස ගණනාවක් ඇතුළතය. ප්‍රශ්නයක් ඇති වූ විට ප්‍රේමදාස මහතා ප්‍රශ්නය විසඳුවේ සකල ලංකාවාසී සියලු දෙනාටම සහනයක් වන පරිදි ලංකාවේ සියලුම දුම්රිය මං සන්ධි හරහා උණබට ගේට්ටු දමා ජනසවි පවුල් සාමාජිකයන් රැසකට එහි සේවය කර වැටුපක් ලබා ගන්නා අයුරිනි.

යාපහුවෙන් ආරම්භ කළ උදාගම් ගොඩනැඟීම ඔහු ඉදිරියටම ගෙන ගියේ නිවාස දස ලක්ෂයක් ගොඩ නැඟීමේ අරමුණින්ය. එතුමන් නිවාස දහයක් හෝ පහළොවක් තනා එය උදාගමක් ලෙස නම් නොකළ අතර සෑම ගමකටම අවම වශයෙන් නිවාස පනහ ඉක්මවා තිබිණි.1986 මැයි මස 25 වැනි දින විවෘත කළ අත්තනගල්ල මැතිවරණ කොට්ඨාසයේ නිට්ටඹුව නගරය ආශ්‍රිත "රන් පොකුණගම" නම් ආදර්ශ ගම්මානයේ නිවාස ප්‍රමාණය 1610 කි. ඔහු සියක් කෝටියක් තුරු සෙවණේ දස ලක්ෂයක් නිවාස සංකල්පය ඉදිරියට ගෙන ගියේ රුක් රෝපණය ද සිදු කරමිනි.

ප්‍රේමදාස මහතාගේ නිවාස සංවර්ධන යෝජනා ක්‍රමය එතරම් විශාල විය. අවසානයේ ඔහු ලොවම ජය ගත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා ජගත් නිවාස වර්ෂයක් ද ලොවට ලබා දෙමිනි. ඉන්දියාවේ නිර්මාණය කළ "බුද්ධගයා ගම" තැනීමට මුදල් වියදම් කළේ අප රටෙන්ය. බුදු පියාණන් වෙනුවෙන් ලංකාවෙන් ඉන්දියාවට සිදු කළ විශාලතම පූජාව බුද්ධගයාගම විය. මන්ද නිවාසයක් තනවා දීම සියල්ලම පූජා කළා හා සමාන කුසල කර්මයක් ලෙස බුදු රජාණන් වහන්සේ හඳුන්වා තිබුණු හෙයිනි.

සිරි දළදා මාලිගයට රන් වියනක් තනා පූජා කළ ප්‍රේමදාස මහතා දඹදිව බුද්ධ භූමියේ බුදුබව ලබන්නට සෙවණ දුන් බෝරුක සෙවණේද රන් වියනක් තනවා පූජා කළේ සිය බොදුනු බව ලොවට පසක් කරමිනි.

සෑම මැතිවරණ කොට්ඨාසයකට ඇඟලුම් කම්හල බැගින් ඉදි කිරීමට ප්‍රේමදාස මහතා ක්‍රියා කළේ ගමේ තරුණියන්ගේ ශ්‍රමය ගමට ගොනු කර කාන්තාවන් මැද පෙරදිග ගෘහ සේවයට යොමු වීමට යෑමද වළකන පියවරක් ලෙසය. එදා විරුද්ධ පක්ෂය ප්‍රේමදාස මහතාටත් මේ කර්මාන්ත ව්‍යාපෘතියටත් අපහාස උපහාස සිදු කළේ සභාවල නොකිය යුතු වදන් පාවිච්චි කරමිනි. නමුත් එදා විරුද්ධ වූ අය බලයට පැමිණි කල උදාවූ මෙරට නිදහස් පූර්ණයේ ස්වර්ණ ජයන්තිය 1988 දී සැමරීමට ගෙන්වූයේ බ්‍රිතාන්‍යයේ චාල්ස් කුමරුය. ඔහු ලංකාවට පැමිණි පසු පෙන්වීමට කැඳවාගෙන ගිය පළමු ප්‍රදර්ශන ස්ථානය වූයේ ඇඟලුම් කම්හලකි. අද මෙරට විදේශීය ආදායම ගෙන්වා දෙන ප්‍රධාන ආදායම් මාර්ගයක් වී ඇත්තේ ද ප්‍රේමදාස මහතාගේ ඇඟලුම් කර්මාන්ත සංකල්පය බව කිව යුතුය.

ඒ.ඊ. ගුණසිංහ මහතාගේ කම්කරු පක්ෂයෙන් දේශපාලනයට පැමිණියද ප්‍රේමදාස මහතාගේ දේශපාලන නිවහන වූයේ එක්සත් ජාතික පක්ෂයයි. ජේ.ආර්. ජයවර්ධන මහතා පක්ෂයේ නායකයා ලෙස පත් වී ප්‍රේමදාස මහතා අගසව් තනතුරේ තබා ගත්තේය. ජයවර්ධන මහතාගේ ඕනෑම කතාවක් විනාඩි 10ක් හෝ 15 කට සීමා විය. පක්ෂයේ රණහඬ වූයේ ප්‍රේමදාස මහතාය. ඒ නිසා ප්‍රේමදාස මහතා එජාප වේදිකාවේ කතා කරන විට බුරුතු පිටින් ජනයා පැමිණ රොද බැඳ ගත්හ. එම කතාවේ ඉතිහාසය, භූගෝලය, ආගම දහම, දේශපාලනය, කවිය, උපහාසය, රසාස්වාදය සියල්ල ගැබ් විය. ඔහු පක්ෂයේ නායකයාට සහයෝගයක් විය. අභියෝගයක් වූයේ නැත. ඔහු එජාපය වෙනුවෙන් රට පුරාම ගියේය. කොළඹ දිස්ත්‍රික්කයට සීමාවී සිටියේ නැත. දේශපාලනය කරන පිළිවෙළක් තිබෙනවා. පැහිල ඉදෙනවා මිසක් කුරුවල් වී බිමට වැටෙන්නට එපා යැයි ඔහු නවක දේශපාලකයන්ට උපදෙස් දුන්නේ ප්‍රේමදාස මහතාගේ භාෂාවෙන් කියනවා නම් දේශපාලනයෙන් තෙම්පරාදු වූ නායකයකු ලෙසය.

පාන්දර හතරට අවදි වී රාත්‍රී 10.00 වනතුරු දෙනෙත් නොපියා ජනතාවටත් රටටත් පක්ෂයටත් සේවය කළ මේ නායකයා දේශපාලනයේ එදා සිටි දැවැන්ත නායකයන් වූ ගාමිණී, ලලිත් දෙදෙනාට වඩා විශ්වාසය තැබූ තරුණ නායකයා වූයේ රනිල් වික්‍රමසිංහ මහතාය. ඔහු ගාමිණී, ලලිත් දෙදෙනාම සිටියදී ආණ්ඩුවේ සභානායක පදවිය දුන්නේ පක්ෂයේ එදා සිටි ජ්‍යෙෂ්ඨ නායකයා වූ විජේපාල මෙන්ඩිස් මහතාටත් නොදී රනිල් වික්‍රමසිංහ මහතාටය.

ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටියේ කොස්ගොඩ ගමේ උපන් රිචඩ් රණසිංහ මුදලාලි මහතා සහ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ බටුවිට උපන් ජයසිංහ ආරච්චිගේ එන්සිනා හාමිනේට දාව මීට වසර අනූ අටකට පෙර 1924 ජුනි මස 23 වැනි දින කොළඹ කෙසෙල්වත්තේ ඩයස් පෙදෙසේ අංක 12 දරන නිවෙසේ උපන් රණසිංහ ප්‍රේමදාස මහතා පෙදෙසේ පූර්වාරාමාධිපති බලපිටියේ වැලිතර පඤ්ඤානන්ද මාහිමියන් වෙතින් අත්පොත් තබා, පාසල, දහම් පාසල් සෙවණේ උගත යුතු මනා අධ්‍යාපනය ලබා ජනතා සේවයට පිවිසියේ පෙරුම් පුරාගෙන එන සසර පුරුද්දකට මෙන්ය. ප්‍රේමදාස මහතාට විශ්වවිද්‍යාල මගින් සම්මාන ආචාර්ය උපාධි ප්‍රදානය කිරීමට ඉදිරිපත් වූ හැමවිටම එතුමන් පැවසුවේ මා පොදු ජන විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ඇති නිසා තවත් උපාධි මට වුවමනා නොමැති බවය. ඔහුගේ චරිතයත් දේශපාලන මෙහෙවරත් මෙරට දේශපාලන වංශ කථාවේ දීර්ඝ පරිච්ඡේදයකි. එතුමා සිදු කළ මෙහෙවර ජනගත වූයේ බාධක කම්කටොලු මැදය. ජීවත්ව සිටි ප්‍රේමදාස මහතා නොමරා මැරුවේ අප පක්ෂයේම සිටි දේශපාලන බලලෝභීන්ය. ඔහු රැක ගනු ලැබුවේ අප පක්ෂයේ සිටි කෘතගුණ දත් නායකයන් විසිනි.

ප්‍රේමදාස මහතා බොහෝ දෙනෙකු විශ්වාස කළේය.එහෙත් ඒ විශ්වාසය එතුමාගේ ජීවිතය විනාශ කිරීමට මාන බැලූ ත්‍රස්තවාදින්ට ආශිර්වාදයක් විය. පොදු ජනතාව අතුරින් බිහි වූ රණසිංහ ප්‍රේමදාස නම් පොදු ජන නායකයා එක්සත් ජාතික පක්ෂයේ මැයි දින පෙළපාළියේදී 1993 මැයි මස 01 දා තම පාක්ෂිකයන් මැද ජීවිතයට සමු දුන්නේ තම දේශපාලන ගුරුවරයා වූ ඊ.ඒ. ගුණසිංහ මහතාගේ උපන් දිනය සමරන ලෝක කම්කරු දිනයේදීය.

ප්‍රේමදාස මහතාගේ ගුණ සුවඳ පවතින්නේ එක්සත් ජාතික පක්ෂය තුළය. එක්සත් ජාතික පක්ෂය තිබෙන තුරු ප්‍රේමදාස නාමය ලොව පවතිනු ඇත. සැමරෙනු ඇත. ඒ මන්ද ඔහු බිහි කළේත් ඔහු රැක ගත්තෙත් එක්සත් ජාතික පක්ෂය නිසාය.

දිවංගත නායකයාණෙනි! ඔබේ මෙහෙවර අමරණීයය.

**එජාප සභාපති සහ හිටපු ඇමැති**
**වජිර අබේවර්ධන**

# කම්කරු නායක ඒ.ඊ. ගුණසිංහ 130 වැනි ජන්ම දිනය අද

**මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

කොළඹ මහ නගර සභාවේ හිටපු පුරපතිවරයකු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඇමැතිවරයකු ලෙස කටයුතු කරමින් මහා කළු සිංහලයා නමින් විරුදාවලිය ලත් එදා කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් ලබාදීමට කටයුතු කළ කම්කරු නායක ඒ.ඊ. ගුණසිංහ මහතාගේ 130 වැනි ජන්ම දිනය අද (01) පෙරවරු 11.30ට ලංකා කම්කරු පක්ෂයේ නායක, හිටපු නාගරික මන්ත්‍රී විජිත කදිරගොන්න මහතාගේ ප්‍රධානත්වයෙන් පිටකොටුව කෙසෙල්වත්ත ගුණසිංහ පිළිරුව අබියසදී පැවැත්වේ.

මේ උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා සහභාගි වන අතර විශේෂ ආරාධිත අමුත්තා ලෙස මැද කොළඹ සමගි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන්, මල්මාලය පැලඳවීම කොළඹ පුරපතිනී රෝසි සේනානායක මහත්මිය නියෝජනය කරමින් කොළඹ නියෝජ්‍ය පුරපති එම්.ඩී.එම්. ඉක්බාල් මහතා අතින් සිදු කෙරෙයි.

කම්කරු නායක ඒ.ඊ. ගුණසිංහ මහතාගේ මුනුපුරු අජිත් ගුණසිංහ, මිනිපිරිය යස්මින් කෝච්, සිංහදොරේ ධනබාලා මහත්ම මහත්මීහු මේ අවස්ථාවට සහභාගි වෙති.



